එවැනි ප්‍රශ්නයක් මුලින්ම අසා තිබුණා නම් මට උත්තර සපයන්නට තිබුණා. මා හිතන හැටියට හුඟක් දුරට වැඩ කර තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

මේ මණ්ඩලය යටතේ පාරවල් සඳහා වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණවත් ද?

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

දැන් තිබෙන උපකරණවලට අනුව ප්‍රමාණවත් ය කියන්න පුළුවනි. පාරවල් සෑදීම සඳහා රෝලර් වැනි උපකරණ අවශ්‍යයි. දැන් තිබෙන එවැනි උපකරණ වලට අනුව හුඟක් වැඩ කර ගෙන යනවා. ආසන 30 ක වැඩ කරන්නට තිබෙනවා. මේ ආසනයේම දෙලක්ෂයක වැඩ තිබෙනවා. සාමාන්‍ය වශයෙන් ගණන් බලන විට වසරකට ලක්ෂ හැට හැත්තෑවක පමණ වැඩ කෙරෙනවා. දැන් තිබෙන උපකරණ වලට අනුව කරනු ලබන වැඩ ප්‍රමාණවත් ය කියා මා හිතනවා.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

මේ කොමිසමට භාර දී තිබෙන වගකීම උඩ හරියාකාර කටයුතු ඉටු කිරීම සඳහා මෙම උපකරණත් මුදලුත් ප්‍රමාණවත් ද?

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

දිනෙන් දින මාසයෙන් මාසය අවුරුද්දෙන් අවුරුද්ද සියළුම වැඩ කටයුතු හැකි තරම් දුරට සම්පූර්ණ කරන්නට උත්සාහ දරනවා. නමුත් නාන්සේලාගේ ආණ්ඩුව තිබුණු කාලයේදී මේ වැඩවලින් දහයෙන් එකක්වත් කෙරුණේ නැහැ. මෙම රජය වැඩ භාර ගත්තායින් පස්සේ ඊට වඩා දහ ගුණයකින් පමණ වැඩ කෙරී තිබෙනවා.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

ඒක සම්පූර්ණ බොරුවක්. අපේ කාලේ වැඩ කර තිබුණා.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

වැඩ නොකළ නිසයි පරාද වුණේ. [බාධා කිරීම්.]

## වෛද්‍ය, ඉංජිනේරු ආදී විද්‍යා උපාධි සඳහා සිංහලෙන් උගැන්වීම

விஞ்ஞான, மருத்துவ, பொறியியல் பட்டங்கள் : சிங்கள மொழி மூலம் போதனை

DEGREES IN SCIENCE, MEDICINE AND ENGINEERING : INSTRUCTION IN SINHALA

3. **ද සොයිසා සිරිවර්ධන මයා.** (ටී. බී. එම්. හේරත් මයා. වෙනුවට)
*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. ரி. பி. எம். ஹேரத்—சார்பாக)*
(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. T. B. M. Herath)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ලංකාවේ සියළුම විශ්ව විද්‍යාලවල වෛද්‍ය, ඉංජිනේරු ආදී විද්‍යා අංශවල උපාධි සිංහල භාෂා මාධ්‍යයෙන් ලබාදීම ප්‍රතිපත්තියක් වශයෙන් එතුමා සලකනවාද? (ආ) එසේ නම් එම ඉලක්කය සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වන්නේ කවදාද? (ඉ) ඒ සඳහා දැනට ආරම්භ කර ඇති හා ආරම්භ කිරීමට බලාපොරොත්තු වන ක්‍රියා මාර්ග මොනවාද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) இலங்கையில் உள்ள பல் கலைக்கழகங்கள் அனைத்திலும் மருத்துவம், பொறியியல் போன்ற விஞ்ஞானத்துறைகளில் சிங்கள மொழிமூலம் பட்டம் வழங்குவதைக் கொள்கையளவில் அவர் ஏற்றுக்கொள்கிறாரா? (ஆ) அவ்வாறெனில், அந்நோக்கத்தை அவர் எப்போது ஈட்ட எண்ணியுள்ளார்? (இ) இந்நோக்கத்தை எய்துவதற்காக ஏற்கனவே தொடங்கியுள்ள, தொடங்கக் கருதியுள்ள செயல் திட்டங்கள் யாவை?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) Does he agree in principle with the granting of science degrees such as those of medicine and engineering in all the universities in Ceylon in the Sinhala medium? (*b*) If so, when does he propose to achieve this aim? (*c*) What is the action taken so far, and

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද සොයිසා සිරිවර්ධන මයා.]

what action does he propose to take in the future, with a view to achieving this aim ?

ජයසූරිය මයා.

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

(*a*) I agree in principle to the granting of all degrees in the universities of Ceylon in Sinhala and Tamil. (*b*) As soon as practicable. (*c*) Active steps are being taken to obtain competent teaching staff and to provide the necessary text books.

## පාසල් ගොඩනැගිලි මහජන කටයුතුවලට දීම

*பொதுமக்களின் தேவைக்கு பாடசாலைக் கட்டடங்களைப் பயன்படுத்தல்.*

## USE OF SCHOOL BUILDINGS FOR PUBLIC PURPOSES

4. ද සොයිසා සිරිවර්ධන මයා. (ටී. බී. එම්. හේරත් මයා. වෙනුවට)

*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. ரி. பி. எம். ஹேரத் சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. T. B. M. Herath)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) නු/රාගල මහා විද්‍යාල ශාලාව 18.3.67 දින එක්තරා දේශපාලන පක්ෂයකට අයත් කම්කරු සමිතියක රැස්වීමක් සඳහා ඉඩ දෙන ලදද? ඒ කවර පක්ෂයකටද? (ආ) එසේ නම්, ඒ අවසරය දෙන ලද්දේ කවර ප්‍රතිපත්තියක් යටතේද? (ඉ) 1967 අප්‍රේල් මාසයේ නිල්දන්ඩාහින්නේ මහා විද්‍යාල ශාලාව පිරිත් දේශනාවකට හා දානයක් පිළිගැන්වීමට දීම ප්‍රතික්ෂේප කරන ලදද? ඒ කාටද? (ඊ) ඒ කුමන ප්‍රතිපත්තියක් නිසාද? (උ) පාසැල් ගොඩනැගිලි මහජන කටයුතු වලට දීම සම්බන්ධව එතුමාගේ ප්‍රතිපත්තිය පැහැදිලි කරනවාද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) நு/ருகலே மகாவித்தியாலய மண்டபத்தில் 18.3.67 இல் ஓர் அரசியல் கட்சியைச் சார்ந்த தொழிலாளர் சங்கக் கூட்டம் ஒன்றை நடத்துவதற்கு அனுமதிக்கப்பட்டதா? அது எந்தக் கட்சி? (ஆ) அவ்வாறெனில், எக்கொள்கையை அடிப்படையாகக் கொண்டு அனுமதி வழங்கப்பட்டது? (இ) 1967 ஆம் ஆண்டு எப்ரில் மாதத்தில் நில்தண்டாஹிந்நே மகாவித்தியாலய மண்டபத்தில் பிரித்தோதவும் தானங்கொடுக்கவும் அனுமதி கோரியபோது அனுமதி மறுக்கப்பட்டதா? யாருக்கு மறுக்கப்பட்டது? (ஈ) எக்கொள்கையை அடிப்படையாகக் கொண்டு மறுக்கப்பட்டது? (உ) பாடசாலைக் கட்டடங்களைப் பொதுமக்களின் பயன்பாட்டிற்காகக் கொடுப்பதுபற்றி அவர் கையாளும் கொள்கையைத் தெளிவுபடுத்துவாரா?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) Was a workers' union belonging to a particular political party allowed the use of the hall of the නු/Ragala Maha Vidyalaya for the purpose of conducting a meeting on 18.3.67 ? What is the political party to which this union belongs ? (*b*) If so, what is the policy on the basis of which permission was granted for this purpose ? (*c*) Was the use of the Nildandahinna Maha Vidyalaya hall for conducting a pirith ceremony and alms-giving in April 1967 disallowed ; and if so, who was disallowed the use of this hall ? (*d*) What is the policy underlying this course of action ? (*e*) Will he clarify his policy in regard to the question of permitting the use of school buildings for public purposes ?

ජයසූරිය මයා.

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

(*a*) It is true that permission was granted to use the N/Ragala Tamil Maha Vidyalaya hall for the purpose of holding a meeting of the Ceylon Estate Workers' Union, on 18.3.1967. We do not know to what political party this union belongs. (*b*) Because it was a request made by a recognized trade union. (*c*) Yes, to the Secretary of the Sri Lanka Buddhist Organization and to the hon. Member for Walapane. (*d*) According to a report received that it would lead to a breach of the peace. (*e*) The use of school buildings is allowed to approved teacher associations, recognized trade unions of officers of the Department of Education, recognized trade unions, provided the buildings are not reserved on such dates for

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

other purposes. Though the general principle adopted is such, if according to circumstances the Ministry feels that the grant of such permission is not suitable it will not be granted.

**බී. වයි. තුඩාවේ මයා.** (මාතර)
*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*
(Mr. B. Y. Tudawe—Matara)

පිළිගත් වෘත්තීය සමිතිවලට පාඨශාලා ගොඩනැගිලි පාවිච්චි කිරීමට ඉඩ දෙනවා යැයි පිළිතුරෙන් කියැවුණා. මාතර ප්‍රදේශයේ, පිළිගත් සමහර වෘත්තීය සමිතිවලට පාඨශාලා ගොඩනැගිලි නොදෙන බව දන්නවාදැයි මා දැනගන්නට කැමතියි.

**ජයසූරිය මයා.**
*(திரு ஜயசூரிய)*
(Mr. Jayasuriya)

යම්කිසි හේතුවක් නිසා ඉඩ දීම නුසුදුසු යැයි අමාත්‍යාංශයට පෙනී ගියහොත් දෙන්නේ නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

යම්කිසි හේතුව කියන්නේ එක්සත් ජාතික පක්ෂයට පන්දම් නොඇල්ලීමද?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

නැහැ. පාඨශාලාවේ තිබෙන බංකු, පුටු ආදිය ආරක්ෂා කර ගන්නට ඕනෑ.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

විරුද්ධ පාර්ශ්වයට හිතවත් වෘත්තීය සමිතියක් හෝ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයකු හෝ පාඨශාලා ගොඩනැගිල්ලක් ඉල්ලුවොත්, සාමය කඩ වීමට ඉඩ තිබෙනවා යැයි කියන්නට ආණ්ඩු පක්ෂයට නිතරම ඉඩ තිබෙනවා. එහෙත් එවැනි අනතුරක් නැත්නම් සාමය කඩ වීමක් වේ දැයි සොයා බැලීමට ශබ්ද වාහිනි යන්ත්‍ර පාවිච්චි කිරීම සඳහා අවසර පත්‍ර දෙන පොලිස් නිලධාරියාට යුතුකමක් තිබෙනවා. උදාහරණයක් වශයෙන්, මාත් සහභාගි වුණු රැස්වීමක් 1967 අවුරුද්දේදී පැවැත් වුණා. එම රැස්වීමේදී සාමය කඩ වීමට ඉඩ තිබේ යැයි එක්සත් ජාතික පක්ෂයේ මහත්මයෙක් පැමිණිල්ලක් කර තිබුණා. එම නිසා ශබ්ද වාහිනි යන්ත්‍ර පාවිච්චිය සඳහා අවසර දෙන්නට බැරි යැයි ඒ. එස්. පී. මහත්මයා දන්වා තිබුණා. එසේ අවසර දෙන්නට බැරිය කීවේ එම චෝදනාවේ ඇත්ත නැත්ත පරීක්ෂා කර බලා දැයි මා දැනගන්නට කැමැතියි.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

නුවරඑළියේ අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ නිර්දේශය උඩයි, එය දී නැත්තේ.

**මොණරාගල මාගන්දන ඔය වි. සේ. ස. සමිතිය : හාල් සඳහා මුදල් අය කිරීම**

*மொனருகல மாகந்தன ஓயா ப. கூ. ச. ச. : அரிசிக்குப் பணஅறவீடு*

**MAGANDANA OYA M.P.C.S., MONARAGALA : CHARGES FOR RICE**

5. **ධර්මදාස බණ්ඩා මයා.**
*(திரு. தர்மதாச பண்டா)*
(Mr. Dharmadasa Banda)

කෘෂිකර්ම හා ආහාර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මොනරාගල දිස්ත්‍රික්කයේ සීමාසහිත මාගන්දන ඔය විවිධ සේවා සමුපකාර සමිතිය සෑම හාල් සේරුවක් සඳහාම පාරිභෝගිකයින්ගෙන් ශත 5 ක මුදලක් අයකරන බව එතුමා දන්නවාද? (ආ) මෙය නැවැත්වීමට කටයුතු කරන්නේද? (ඉ) නොඑසේනම්, ඒ මන්ද?

*விவசாய, உணவு அமைச்சரைக் கேட்ட வினா: (அ) மொனருகல மாவட்டத்திலுள்ள வரையறுக்கப்பட்ட மாகந்தன ஓயா பல நோக்குக் கூட்டுறவுச்சங்கம் ஒவ்வொரு கொத்து அரிசிக்கும் நுகர்வோர்களிடமிருந்து 5 சதம் அறவிடுவதை அவர் அறிவாரா? (ஆ) இவ்வழக்கத்தை நிறுத்த அவர் நடவடிக்கை எடுப்பாரா? (இ) அன்றேல், ஏன்?*

asked the Minister of Agriculture and Food: (*a*) Is he aware that the Magandana Oya Multi-purpose Co-operative Society, in the Monaragala District, charges the consumers 5 cents per measure of rice? (*b*) Will he take action to stop this practice? (*c*) If not, why?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

(*a*) I am not aware. (*b*) If any charge is made steps will be taken to stop it. (*c*) Does not arise.

## කරඳන-උඩගම පාර

*கறந்தன-உடகம வீதி*

KARANDANA-UDAGAMA ROAD

8. **ද සොයිසා සිරිවර්ධන මයා.** (රත්න සිරි වික්‍රමනායක මයා.—හොරණ—වෙනුවට)
*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. ரத்னஸிரி விக்ரமநாயக்க—ஹொறனை—சார்பாக)*
(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Ratnasiri Wickramanayaka—Horana)

රජයේ වැඩ, තැපැල් හා විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අවිස්සාවේල්ල විධායක ඉංජිනේරු මහතාගේ කොටසට අයත් කරඳන උඩගම පාරේ වැඩ දැන් නවතා ඇති බව එතුමා දන්නවාද? (ආ) මෙසේ වැඩ නවත්වන ලද්දේ කවදාද? (ඉ) වැඩ නැවැත්වීමට හේතුව කුමක්ද? (ඊ) පළාතේ විශාල දියුණුවකට තුඩු දෙන මෙම පාරේ වැඩ නොපමාව නැවත ආරම්භ කර, එහි වැඩ අවසාන කිරීමට එතුමා කටයුතු කරනවාද?

*அரசாங்கக் கட்டுவேலை, தபால் தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) அவிசாவளை நிர்வாகப் பொறிஞரது வட்டாரத்திலிருக்கும் கறந்தன உடகம வீதியின் கட்டுவேலை நிறுத்தப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா? (ஆ) எப்போது இக்கட்டுவேலை நிறுத்தப்பட்டது? (இ) இக்கட்டுவேலை நிறுத்தப்படுவதற்குரிய காரணங்களெவை? (ஈ) இப்பகுதியை நன்கு முன்னேற்ற உதவும் இவ் வீதிக்கான கட்டு வேலையைக் காலம் தாழ்த்தாமல் தொடக்கி அக்கட்டுவேலையை முடிக்க அவர் நடவடிக்கை எடுப்பாரா?*

asked the Minister of Public Works, Posts and Telecommunications: (*a*) Is he aware that the work on the Karandana-Udagama road in the area of the Executive Engineer, Avissawella, has now been stopped? (*b*) When was this work stopped? (*c*) What was the reason for stopping the work? (*d*) Will he take action to resume without delay and complete the work on this road, which will help to bring much progress to the area?

**විජයපාල මෙන්ඩිස් මයා.**
*(திரு. விஜயபால மெண்டிஸ்)*
(Mr. Wijayapala Mendis)

(අ) ඔව්. (ආ) වැඩ නවත්වන ලද්දේ 1967 අප්‍රේල් මාසයේදීය. (ඉ) සමහර ඉඩම් හිමියන් ඔවුන්ගේ ඉඩම් හරහා පාර තැනීම ගැන විරුද්ධ වූයෙන් වැඩ නැවැත්වීමට සිදුවිය. (ඊ) ඉඩම් අත්පත් කරගත් වහාම වැඩ නැවත අරඹනු ඇත.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

පාර හදන්නට පටන් ගත්තේ ඉඩම් අත්පත් කර ගන්නේ නැතිවද?

**ගරු මොන්ටේගු ජයවික්‍රම (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමති)**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம—அரசாங்கக் கட்டுவேலை, தபால் தந்திப் போக்குவரத்து அமைச்சர்)*
(The Hon. Montague Jayewickreme—Minister of Public Works, Posts and Telecommunications)

1964 දී ආණ්ඩු කළේ කවුද?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

එය නොවෙයි, ප්‍රශ්නය. මේ පාර හදන්නට පටන් ගත්තේ, ඇස්තමේන්තු සකස් කළේ, ඉඩම් අත්පත් කර ගන්නට කලින්ද?

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

1964 දී මේ පාර සෑදීම පිණිස වැඩ පටන් ගත්තේ ඒ මන්ත්‍රීතුමාගේ ආණ්ඩුවයි.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

මගේ ආණ්ඩුවක් තිබුණේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

ඒ වැඩ පටන් ගත්තේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවයි. ඒ වැඩ පටන් ගත්තාට පස්සේ ඒ ඉඩම් හිමියන් ඊට විරුද්ධත්වය පෙන්නුවා. නීති රීති අනුව මේ ඉඩම් අත්පත් කරගන්නට පුළුවන් දැයි සොයා බැලීම සඳහා දැන් අමාත්‍යාංශයෙන් දන්වා තිබෙනවා, ඉඩම් අත්පත් කරගන්නා අංශයට. එම නිසා මේ ප්‍රශ්නය අහන්නට ඕනෑ එදා සිටි ඇමතිතුමා ගෙනුයි.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නයට පිළිතුරු ලැබුණේ නැහැ. කවුරු ආණ්ඩු කළත් මට කමක් නැහැ. මට ඕනෑ කරන්නේ රජයේ වැඩ දෙපාර්තමේන්තුව මෙම පාර සෑදීමට ඇස්තමේන්තු සකස් කර තිබෙන්නේ ඉඩම පවරා ගැනීමට කලින්ද කියා දැනගන්නයි.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

ගරු කථානායකතුමනි, පාරක් හෝ පාලමක් සාදන්න කලින් නොවේද ඇස්තමේන්තු සකස් කරන්නේ ? ඇස්තමේන්තු සාදා අනුමත කළාට පසුව තමයි වැඩ පටන් ගන්නේ. ඒ මන්ත්‍රීතුමා අසන ප්‍රශ්නය එවකට සිටි ආණ්ඩුවෙන් ඇසිය යුතුයි.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

ගරු කථානායකතුමනි, ඔබතුමාවත් මගේ ප්‍රශ්නය ගරු ඇමතිතුමාට තේරුම් කර දෙනවාද ?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

මගේ කාමරයට ඇවිත් ඒ ප්‍රශ්නය ඇසුවොත් උත්තර දෙන්නම්.



## නොපැමිණීමේ අවසරය : පර්සි සමරවීර මයා.

*வராதிருக்க அனுமதி : திரு. பேஸி சமரவீர*

## LEAVE OF ABSENCE : MR. PERCY SAMARAWEERA

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I move,

"That Mr. Percy Samaraweera, Member for Welimada, be granted leave under Section 24 (1) (*e*) of the Ceylon (Constitution) Order in Council, 1946, to be absent from the Sittings of the House for a period of three months from 11th February 1968."

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது*

*Question put, and agreed to.*

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්

*சபை அமர்வு*

## SITTINGS OF THE HOUSE

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ගරු කථානායකතුමනි, පහත දැක්වෙන යෝජනාව මම ඉදිරිපත් කරනවා :

"අද දින විසිර යෑමේදී මන්ත්‍රී මණ්ඩලය 1968 පෙබරවාරි මස 22 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 2 වන තෙක් කල් තැබිය යුතුය."

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාවට නැඟීමේ) පනත : නියෝග

*இந்திய-இலங்கை உடன்படிக்கை (செயற்படுத்தல்) சட்டம் : பிரமாணங்கள்*

## INDO-CEYLON AGREEMENT (IMPLEMENTATION) ACT : REGULATIONS

**කල් තබන ලද විවාදය තව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [පෙබරවාරි 10.]**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාවට නැඟීමේ) පනත:

"1967 අංක 14 දරණ ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාවට නැඟීමේ) පනතේ 26 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අග්‍රාමාත්‍ය සහ රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් සම්පාදිත, 1968 ජනවාරි මස 26 වැනි දින ඉදිරිපත් කළ නියෝග අනුමත කළ යුතුය."—[ගරු ඩඩ්ලි සේනානායක]

பெப்பிரவரி 10 ஆம் தேதிய விஞா மீதான ஒத்திவைக்கப்பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

"1967 ஆம் ஆண்டின் 14 ஆம் இலக்க இந்திய–இலங்கை ஒப்பந்த (செயற்படுத்துதல்) சட்டத்தின் 26 ஆம் பிரிவினால் அவருக்குரித்தாக்கப்பட்ட தத்துவங்களைக்கொண்டு பிரதம அமைச்சரும் பாதுகாப்பு வெளிநாட்டலுவல்கள் அமைச்சருமானவரால் ஆக்கப்பட்டு 26.1.68 ஆம் திகதியன்று சமர்பிக்கப்பட்ட ஒழுங்கு விதிகள் அங்கீகரிக்கப்படுவதாக."—[கௌரவ டட்லி சேனநாயக்க]

*Order read for resuming Adjourned Debate on Question—[10th February.]*

"That the Regulations made by the Prime Minister and Minister of Defence and External Affairs by virtue of the powers vested in him by Section 26 of the Indo-Ceylon Agreement (Implementation) Act, No. 14 of 1967, which were presented on January 26, 1968, be approved."—[*The Hon. Dudley Senanayake*]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Question again proposed.*

පූ. භා. 10.25

**ආර්. ජී. සේනානායක මයා.** (දඹදෙණිය)
(திரு. ஆர். ஜீ. சேனநாயக்க—தம்பதெனிய)
(Mr. R. G. Senanayake—Dambadeniya)

කථානායකතුමනි, ඊයේ සවස මා පැහැදිලි කරමින් සිටියේ කොටසක් මේ රටේ වැසියන් වශයෙන් භාරගන්නට අප සූදානම් වන විට මේ රටින් පිට කරන කණ්ඩායම ගැන ඒ තරම් පරීක්ෂා සහිතව රෙගුලාසි සකස් වී නැති බවයි. වැඩි පුරම මේ රෙගුලාසි බර වී තිබෙන්නේ මේ රටට ගන්න උදවියට පුරවැසි භාවය දීම පිළිබඳවයි. යම් කිසි කොටසක් අපි භාර ගන්නවා නම් අපි එසේ භාරගන්නේ ඊට වඩා විශාල කොටසක් මේ රටින් පිට කරන්නට පොරොන්දු වූ නිසයි. එහෙත් අපි පිට කරන කොටස ගැන සකස් වී තිබෙන වගන්ති සම්පූර්ණ නැති බවයි මා තරයේම පැහැදිලි කෙළේ.



ඒ වාගේම පිට කරන අය පිට කළාට පසුව නැවත නොඑන්න කටයුතු යෙදීම ඉතාමත් අවශ්‍යයි. පිටකිරීම පමණක් මදි. මීට කලින් ද මා කීප විටක්ම පාර්ලිමේන්තුවේදී මතු කර තිබෙන ප්‍රශ්නයක් නම් ස්වකීය කාල සීමාව ඉක්මවා මේ රටේ සිටින තාවකාලික පදිංචි බලපත්‍රකරුවන් අල්ලාගෙන පිට කරන නමුත්, වැඩි කල් යන්නට මත්තෙන් නැවතත් ඒ උදවිය එම ස්ථානවලටම පැමිණ තමන්ගේ වෙළ හෙළඳාම් කටයුතු කරගෙන යන බවයි. පොලිස් වාර්තා අනුව බලන විට අපට පෙනී යනවා, ඒ අය අල්ලා දෙන බව. එසේ අල්ලා දුන් අය පිට කළායකියා ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් කියනවා. එහෙත් අගමැතිතුමා සහ එම දෙපාර්තමේන්තුව ටිකක් ඒ ගැන සොයා බැලුවොත් පෙනී යාවි ඒ පුද්ගලයන් කලින් සිටි පරිදිම නැවතත් ඒ ස්ථානවලට පැමිණ තමන්ගේ ව්‍යාපාර කටයුතුවල යෙදී සිටින බව. එවැනි අවස්ථා අනන්ත අප්‍රමාණව තිබෙනවා. යම් කෙනෙක් අල්ලා පිට කළාට පස්සේ අපි ඒ ප්‍රශ්නය එතැනින් වසනවා; පොත් පත් වසනවා; ෆයිල් වසනවා. ඊට පසු නැවත සොයා බැලීමක් නැහැ. ඒ නිසා ඒ උදවිය නැවත නොඑන්නට නොහොත් ඔවුන්ගේ නැවත පැමිණීම වැළැක්වීමට යම් කිසි තද ක්‍රියා මාර්ගයක් තිබෙන්නට ඕනෑ.

මා එක්තරා අවස්ථාවකදී, බලෙන් එන උදවියට වෙඩි තබන්න කිව්වා යයි ලොකු අකුරුවලින් පුවත්පත්වල පළ වී තිබුණා. එය ඉතාමත් භයානක කීමක් හැටියටත්, කල්ලතෝනින් ඒ කුටිවල දමා බිත්තිවලට හේත්තුකර වෙඩි තබන්නය කියා මම කිව්වා වාගේ හැඟීමක්, කල්ලතෝනින් අසුවන තැන්වල ගස්වලට බැඳ වෙඩි තබන්නය කියා මම කිව්වා වාගේ හැඟීමක් පවා දෙන්නට අගමැතිතුමාත් උත්සාහ කර තිබුණා. එහෙත් මා කියන්නේ එහෙම කරන්න නොවෙයි. මා කියන දේ පෙන්වන්නට හොඳ උපමාවක් ඉදිරිපත් කරන්නම්.

පොල් වත්තකට යම් කෙනෙක් පැන්න පළියට ගහක බැඳ වෙඩි තබන්න පුළුවන් කමක් නැහැ. වත්ත ආරක්ෂා කරගන්න නම් නීතියෙන් ඉඩකඩ තිබෙනවා. යම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෙනෙක් නීති උල්ලංඝනය කරගෙන වත්තකට පැන්න අවස්ථාවක ඔහු අල්ලන්නට නැත්නම් අත්අඩංගුවට ගන්නට නැත් කරන විට ඒවාට අවනත නොවී ඒවා කඩාගෙන බලහත්කාරයෙන් පැන යන්නට උත්සාහ කරනවා නම් තුවක්කුව පාවිච්චි කරනන්ට පුළුවන් කම තිබෙනවා. පොල් වත්තක් වුණත්, තේ වත්තක් වුණත්, ගේ දොරක් වුණත් ආරක්ෂා කර ගැනීමට නීතියෙන් ඉඩකඩ තිබෙනවා. එහෙත් පොල් වත්තකට හෝ වෙන එවැනි ස්ථානයකට පැන්නාය කියන කරුණ උඩ කෙනෙකුට වෙඩි තබන්නට බලයක් නැහැ. මා එවැනි ඉල්ලීමක් කළෙත් නැහැ. මා කීවේ අපේ නීති කඩාගෙන පැනයන්නට හදනවා නම්, අත් අඩංගුවට ගන්නට ඉඩ දෙන්නේ නැත්නම්, අර පොල් වත්තට තිබෙන නීතිය රටටත් තිබෙන්නට ඕනෑය කියන එකයි.

අගමැතිතුමා කියා තිබෙනවා කල්ලතෝනීන්ට වෙඩි තබන්නය කියා ඉතා කෘෘර අළුගෝසු අදහසක් මා ඉදිරිපත් කරනවාය කියා. මේ ආණ්ඩුවේ අගමැතිතුමා දන්නේ නැත්නම් එවැනි අවස්ථාවලදී ඉන්දියා ආණ්ඩුව කටයුතු කරන්නේ කොහොමද කියා සොයා බලන්න නිලධාරියෙක් ඉන්දියාවට පිටත් කරන්න. කල්ලතෝනීන් වශයෙන් පකිස්තාන්කාරයින් ඉන්දියාවට එන විට ඔවුන්ට වෙඩි තබන්නේ කොහොමද කියා ඉන්දියාවෙන් අහන්න. ඉන්දියානු කල්ලතෝනීන්ට වෙඩි තබන්නට කීම ගැන ඔය තරම්ම කෑගහනවා නම් තමන්ගේ රට රැකීමට සිටින නිලධාරීන් විසින් පකිස්තාන්කාරයින් දේශ සීමා කඩාගෙන ඉන්දියාවට පැන්නොත් තුවක්කුව පාවිච්චි කරන්නේ කුමන අවස්ථාවලදීද කියා ඉන්දියාණ්ඩුවෙන් අහන්න. නිලධාරියෙක් යවා විස්තර ගෙන්වා ගන්න. මෙය භයානක අළුගෝසු වැඩක්ද? යම් වගකීමක් බාරගන්නා නම් ඒ අනුව කටයුතු කරන්නට ඕනෑ නේද? මේ රට ඇතුළේ තිබෙන්නෙත් මහජන කතුස්සක තිබෙන නිදහසට සමාන නිදහසක්. ඕනෑ කෙනෙකුට එන්න පුළුවන්; ඕනෑ කාලයක් ඉන්න පුළුවන්; හිතුණු වෙලාවක යන්න පුළුවන්. රට පාලනය කරන්නේ ඒ අන්දමටයි. කතුස්සක වුණත්

ගැහැණු පිරිමි වශයෙන් නිදහසේ යම්කිසි සීමාවක් තිබෙනවා. මේ රටේ එවැනි සීමාවකුත් නැහැ. අන්න ඒ නිසයි මා තමුන්නාන්සේට මෙපමණ පැහැදිළි කරන්නේ.

මේ රටේ තාවකාලිකව ඉන්නට බලපත්‍ර දීමට තමුන්නාන්සේ නීති සකස් කරනවා. මේ බලපත්‍ර දෙන්නේ ලංකාවෙන් යවන උදවියටයි. බලපත්‍ර දුන්නත් නැතත්, පාස්පෝට් ඇතත් නැතත් මේ අයට ඉන්දියාවට යන්න එන්න පුළුවන්. පිට කළ අය එනවා; පිටවීම තහනම් කළ අය යනවා. මා දන්නවා කීප විටක්ම තමුන්නාන්සේලාගේ පොලිසිය හොර කඩවලට පැන සීල් තබා බඩු අල්ලාගෙන යන විට මිනිහා ඉන්දියාවට ගිහින්. කොහොමද ගියේ? බලපත්‍රයක් පිටද? නැහැ. කෙලින්ම බෝට්ටුවක් ගන්නවා; යනවා. ටික කාලයක් ගියාට පසුව නැවත අර වෙළඳාම කරගෙන යනවා. කොහොමද ඔහු ආවේ? ඒත් බලපත්‍රයක් පිට නොවෙයි. ඔවැනි තත්ත්වයක් තිබියදී බලපත්‍ර දීමට හිතනවා නම් එය විහිළුවක් නේද? වැට ගහන්නේ නැතිව වගා කරන්නේ මොනවාද කියා වාද වෙනවා. වැටක් නැතිව වගාවක් හරියාද? ප්‍රධානම මූලික පියවර වැට බැඳ ගැනීම නේද? ලෝකයේ කොහේවත්ම නැති අන්දමට හොරෙන් මේ රටට එන මාර්ග තිබෙනවා. වෙළඳාම් කරන්නටත්, වෙනත් රැකී රක්ෂාවල යෙදෙන්නටත් අවශ්‍ය හැම අවස්ථාවක්ම ලැබෙනවා. අඩු මුදලට ලැබෙන යම් සේවයක් වෙතොත් එයද ලැබෙනවා. රට වැසියාට සපයනු ලබන හාල්, රෙදි, ලුණු, මිරිස් ආදියත් අඩු මිළට ලබා ගන්නවා. ඔය ආකාරයට මුදල් හරි හම්බ කර ගන්නවා. අපට තහනම් වූ නීතියෙන් පවා ඉඩකඩ ලබාගෙන හෝ එසේ නැත්නම් හොරෙන් හෝ මේ රටින් සල්ලිත් පිට කරන්නට පමණක් නොව රටින් පිට වී යෑමටත් පහසුකම් සලසා ගන්නවා. කිසිම බලපත්‍රයක් නැහැ. මේවා ගැන දෙපාර්තමේන්තුවෙන් ඇහුවොත් ලැබෙන පිළිතුර මොකක්ද? දැන් තත්ත්වය බොහොම හොඳයි කියාවි. දැන් කල්ලතෝනීන්ගේ ප්‍රශ්නයක් නැතැයි කියාවි. දැන් හොඳ පාලනයක් තිබෙනවාය කියාවි. ඉන්දියානුවකු වැඩි මිළට බඩු විකුණා අසු වුවහොත් හෙට ඔහුගේ රටේවත් දකින්නට නොලැබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇති. ඔහු මේ රටේවත් හිටිව්දැයි ඊළඟ දවසේ බලන්න. එය කරන්නට බොහොම ලෙහෙසියෙන් පුළුවනි. රටින් පිට වී යෑමත් ඉතාම ලෙහෙසියි. ඒ වාගේම රටින් බඩු පිට කර යැවීමත් බොහොම පහසුයි. මා දුටු දෙයක් ගැන මට කියන්නට පුළුවනි. හාල් මුට්ට සිය ගණන් මුතුර්වලින් බෝට්ටු වලට පටවනවා මගේ ඇස් දෙකින් මා දුටුවා. රුවල දමා ගත්තා, ගියා. ඒ විධියටයි කරන්නේ. බඩු පටවා ගත් ගමන්ම රුවල දමාගෙන යනවා. හාල් මුට්ට සිය ගණන් පටවන තැන් තිබෙන නමුත් ඒ තැන්වල හාල් මුට්ට ගණන් පටවනවා බලන්නට කිසිම රජයේ නිලධාරියෙක් එතැන නැහැ.

**වෛද්‍යාචාර්ය නාගනාතන්**

*(டொக்டர் நாகநாதன்)*

(Dr. Naganathan)

If the hon. Member was present there and watching the ship being loaded with rice, what did he do to stop it?

**ආර්. ජී. සේනානායක මයා.**

*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*

(Mr. R. G. Senanayake)

බෝට්ටුවේ හිලක් හාරන්නැයි කියනවාද මට? පිස්සු දොඩවනවා. බෝට්ටුවල හාල් පටවාගෙන, රුවල දමාගෙන පිට වී යන බවයි මා ඒ කිව්වේ. ඉතින් ඒ අයගෙන් ඇහැව්වාම ඒ අය කියන්නේ යාපනයට ගෙන යනවා කියලයි. ඒ විධියට කියන නමුත් ඇත්ත වශයෙන්ම ඒවා යාපනයට යනවාදැයි සොයා බලන්නෝ කවුරුද? ඒ සඳහා නිලධාරීන් එතැන ඉන්නවාද? බෝට්ටුවල හාල් පටවන්නට අවසරය දෙනවා නම් එතැන නිලධාරියෙකු ඉන්නට ඕනෑ නේද? අසුවල් වේලාවට මෙතැනින් පිට වුණාය කියන්නට නිලධාරියකු ඉන්නට ඕනෑ නේද? ඒ වාගේම අනෙක් තැනත් බෝට්ටුවෙන් ඒ හාල් ගෙනැවිත් තිබෙනවාදැයි බලන්නට නිලධාරියකු සිටින්නට ඕනෑ නොවෙයිද? බෝට්ටුව හාල් අරන් ආවාදැයි බලන්නට යාපනේ නිලධාරියකු සිටිය යුතුයි. රුවල දමාගෙන ගියාම දිගටම ඉන්දියාවට නොගියාය කියන්නේ කොහොමද? ඉන්දියාවට ගියායයි මා කියන්නේ නැහැ. මා දුටු දෙයක් ගැනයි මා කිව්වේ. බෝට්ටුවට හාල් මුට්ට ගණන් පටවන හැටි මා දුටුවා. කිසිම බල

පත්‍රයක් නැතිව හාල් අරන් යාපනයට යනවාය කියා ගෙන යනවා. ඒ හාල් ඉන්දියාවට නොගියාය කියන්නේ කොහොමද? බෝට්ටුව කෙරේ ඇති පාලනය කුමක්ද? පාලනයක් නැහැ. ලංකාවේ හාල් සේරුවක් රුපියලකුත් ශත ගණනකට තිබෙද්දී ඉන්දියාවේ හාල් සේරුවක් රුපියල් හතක් වෙනවාය කියනවා නම් පුළුවන් කෙනෙක් ඉන්දියාවට හාල් අරන් නොයාවිද? ඒ ප්‍රශ්නය අහන්නට මා කැමැතියි. ඉන්දියාවට ලංකාවෙන් හාල් ගෙන යන්නේ නැද්දැයි ගරු අගමැතිතුමා ඇහුවාම එතුමාගේ නිලධාරීන් නැහැ කියනවා. ඒ අනුව ගරු අගමැතිතුමත් කියනවා ඉන්දියාවට හාල් යන්නේ නැහැ කියා. පුටු අස්සේ හාල් ගෙන යන්නට බැහැ කියනවා. [බාධා කිරීම්.] පුටුවද බංකුවද වෙන මොකක්දැයි කියන්නට මා දන්නේ නැහැ.

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)**

*(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார, அமைச்சரும் தகவல், ஒலிபரப்பு அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

කව්ද කිව්වෙ?

**ආර්. ජී. සේනානායක මයා.**

*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*

(Mr. R. G. Senanayake)

තමුන්නාන්සේ කිව්වෙ නැහැ. හොරෙන් මැණික් ගෙන යන්නට පුළුවන් නමුත් ඒ විධියට හොරෙන් හාල් ගෙන යන්නට බැහැ කියලයි කියා තිබෙන්නේ. මැණික් වාගේ හාල් හංගාගෙන යන්නේ කොහොමද යන්නයි, ඇසූ ප්‍රශ්නය. [බාධා කිරීම්]

**ද සොයිසා සිරිවර්ධන මයා.**

*(திரு. டி சொய்சா சிறிவர்தன)*

(Mr. de Zoysa Siriwardena)

ගරු අගමැතිතුමා ඒ වාගේ අදහසක් [illegible] කිව්වාය කියා මා හිතනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මැණික් ගෙන යන විධියට හාල් හොරෙන් ගෙන යන්නට බැහැ, ඒවා ගෙන යා යුත්තේ තොග වශයෙන් මිස මැණික් වාගේ සුළු වශයෙන් නොවේයයි ගරු අගමැතිතුමා කිව්වා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
පුටුවක් ගැන මා කථා කළාද?

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
පුටුවක් ගැන ඔබතුමා කථා කළේ නැහැ. ඒක තමයි මාත් කිව්වෙ. පුටුවක් ගැන කිව්වෙ නැහැ කියා මාත් කිව්වා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
කොයි බෝට්ටුව ගැනද ඔය කිව්වෙ?

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
යාපනයට ගෙන යැමටය කියා කුරුණෑගලිනුත්, අම්පාරෙනුත්, දකුණේ නොයෙක් ප්‍රදේශවලිනුත්, මැද පළාතෙනුත් වී හාල් පටවන හැටි සොයා බැලුවොත් තමුන්නාන්සේට දකින්නට ලැබිය යුතුයි. දිනපතාම ඔය ප්‍රදේශවලින් යාපනයට ගෙන යනවාය කියා ගෙන යන හාල් ප්‍රමාණය ඉතා විශාලයි. ඒ නිසා ඇත්ත වශයෙන්ම ඒ තරම් හාල් ප්‍රමාණයක් යාපනයට ගෙන යනවා නම්, ඒවා ගෙන යන්නේ යාපනයේ ඉන්න උදවියගේ ආහාරය සඳහාම නම් මේ විධියට හාල් කන අය යාපනයේ ඉන්නවාදැයි පුදුම හිතෙන්නට පුළුවනි. මේ උදවිය හාල් කනවයැ, හාල් නානවා නොවැයි කියා හිතෙන්නෙ නැද්ද?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ඒ තරම් හාල් යවලත් මෙහෙ උදවියට කන්න හාල් ඉතුරුවෙලා තියෙනවා නේද? එහෙම නම් හාල් අතින් දැනටමත් ලංකාව ස්වයංපෝෂිතයි.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
එච්චර තියෙනව නම් හාල් සේරුවක් කැපුවෙ ඇයි?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ඔව්, අඩු කෙරුව. අඩු ප්‍රමාණයක් ගෙනුවත්, ඉන්දියාවට හොරෙන් ඇරියත්, කන්ට හාල් තියෙනව.

**එච්. එම්. නවරත්න මයා. (මිනිපෙ)**
*(திரு. எச். எம். நவரத்ன—மினிப்பே)*
(Mr. H. M. Nawaratna—Minipe)
මේ රටේ තියෙන තරම ඇති, හොරෙන් යාම නවත්වනව නම්.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
හොරෙන් එක්තරා තොගයක් පිට කරන බව යි මම කියන්නෙ. ඒක නවත්වන්ට පුළුවන් නම් වෙළඳාමට ඕනෑ කරන විදේශ විනිමය සෑහෙන ප්‍රමාණයක් ආරක්ෂා කර ගත හැකියි.

යාපනයේ මුහුදුබඩ වෙරළ ප්‍රදේශයේ වී මෝල් කීයක් තිබෙනවද? අනික් පළාත් වලත් වී නිෂ්පාදනය සිදු වෙනව නේද? ඒ නිෂ්පාදනය කරන ප්‍රමාණයට නේද වී මෝල් තිබෙන්නෙ? හොරෙන් හාල් පිට රට යවනවද නැද්ද කියා මොලේ පාවිච්චි කර බලනව නම් සොයාගන්න පුළුවන්. සොයන්නෙ නැත්නම් පෙනෙන්නෙ නැහැ. යාපනය ප්‍රදේශයට මේ තරම් වී මෝල් මොකටද කියා ගරු ආහාර ඇමතිතුමාමත් සොයා බලා තිබෙනව. ඒ ප්‍රදේශයේ පවතින නිෂ්පාදනයේ හැටියට යාපනයේ තිබෙන වී මෝල් ප්‍රමාණය වැඩි නේද? වෙනත් ප්‍රදේශවලින් යාපනයේ මෝල්වලට ගෙන යන වීවලට මොකද වෙන්නෙ? ඒ හාල් යන්නෙ කොහාටද? ඇයි ඒවා ආපසු නොඑන්නෙ?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
The Hon. Dudley Senanayake)
ඔව මේ ව්‍යවස්ථාවට අඩංගුද? මේ ව්‍යවස්ථාවෙ හාල් ගැන නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
හරි. ඒක නම් සම්පූර්ණ ඇත්ත, ගරු කථානායකතුමනි, මේ ව්‍යවස්ථාවල තිබෙන්නෙ ඉන්දියානුවන් එන ආකාරයයි යවන ආකාරයයි. මේවා සකස් කර තිබෙන්නෙ යෑම-ඊම නවත්වන්න.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ඔය කියන්නෙ හාල් යන එන ආකාර යයි.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
හාල් හංගාගෙන ගෙන යන්ට බැරි බඩු යයි තමුන්නාන්සේ කියා තිබෙනව. හංගන්නෙ නැතුව හාල් ගෙන නොයනව නම්, මිනිසුන් යන්නෙ කොහොමද? පුටු අස්සෙ හැංගෙන්ට වුවමනා නැහැ. මිනිස් සුන් බෝට්ටුවල වාඩි වෙලා හාල් යන ආකාරයට යනව. අන්න ඒ ප්‍රශ්නය මම තරයේම මතක් කරනව. ඒ නිසා මේ ගිවි සුම ක්‍රියාත්මක කරන්ට පෙර මේ වැට ශක්තිමත් කරන ලෙස මා ඉල්ලනව. අග මැතිතුමාගේ යටතේ තිබෙන දෙපාර්ත මේන්තුවක් දුර්වල වෙලා තිබෙන කොට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් ඇඟිල්ල දික් කරල පෙන්වන්නෙ නැහැ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ඇයි නැත්තෙ?

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
අගමැතිතුමා යටතේ තිබෙන දෙපාර්ත මේන්තුවක වැරදි තිබෙනවා කියා අත් දික් කර පෙන්වන වීරයෙක් ඉන්නවද ඔය පැත්තෙ?

නියෝග

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ඔව්, ඉන්නව. තමුන්නාන්සේල වගේ භයෙන් ඉන්න උදවිය නොවෙයි, මේ පැත්තෙ ඉන්නෙ.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
මේ ගිවිසුම ක්‍රියාත්මක කරන්නෙත් අගමැතිතුමා භය කරගෙනයි. මම දන්නව, පියාගේ ප්‍රතිපත්ති ගිතේ තිබෙනව නම් පියා කපා හැරිය ඉන්දියානු ඡන්ද 2,80,000 වෙනුවට 3,00,000 ක් ඇතුළත් කර ගන්නෙ නැති බව.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
මම කියන්නම් මගේ කථාවෙදි, තමුන් නාන්සෙ පියාට කෙරුව දේ. ඒ කතන්දරය තවම කියල නැහැ.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
පියාට කරපු දේ මේ ව්‍යවස්ථාවෙ නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
If the hon. Member keeps to these regulations and does not speak about fathers and individuals, I think we can get on smoothly.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
පියා ලැයිස්තුවලින් 2,80,000 ක් කපා දැම්ම. පුතා ලක්ෂ 3 ක් ඇතුළත් කර ගත්ත.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
පුතා නොවෙයි, ගිවිසුම.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

බලන්න කථානායකතුමනි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ගිවිසුම කාගෙද?

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

එහෙම නම් තමුන්නාන්සේ මොකද මේ ගිවිසුම ක්‍රියාත්මක කරන්ට යන්නෙ? බණ්ඩාරනායක මැතිනියගේ ගිවිසුම හොඳ නැත්නම් ඇයි ප්‍රතික්ෂේප නොකරන්නෙ? මේක කරන්නෙ බණ්ඩාරනායක මැතිනියට තිබෙන භයටද, නැත්නම් තොන්ඩමන්ගේ තර්ජනයට යට වෙලාද? බණ්ඩාරනායක මැතිනියගේ ගිවිසුම නරක නම් එය අහක නොදමන්නේ ඇයි? පසුගිය ආණ්ඩුව විසින් යෝජනා කරන ලද අනන්ත දේවල් මෙම ආණ්ඩුව ප්‍රතික්ෂේප කර තිබෙනවා නොවේද? ඒවා ඒ විධියට ප්‍රතික්ෂේප කරන්නට හොඳ නම් මේක ප්‍රතික්ෂේප කරන්නට නරක ඇයි? පසුගිය ආණ්ඩුවේ යම් යම් වැඩ හොඳ නැති නිසා ඒ වැඩ වෙනස් කරන්නට මේ ආණ්ඩුව පත් වුණා. එහෙත් මේ ආණ්ඩුව පත් වුණු දවසේ සිට බණ්ඩාරනායක ප්‍රතිපත්ති ගෙන යනවා යයි කියමින් බණ්ඩාරනායක මහතා ජීනෙන්වත් නොසිතූ දේ ක්‍රියාත්මක කරගෙන යනවා. එහෙත් බණ්ඩාරනායක ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන බවයි, කියන්නේ. මේ ආණ්ඩුව බණ්ඩාරනායක ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නේ මොකටද? එහෙම නම් පසුගිය ආණ්ඩුවටම ඒවා ක්‍රියාත්මක කරන්නට පුළුවන්කම තිබුණා නොවැ. සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම ඇති කර ගත්තේ බණ්ඩාරනායක මැතිනිය බව කියමින් එය ක්‍රියාත්මක කරන්නට යන බව කියනවා. බණ්ඩාරනායක මහතාගේ සහ බණ්ඩාරනායක මැතිනියගේ යෝජනා, වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්නට නම් මේ ආණ්ඩුව පත් වන්නට ඕනෑයැ? මේ අගමැතිතුමා පත් වී සිටින්නේ බණ්ඩාරනායක

මැතිනියගේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නටද? මේ හත් හවුල් බල වේගයට වුවමනා කරන්නේ ඒකද?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The hon. Member is now making a Second Reading speech. Probably because he was unable to make a speech at that stage he is taking the opportunity now.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

ගරු කථානායකතුමනි, දැනට ගෙනයන වැඩ පිළිවෙළෙහි දුර්වලකම් මතක් කරන්නට ඕනෑ. අගමැතිතුමාගේ දෙපාර්තමේන්තුවල දුර්වලකම් තිබෙනවා නම් අප ඒවා පෙන්වා දෙන්නට ඕනෑ. ආණ්ඩු පක්ෂයේ වීරයන් සිටිනවා විය හැකියි. ඒ අය දුර්වලකම් පෙන්වා දෙනවාත් විය හැකියි. එහෙත් මොන ආණ්ඩුවක හෝ නායකයකුගේ යම් දුර්වලකමක් තිබෙනවා නම් ඒ දුර්වලකම් පෙන්වා දීමේ සිරිතක් ආණ්ඩු පක්ෂයේ උදවිය තුළ නැහැ. ඒ වගකීම පැවරී තිබෙන්නේ විරුද්ධ පක්ෂයටයි. විරුද්ධ පාර්ශ්වයේ සිටින අප ආණ්ඩුවට බැඳී නැහැ. ඒ නිසා අගමැතිතුමා යටතේ තිබෙන දෙපාර්තමේන්තුවල මේ මේ අංශයන් දුර්වල යයි පෙන්වා දීමේ යුතුකමක් අපට තිබෙනවා. විදේශ කටයුතු අංශයේ ලොකු දුර්වලකම් තිබෙන බව මා කියන්නේ ඒ නිසයි. ඒ අංශයෙන් මේ රට ආරක්ෂා කිරීමේ කටයුතු නොසිදු වන බව කිව යුතුයි. සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විදේශ කටයුතු පිළිබඳ අංශයට පෙනී තිබෙන්නේ තුන් ලක්ෂයක් ඉන්දියානුවන් මේ රටට භාර ගැනීම ගැන පමණයි. භාර ගන්නා අය ගැන මිස පිට කරන අය ගැන පෙනෙන්නේ නැහැ. පිට කරන අය පිළිබඳව රෙගුලාසිවල සඳහන් නොවීමෙන් අපට තේරුම් යන්නේ ඒකයි. මා මේ කාරණාව පෙන්වා දීම වරදක්දැයි මා ගරු අගමැතිතුමාගෙන් අහනවා. අපට වාගේම මේ කාරණය සම්බන්ධයෙන් කැක්කුම තිබෙන හුඟ දෙනකු ආණ්ඩු පක්ෂයේ සිටින බව මා දන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ඒ අය තමුන්නාන්සේගේ කථාවලට අනු වන්නේ නැහැ.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

මා මේවා කීවාට අගමැතිතුමා තරහ වන්නට වුවමනා නැහැ. කිවයුතු දේ කියන්නට ඕනෑ. ඔබතුමා සමඟ මගේ වෛරයක් නැහැ, 'මා හැමදාම මේ ප්‍රශ්නය ගැන කැක්කුමක් ඇතිව කථා කරන කෙනකු බව ඔබතුමා දන්නවා ඇති. "This is consistent with his lunacy" යනුවෙන් ගරු අගමැතිතුමා කීවා. සමහර විට ඉන්දියානු ප්‍රශ්නය මගේ පිස්සුවක් විය හැකියි. මා මේ කරුණු කියන්නේ ඒ පිස්සුව නිසයි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

එහෙම නම් ඊට සුදුසු ස්ථානයකට ගොස් කියන්න. පිස්සු කථා කියන්නෙ මෙතැන නොවෙයි, වෙන තැනක.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

මේ ගැන කියන්නට තිබෙන්නේ මෙතැන තමයි. සිංහලයන් වෙනුවෙන් සටන් කිරීම පිස්සුවක් නම් මට ඒ ගැන කරන්ට දෙයක් නැහැ. මෙතැන තියා කොතැන වුණත්, අංගොඩදී වුණත්, 'මා ඒ ගැන කිව යුතු දේ කියනවා. අපේ ජාතිය මරණවාට විරුද්ධව නිතරම සටන් කරනවා.

හැම ආණ්ඩුවක්ම බලය ඉල්ලන්නෙ සිංහලකම ගැන කථා කරමිනුයි. මහ විපත ප්‍රදර්ශනය කරමින්, සිංහලයන් ගැන කථා කරමින් රට වටේ ගිය අය බලය ලබාගෙන මෙතැනට ආවාට පසුව ඒ ඔක්කොම අමතක වෙලා. අප සිංහලකම ගැන මතක් කළොත් අපට පිස්සුලු. බලයට එන්නේ සිංහල ඡන්දයෙන්; එහෙත් ආණ්ඩු කරන්නේ දෙමළ තර්ජනයෙන්. සිංහලකම අමතක වන්නට හේතුව ඒකයි. අප භය නැතිව මේ කාරණය කියනවා.

තවත් දෙයක් කියන්නට ඕනෑ. ඉන්දියාවට යැවීම සඳහා පන් ලක්ෂ ගණනක් එක ගොඩකට දමන විට ඒ පිළිබඳ ලැයිස්තු සකස් කරන්නේ මොන ආකාරයටද? සකස් කරන්නේ ඉන්දියාවට යා යුතු පිරිසගේ ලැයිස්තුවක්ද? එහෙම නැත්නම් ඉන්දියානු පුරවැසිකම ලබා ගන්නවුන්ගේ ලැයිස්තුවද? ඉන්දියානු පුරවැසිකම ලබා ගන්නවුන් මේ ලැයිස්තුවට ඇතුළත් කරනවාද? මට පෙනෙන හැටියට නම්, මට හැඟෙන හැටියට නම්, පළමුවෙන් කරන්නේ ඉන්දියානුවන් ගොඩක් එකට එක් කිරීමයි. ඒ ගොඩ සකස් කළාට පසුවයි ඉන්දියානු පුරවැසිකම ලබා ගන්න යන්නෙ. ඒ පිරිසම ඒ තොගයම කෙලින්ම ඉන්දියානු පුරවැසියන්ය කියා ඉන්දියානු ආණ්ඩුව භාර ගන්නවාද? මට අගමැතිතුමා විසින් ඊයේ කියන්න යෙදුනා එවැනි බලයක් ඉන්දියානු ආණ්ඩුවට තිබෙනවාය කියා.

ඉන්දියානුවන් නොවන පිරිසක් ඉන්දියානු පුරවැසියන්ය කියා භාර ගැනීමට ඉන්දියානු ආණ්ඩු ක්‍රමයේ හැටියට පුළුවන්ය කියා එතුමා කිව්වා. මා ඒ ගැන හොඳට සොයා බැලුවා. මට නම් එවැනි වගන්තියක් සොයා ගන්න බැරි වුණා. ඉන්දියානු ආණ්ඩු ක්‍රමයේ 8 වෙනි වගන්තියේ තිබෙන්නේ ඉන්දියානු උත්පත්තියක් තිබෙන උදවිය පිටරටවල ඉන්නවා නම් නිදහස ලබා ගත්තාට පසුව අවුරුද්දක් ඇතුළත ඔවුන් පිටරටවල තිබෙන ඉන්දියානු තානාපති කාර්යාලවල ලියාපදිංචි කරන්න ඕනෑය කියන ප්‍රකාශයයි. නමුත් එයටත් කාල සීමාවක් තිබෙනවා. අවුරුද්දක් තුළ කියා එහි සඳහන් වෙනවා. එහෙම නම් දැන් ඒ වගන්තිය අනුව ඉන්දියානු පුරවැසිකම් ලබා ගන්න බැහැ. ඉන්දියානු ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව පුරවැසිකම දෙනවායයි කියන අදහසක් මට නම් මේ වනතුරු සොයා ගන්න බැරි වුණා. සමහරවිට අගමැතිතුමා ඒ ගැන දන්නවා ඇති. මටත් එය දැන ගන්න ඕනෑ. මා හිතනවා ගරු අගමැතිතුමා තරහ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වන්නෙ නැතුව කරුණාකර මට එය කියා දෙනවා ඇත කියා. නොදන්නා කෙනෙක් හැටියටයි මා අසන්නෙ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
මම කියා දෙන්නම්.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
ඒ නිසා ඉන්දියානු පුරවැසි භාවය ලබා ගන්ට හැකි වන්නේ මා හිතන හැටියට නම් ආගමන විගමන පනත අනුවයි. ඉන්දියානු ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 8 වෙනි වගන්තිය අහෝසි කර ඉන්දියානු පුරවැසි භාවය නමින් වෙනමම පනතක් සකස් වී තිබෙනවා. ඒ පනතේ පැහැදිලි ලෙස කියා තිබෙනවා තොග පිටින් ගොඩ පිටින් ඉන්දියානුවන් භාරගෙන පුරවැසියන් කර ගන්න ඉන්දියාවේ නීති ක්‍රමයේ ඉඩක් නැති බව. ඉල්ලුම්කරුවන්ට පමණයි පුරවැසිකම් ලබා ගන්න පුළුවන් වන්නෙ. මේ පන් ලක්ෂය වෙන් කළාය කියා ඒ මුළු තොගයම ඉන්දියානු ආණ්ඩුවට භාර ගන්න පුළුවන්කමක් නැහැ. ඉන්දියානු ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව තොගයකට එක් වර පුරවැසිකම් දෙන්න කිසිම අයිතියක් නැහැ. ඒ විධියටයි ඉන්දියානු ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන්නේ. එහෙම නොවේ නම් මට පෙන්වා දෙන්න. ඉන්දියානු පුරවැසිකම ලබා ගන්න නම් ඉල්ලුම් පෙත්සමක් ඉදිරිපත් කරන්න ඕනෑ. මට ඉන්දියානු පුරවැසිකම ලබා ගන්න ඕනෑය කියා පෙත්සමක් ඉදිරිපත් කරන්න ඕනෑ. ඊට පසු ඒ ඉල්ලුම්කරුගේ දෙමව්පියන් ඉන්දියාවට අයත් අයද ඔහුගේ උත්පත්තිය ඉන්දියාවේද යන කරුණු ගැන කල්පනා කර බැලීමෙන් පසුවයි ඔහුට ඉන්දියානු පුරවැසිකම ලැබෙන්නෙ. ඒ නිසා මේ පන් ලක්ෂ විසි පන්දහස එකින් එකට තෝරා බැලීමෙන් පසුවයි ඔවුන්ට පුරවැසිකම් ලබා දෙන්නෙ. එතෙක් මේ උදවිය මේ රටින් පිටකරන ඉන්දියානුවන්ගේ ලැයිස්තුවට ඇතුළත්ව සිටිය යුතුයි.

මේ වෙන් කිරීමෙන් මොකක්ද වන්නෙ? මේ පිරිසෙන් බාගයක් වත් ඉන්දියානු ආණ්ඩුව භාර නොගත්තොත් මොකද වෙන්නෙ? සමහර විට මේ පිරිස ඉන්දියානු ආණ්ඩුව මගින් ඉල්ලා නොසිටියොත් ඇති වන තත්ත්වය මොකක්ද? නැවතත් ජාතියක් නැති පිරිසක් ඇති වෙනවා. මේ ලැයිස්තු සකස් කිරීම නිසා අපට අවාසියක් සිදු වෙනවා නේද? නැවත වරක් ජාතියක් නැති පිරිසක් මේ රටේ ඇති වෙනවා. ඉන්දියාවේ පුරවැසි භාවය ඉල්ලුවෙ නැති පිරිස ඉතිරි වෙනවා නේද? ඒ අයට කරන්නෙ මොකක්ද? ඉන්දියාවේ පුරවැසි භාවය දුන්නාය කියන සහතික පත්‍රය ලැබූ උදවිය 5,25,000 ක් ඇතුළත් කර අප දෙවැනි ලැයිස්තුව හදනවා නම් එයින් අපේ ආරක්ෂාව ඇති වෙනවා. ඉන්දියානු පුරවැසිකම ලැබූ අයගේ ලේඛනය හදා ගත් පසු ඒ ගොඩෙන් මේ අය පිට කළාය කියා ලේඛන සෑදීමේ සාධාරණකමක් තියෙනවා. ඉන්දියානු පුරවැසිකම ලැබූ අයගේ ලේඛනය තිබෙනවා නම් බලාපොරොත්තුවක්, ආරක්ෂාවක් තිබෙනවා. එහෙත් මෙතැන එහෙම එකක් නැහැ. තුන් ලක්ෂයක් අපි ගන්නවා. 5,25,000 ක් වෙනම ගොඩකට ගහනවා. ඉන්දියාව ඒ අය භාර ගන්නවාද ඒ අය යවන්නෙ කවදාද යන කිසි දෙයක් නැහැ.

ඉන්දියානු ප්‍රශ්නය විසඳන්නට ඇති කළ ගිවිසුමයි, මේ ක්‍රියාත්මක කරන්නෙ. මේකෙ විසඳුම මොකක්ද? අප තුන් ලක්ෂයක් භාර ගැනීම පමණයි. මේකද විසඳුම? අපේ ප්‍රශ්නය වී තිබුනේ කොයි තරම් ගණනක් අපේ පුරවැසියන් හැටියට භාර ගන්නවාද කියන එකද? අප යවන්නේ කොපමණද කියන එකයි, අපේ ප්‍රශ්නය. යවන අයගේ ලැයිස්තුවක් හදනවා නම් ඒ ලැයිස්තුවට ඇතුළත් වන සෑම තැනැත්තකුම ඉන්දියානු පුරවැසියකු විය යුතුයි. දැන් තිබෙන ආකාරයට ලැයිස්තු හැදුවාට ඒ අයට ඉන්දියානු පුරවැසිකම් ලැබේද නැද්ද යන්න කව්රුවත් දන්නෙ නැහැ. ගරු ඩී. එස්. සේනානායක අගමැතිතුමාටත් ඔය විධියේම හැඟීමක් දුන්නා නේද? ඉන්දියානු සහ පාකිස්තානු පුරවැසි පනත අනුව නුඹලාගේ පිරිස නුඹලා තෝරා ගනිල්ලා, ඉතිරි පිරිස සියල්ලම අප භාර ගන්නවා කියා නේද නේරුතුමා ඩී. එස්. සේනානායක අගමැතිතුමාත් සමග

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගිවිසුම අත්සන් කළේ? ඊට පසුව මොකද වුණේ? පනත සම්මත වුනා. 1,35,000 ක් අප භාර ගත්තා. ඊට පස්සෙ ඉන්දියාව කිව්වෙ මොකක්ද? ඉතිරි අය අපෙත් නොවෙයි, නුඹලාගෙත් නොවෙයි, ඒ නිසා ඒ අය රටක් නැති පිරිසක් හැටියට පත් වුණාය කිව්වා. ගිවිසුම අනුව ඉන්දියාව භාර ගන්නට පොරොන්දු වුණු පිරිස නේද ඒ විධියට රටක් නැති පිරිසක් බවට පත් වුණේ? නේරුතුමාගේ අත්සන ඇතිව තිබෙන ගිවිසුමක් නේද, ඒක?

මේ විධියට කිරීමෙන් නැවතත් වරක් අප ඒ ගැටයටම, ඒ උගුලටම අසු වෙනවා නේද? 5,25,000 ක් යවනවාය කියා 3,00,000 ක් අප භාර ගන්නවා. එහෙත් ඩී. එස්. සේනානායක අගමැතිතුමාගේ කාලයේදී ඔයිට වඩා ශුද්ධ ලෙස, පැහැදිළි ලෙස නේරුතුමා කීවා, ඉතිරි සියල්ලන්ම අපේ හැටියට අප භාර ගන්නවාය කියා. දැන් ගන්නවාය කියන වචනයත් නැතිව, කරන්න ක්‍රමයකුත් නැතිව 5,25,000 ගොඩකට ගැසූ පළියට මේ ප්‍රශ්නය විසඳෙනවාද? දැන් කෙරෙන්නේ 5,25,000 ගොඩගැසීම පමණයි; ලැයිස්තු සෑදීම පමණයි. ඒ ලැයිස්තුවට ඇතුළත් සියළු දෙනාම පෞද්ගලිකව එක් එක් කෙනා ඉල්ලන්නට ඕනෑ, මට ඉන්දියානු පුරවැසිකම ඕනෑය කියා. පරීක්ෂණ නැතිව, ඉල්ලුම් කරන අයට පුරවැසිකම දෙනවාය කියන පොරොන්දුව පිටයි, ගිවිසුම් සාර්ථක කර ගන්නට යන්නේ. ඒ විධියට කෙරෙයිද, නැද්ද යන්න දැන ගන්නට ලැබෙන්නේ මේ රෙගුලාසි සම්මත වී කාලයක් ගියාට පසුවයි. ඒක භයානක දෙයක්.

එමනිසා දොම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) ඉදිරිපත් කළ තර්කය ඉතා වැදගත් එකක්. කෙනෙකු ඉන්දියානු ගොඩට දැම්ම පළියටම මාස දෙකක් ගත වුනාට පසු ඔහුට තාවකාලික බලපත්‍රයක් දිය යුතුය කියා නියම කරන්නට කොමසාරිස්තුමාට බලය තිබෙනවා නම් ඒ බලපත්‍රය දෙන්නේ මොන ආකාරයටද? කඩදාසි කැබැල්ලකටද? එහෙම නැතිනම් පාස් පෝට් එකටද සීල් තබන්නේ? මෙය බේරුම් කර ගැනීම අවශ්‍යයි. සාමාන්‍යයෙන් ලෝක ව්‍යවහාරය අනුව "රෙසි ඩන්ස් පර්මිට්" කියන්නෙ වීසා ක්‍රමයකටයි. වී. ආර්. පී. කියන්නෙත් මේ රටට විදේශයෙන් එන අයට දෙන වීසා බල පත්‍රයටයි. ලෝකයේ හැම රටකම පවතින සිරිත ඒකයි. අප ලෝකයේ බොහෝ රට වල සංචාරය කර තිබෙනවා. අපේ ගමන් බලපත්‍රයෙ මාසයක් හෝ දෙකක් රටේ නතර වීමට හැකි වන අන්දමට සීල් තබනවා, නැති නම් රැඳී සිටීමට බලපත්‍ර යක් දෙනවා. මෙයට තමයි අප වීසා බලපත්‍රය නැති නම් වී. ආර්. පී. කියන්නෙ. මෙම වී. ආර්. පී. බලපත්‍රය වෙනුවට ආර්. පී. බලපත්‍රය කියා කියන්න හදනවාදැයි මා දන්නෙ නැහැ. කෙසේ වුණත් ඉන්දියානුවන් වශයෙන් පිළිගෙන පාස්පෝට් ලබාගත්තාට පසුව එවැනි බලපත්‍රයක් නිකුත් කරනවා නම්, අපට තරමක් දුරටවත් සෑහීමකට පත් වෙන්න පුළුවනි. එම නිසා ඒ අන්දමට ආර්. පී. බලපත්‍රයක් දෙන්නේ නම් ඉන්දියානුවන් වශයෙන් පාස්පෝට් නිකුත් කිරීමෙන් පසුව, ඉන්දියානු ආණ්ඩුව පිළිගැනීමෙන් පසුව, කළ යුතු බවයි අපේ පිළිගැනීම. එවිට අප දන්නවා මේ පිරිස, ඉන්දියානු පුරවැසියන් වශයෙන් පිළිගත් පිරිස, මෙරටින් බැහැර ව යන බව. ඒ අය ඉන්දියානුවන් වශයෙන් ඉන්දියාව පිළිගෙන ඇති බවට අපේ පිළිගැනීමක් එවිට ඇති වෙනවා. එසේ වුණත් ආර්. පී. බලපත්‍රය වෙනත් බලපත්‍රයක්. ඉන්දියානු පුරවැසියන් වශයෙන් පිළිනොගෙන, පාස්පෝට් නොලබා ආර්. පී. බලපත්‍රයක් පමණක් නිකුත් කර එම පිරිසට මේ රටේම ඉන්න ඉඩ දෙනවා නම් එයින් කිසිම ප්‍රයෝජනයක් සැලසෙන්නෙ නැහැ. එම බලපත්‍රය තුට්ටුවක් තරම්වත් වටින්නෙ නැහැ.

ගරු කථානායකතුමනි, කාටද මේ ආර්. පී. බලපත්‍රය දෙන්න යන්නෙ? අවුරුදු ගණනාවක්ම මේ රටේ පදිංචිව සිටි පිරිස කට නොවේද නැවත වරක් ආර්. පී. බල පත්‍රයක් දෙන්න යන්නෙ? විදේශිකයින් වශයෙන් හඳුනාගත්තාට පසුව, ඉන්දියානු පුරවැසියන් වශයෙන් ඉන්දියාව පිළිගත්තාට පසුව, ඒ පිරිසත් තමන් ඉන්දියානු පුරවැසියන් බව පිළිගත්තාට පසුව නොවේද එවැනි බලපත්‍රයක් නිකුත් කරන්න ඕනෑ? එසේ පිළිගැනීමෙන් පසුව ආර්. පී. බලපත්‍රයක් නිකුත් කරන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වා නම් සාමාන්‍ය ක්‍රමය අනුව, සාමාන්‍ය නීතිය අනුව, අපට ඔවුන් ඉන්දියානු පුරවැසියන් වශයෙන් පිළිගත හැකියි. නමුත් නිකුත් කරන්න අදහස් කරන කඩදාසි කැබැල්ලෙ කිසිම වටිනාකමක් තිබෙනවාද? හොඳයි, අප ඉන්දියානු පුරවැසියන් වශයෙන් පිළිගත්තත්, ඉන්දියානු ආණ්ඩුව ඒ පිරිස ඉන්දියානු පුරවැසියන් වශයෙන් පිළිගැනීම ප්‍රතික්ෂේප කළොත්, මේ කඩදාසි කැබැල්ලෙන් ඇති ප්‍රයෝජනය කුමක්ද? එවිට අපට මුහුණ පාන්න වන තත්ත්වය මොකක්ද?

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේටවත් මටවත් ආර්. පී. බලපත්‍රයක් අවශ්‍යද මේ රටේ ජීවත් වන්න? මේ රටේ පාරම්පරිකව පදිංචිව සිටින, උරුමකම් ඇති, මේ රටේම උපන් සිංහලයින්ට, ආර්. පී. බලපයත්‍රක් වුවමනා කරන්නෙ නැහැ; උත්පත්තියෙන්ම ආර්. පී. බලපත්‍රයක් ලැබී තිබෙනවා. එම නිසා අමුතුවෙන් ආණ්ඩුවෙන් බලපත්‍රයක් ලබාගන්න වුවමනාවක් නැහැ. එහෙම නම් ඉන්දියානු ආණ්ඩුව එරට පුරවැසියන් වශයෙන් පිළිනොගන්නා පිරිසකට මෙරට ආර්. පී. බලපත්‍රයක් නිකුත් කිරීමේ අර්ථය කුමක්ද? එය මහ විහිළුවක් නොවේද? ඒ ප්‍රශ්නය නිරවුල් කර නොගෙන, ආර්. පී. බලපත්‍ර දීම පිණිස වගන්ති සකස් කිරීමෙ ඇති ප්‍රයෝජනය මොකක්ද? අර්ථය කුමක්ද? අප ලැයිස්තුවක් සකස් කර පිළිවෙළින් අංක එකේ සිට පන් ලක්ෂ විසි පන්දහස දක්වා ඉන්දියානු පිරිසකගේ නම් ඊට ඇතුළත් කරනවා. එසේ ලැයිස්තුවට ඇතුළත් කරන පිරිස ඉන්දියානු පුරවැසියන් වශයෙන් ඉන්දියානු ආණ්ඩුව පිළිගන්නවා නම් පමණයි එයින් වැඩක් වෙන්නෙ. එහෙම නම් පමණයි ප්‍රශ්නය විසඳුවා වන්නෙ. ඉන්දියානු පුරවැසියන් වශයෙන් පිළිගෙන පාස්පෝට් ලබාගත්තාට පසුව, පිළිවෙළින් අංක එකේ සිට ලැයිස්තුවට නම් ඇතුළත් කරනවා. රටින් පිටව යන එක නොවෙයි ප්‍රධාන ප්‍රශ්නය. එය ප්‍රශ්නයක් බව ඇත්ත; නමුත් ඒ ප්‍රශ්නය මතු වන්නෙ වෙනත් ආකාරයකටයි. එම නිසා ඉන්දියානු ආණ්ඩුව මේ පිරිස ඉන්දියානු පුරවැසියන් වශයෙන් පිළිගත්තාට පසුව ලැයිස්තුවට ඇතුළත් කළ යුතු බවයි අපේ හැඟීම. ඊට පසුව ආර්. පී. නොව ඕනෑම බලපත්‍රයක් දුන්නාට අපට කමක් නැහැ.

ගරු කථානායකතුමනි, පනත යටතේ දැනට රෙගුලාසි සකස් කරන්න යන්නෙ ඒ අදහස ඇතුව නොවෙයි. ඒ අදහස කිසිම ලෙසකින්වත් මතු වෙන්නෙ නැහැ. රෙගුලාසි සකස් කර තිබෙන්නෙ ඉන්දියානුවන් සහ ලාංකිකයන් වශයෙන් කොටස් දෙකකට මේ පිරිස වෙන් කර අප භාර ගන්නා කොටසට සියලු පුරවැසි බලතල, අයිතිවාසිකම්, ලැබෙන අන්දමටයි. අනික් කොටස, ඉන්දියානුවන් වශයෙන් වෙන් කරන කොටස, ගැන පොතේ සටහන් කර තිබෙනවා පමණයි. පොතේ නම තියාගෙන, අපට බල පත්‍ර දියන්, අප නුඹලාගේ ජාතිකයින් ලෙස පිළිගනින් කිය කියා ඉන්දියාවෙන් ඉල්ලමින් ඔවුන් මේ රටේම වාසය කරයි. කවදා එහෙත් බල පත්‍ර ලැබෙයිද, කවදා ඔවුන් ඉන්දියාවට යැවෙයිද යන ප්‍රශ්න කොයි කාලයේ විසඳේදැයි කියන්නට බැහැ. යම් දවසක ඒ ප්‍රශ්න විසඳුණත් ඊළඟට නවත් ප්‍රශ්නයක් මතු වෙනවා. එනම්, ඔවුන් ඉන්දියාවට යැවීමට සල්ලි තිබෙනවාද යන ප්‍රශ්නයයි. මේ ප්‍රශ්න ගැන කාටවත් හදිස්සියක් නැහැ. ඒවා කාලයක් තිස්සේ හෙමින් සීරුවේ විසඳන්නට පුළුවන් ප්‍රශ්න හැටියටයි සලකන්නේ. එය ගමන් කරන්නේ හෙමින් කෝච්චියේ. අවුරුදු 5 ක් නොව 15 ක් තිස්සේ ඒ ප්‍රශ්න නොවිසඳී තිබුණත් කාටවත් අමාරුවක් නැහැ. එහෙත් අප බාර ගන්න පිරිස සම්බන්ධ කටයුතු ඊළඟ මැතිවරණයට කලින්, ඩී. එම්. කේ. නායකයා එන්නට කලින් විසඳා ගන්නට කාටත් ඕනෑ වී තිබෙනවා. මෙය පුදුම දෙයක් නොවෙයිද කථානායකතුමනි? අපට කැක්කුමක් ඇති වී තිබෙන්නේ මෙන්න මේ කාරණය ගැනයි.

මෙම ගිවිසුම අත්සන් කරන අවස්ථාවේදී මා තුළ ඇති වුණු මූලික හැඟීම මෙයයි: අපේ රටේ කඳුකරයේ ජනතාව පුදුම විධියේ දුකක් විඳපු පිරිසක්. පෘතුගීසීන් මේ රට ආක්‍රමණය කරන්නට පැමිණි අවස්ථාවේදී කන්දේ මිනිසුන් පුදුම සටනක් කොට කඳුකරය ආරක්ෂා කර ගත්තා. විදේශීන්ගේ ආක්‍රමණ නිසා කඳුකරයට ආහාරපාන කිසිවක් ලබා ගන්නට බැරි වුණු අවස්ථාවේදී කන්දේ මිනිසුන් කඳු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාවට නැඟීමේ) පනත:

[ආර්. ජී. සේනානායක මයා.]

උඩ කුඹුරු හදාගෙන එහි ජනතාවට කන්න දිදී විදේශීන් සමග සටන් කළා. කිසිම දෙයක් නැන්නෙන් ලබා ගන්නට ඔවුන්ට පුළුවන්කමක් තිබුණේ නැහැ. ලුණු ටික පවා උතුරේ අච්චුවේලියෙන් ලබා ගත් බවට වාර්තා තිබෙනවා. ඒ තරම් තද බල අන්දමට කඳුකරය වැටලූ විදේශිකයින් කන්න නැතිවම කන්ද වැටේයයි බලාපොරොත්තු ඇති කරගෙන සිටියා. යුගෝස්ලාවියාවේ ටිටෝ පුදුම විධියේ සටනක් කළ කෙනකු බව අප දන්නවා. ඔහුත් කන්දේ මිනිහෙක්. හැම රටකම කන්දේ උදවිය පුදුම විධියේ සටන්කාමීන් බව පැහැදිලි කරුණක්.

අප ඉස්කෝලේ යන කාලයේදී "ස්කොට්ස්" නම් මනුෂ්‍ය වර්ගයක් ගැන ඉගෙන ගත් බව තමුන්නාන්සේටත් මතක ඇති. ඉතා දක්ෂ ලෙස සටන් කළ ඒ මිනිසුනුත් කන්දේ උදවියයි. සටන් කාමී "ගුර්කා" වරුන් ගැන අප අසා තිබෙනවා. ඔවුනුත් කන්දේ මිනිසුන්. හැම රටකම කන්දෙ මිනිසුන්ට ඔවුන්ගේ රට ජාතිය ගැන පුදුම හැඟීමක් තිබුණා. ලංකාවෙහිත් කන්දේ සිංහලයින් සිටියා. ඔවුන් අපේ රට, ජාතිය, භාෂාව, ආගම, සංස්කෘතිය රැක ගන්නට ඕලන්ද, පෘතුගීසි, ඉංග්‍රීසි යන තුන් ජාතියකට විරුද්ධව පුදුම අන්දමේ මහා සටන් කළා. එහෙත් අන්තිමේදී ඔවුන් වැටුණා. කන්දේ මිනිහා නැවතත් ස්වාධීනත්වයට පත් වුණොත් ඔවුන්ගේ ජාතික හැඟීම් නැවතත් මතුවී යළිත් වරක් ඔවුන්ට පුරුදු සටන පටන් ගනීතැයි අදහස් කළ සුද්දන්, සිංහලයින් සදහටම යටපත් කර තබා ගැනීමට කල්පනා කොට අමුතු ජාතියක් මෙහි ගෙනැවිත් බෝකළා. එය තේවතුවල වැඩට පමණක් නොව යුද්ධ කටයුතුවලටත් අදාළ කාරණයක් වුණා. සිංහලයාට ආයෙත් වරක් හිස ඔසවන්නට බැරි වන අන්දමට මැඩ පවත්වා තබා ගන්නට නම් කඳුකරය යටත් කොට තබා ගත යුතු බව දැනගත් සුද්දන් එහි ඉඩකඩම් බලහත්කාරයෙන් අල්ලාගෙන අමුතු වගාවකුත් ඇති කොට දෙමළුන් දහස් ගණනින් ගෙනැවිත් එහි පදිංචි කරවා ඔවුන්ගේ ආරක්ෂාවට කටයුතු යෙදුවා. ඒ උදවියගේ කැක්කුමක් තිබෙනවා අප තමයි සුද්දන්ගෙන් බැට කෑවේ කියා. "අපේ ඉඩම් සුද්දො ගත්තා, අපේ අයට ඉඩම් නැහැ, බලන්න ඕනැ නම් පාරවල යන විට" කියා ඒ උදවිය කියනවා. ඇත්ත වශයෙන්ම සමහර ස්ථාන හරියට මදුරාසියේ පෙදෙසක් වගෙයි. සිංහල වචනයක් නැහැ. ඒ උඩරටියන් මෙහි ඇවිත් කාරක සභාව ඉදිරිපිට සාක්ෂි දුන්නා. මොනවාද ඒ අය කිව්වෙ? අපට ආර්ථික වශයෙන් ඉතාමත්ම දුප්පත් තත්ත්වයක් තිබෙනවාය, අපට ඉඩම් නැත, හැම අංශයකින්ම අප සුළු ජාතියක් වී තිබෙනවාය, අපට තිබෙන එකම එක මහා ජාතික අයිතිවාසිකම නම් ඡන්දය පමණය කියා ඒ අය මෙහි ඇවිත් කිව්වා. කඳුකරයේ අපට තිබෙන්නේ අපේ පාරම්පරික උරුමය අනුව එන ඡන්දය පමණය කියා ඒ අය කිව්වා.

උඩරට ප්‍රදේශ කීපයක ගරු මන්ත්‍රීවරුන් අද මෙහි සිටිනවා. බණ්ඩාරවෙල, බදුල්ල, මහනුවර ආදී ප්‍රදේශවල සිංහල මන්ත්‍රීතුමන්ලා සිටිනවා. සෙනග බලය, ඡන්ද බලය උඩයි මේ අය ඇවිත් තිබෙන්නේ. පාරම්පරික උරුමය අනුව ඔවුනට තිබෙන්නේ ඡන්දය පමණයි.. නමුත් ඒ උරුමයත් අහිමි වන ආකාරයට නවත් තුන් ලක්ෂයක්, ඒ උදවිය පාගා දමන්නට සුද්දන් ගෙනා තුන් ලක්ෂයක් දමා පාලන බලයත් අල්ලා ගන්නට පුළුවන් තත්ත්වයක් ඇති වන විධියට ඔවුන්ගේ නම් ඡන්ද ලැයිස්තුවලට ඇතුළු කිරීම යුතුද? උඩරටියනට අද තිබෙන එකම අයිතිය ඡන්ද බලය පමණයි. ඔවුනට මුදල් නැහැ; ඉඩම් නැහැ; රැකීරක්ෂා නැහැ. ඒ ආකාරයට සෑම දේම අහිමි වී තිබෙන මෙවැනි අවස්ථාවකදී ඔවුනට තිබෙන එකම අයිතිය වන ඡන්ද බලයත් මෙතැනදී අහෝසි වෙනවා නොවේද? මේ තුන් ලක්ෂය දමන්නේ කුමන ප්‍රදේශවලටද? කොයි ප්‍රමාණයටද? කුමන ඡන්ද කොට්ඨාශවලට මේ අය ඇතුළු කරන්නට යනවාද යන ප්‍රශ්නය උඩරටියන් ඇසීම යුතු නැද්ද? ඇත්ත වශයෙන්ම ඒක ඇසිය යුතු ප්‍රශ්නයක්. හය වෙන්න එපා, මම උඩරටියන් ආරක්ෂා කර දෙන්නම්ය කියා අගමැතිතුමා පොරොන්දු වුණා. කෝ, ඔවුන් ආරක්ෂා වෙනවාද මේ රෙගුලාසිවලින් ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ ගිවිසුම ඇති කර ගත් හිටපු අගමැතිනිය දැන් මෙතැන නැහැ. මා නම් මුල සිටම මේ ගිවිසුමට සහයෝගය දැක් වූයේ දෙවැනි ලේඛනයක් පිළියෙල කරන නිසයි. දෙවැනි ලේඛනයක් අනුව මේ තුන් ලක්ෂය භාර ගන්නා නිසයි. මා සෑම විටම මේ දෙවැනි ලේඛනය ඉල්ලා රැස්වීම් පැවැත්වූ බව තමුන්නාන්සේ දන්නවා ඇති. නමුත් මේ තුන් ලක්ෂය රැක බලා ගන්නට අද දෙවැනි ලේඛන යත් නැහැ; පන් ලක්ෂ විසිපන් දහස යන බවට ලකුණකුත් නැහැ. එසේ නම් මොකක්ද මේ ගිවිසුමෙන් අපට ලැබෙන යහපත? මැතිනිය තුළ පන් ලක්ෂ විසි පන් දහසක් පිට කරන්නට ඕනෑය යන කැක්කුම තිබුණා. කෝ, මේ පන් ලක්ෂ විසිපන් දහස යනවාද? ඊළඟට, මේ භාර ගන්නා තුන් ලක්ෂය වෙනම ඡන්ද ලැයිස්තුවලට—අර කඳුකරයේ වීර සිංහල යන්ගේ දේශපාලන අයිතිය නැති නො වන ආකාරයට—වෙනම ඡන්ද ලැයිස්තු වලට ඇතුළත් කරනවා ඇත යන විශ්වාස ය උඩයි මා මේ ගිවිසුම් ක්‍රියාත්මක කරන්නට සහයෝගය දුන්නෙ. නමුත් අද දෙවැනි ලේඛනයත් නැහැ; පන් ලක්ෂ විසි පන් දහස යන බවට ලකුණකුත් නැහැ. පුදුම තත්ත්වයක් දැන් තිබෙන්නේ.

හොඳයි, දෙවැනි ලේඛනය තබන්නට බැරිය කියමු. එසේ නම් වෙනත් ක්‍රමයක් තිබෙනවාද? තිබෙනවා නම් කෝ ඒ ක්‍රමය පිළිබඳ විස්තර? ඒවාට රෙගුලාසි වුවමනා නැද්ද? ඒ ගැන පරීක්ෂණ පවත්වනවාද? ඒ මොකවත් නැහැ. මෙවැනි තත්ත්වයක් ඇති වන බව දන්නවා නම් මා කවදාවත්—කවුරු ඉදිරිපත් කළත්—මෙවැනි දෙයකට උදව් දෙන්නෙ නැහැ. මා එදා සිටියේ විරුද්ධ පාර්ශ්වයේයි. මා සිටියේ කෙළවර කොණේයි. මෙම ප්‍රශ්නයේදී මා පැනලා එවකට තිබුණු ආණ්ඩුවට පක්ෂව ඡන්දය දුන්නේ එක්තරා හැඟීමක් ඇතුවයි. ඉන්දියානු ප්‍රශ්නය විසඳන අවස්ථාවේදී පන් ලක්ෂයක් පිට කරන අතර වෙනම ඡන්ද ලැයිස්තුවක් අනුව තුන් ලක්ෂයක් ගන්න තේද අදහස් කළේ? එම විශ්වාසය උඩයි, මා ඡන්දය දුන්නේ. එහෙත් මේ තුන් ලක්ෂයට පුරවැසිකම් දීලා මුළු කඳුකරයම ඔවුන්ට අයිති වෙන්නට යනවා. එපමණක් නොවෙයි, අර පන් ලක්ෂය යන්නේත් නැති පාටයි.

මේක කළේ අගමැතිතුමාගේ හිතේ තිබුණු අදහසක් පිට නොවෙයි. හවුල් වන විට හවුලේ කියන දේවලින් හුඟ හරියක් එතුමාට කරන්නට සිදු වන බව මා දන්නවා. දැනට සිටින එක් ලක්ෂ තිස් පන් දහසට මේ ආකාරයට තර්ජනය කරන්නට පුළුවන්කම තිබෙනවා නම්—සමාවන්න, "තර්ජනය" කියන වචනය මා ඉල්ලා අස් කර ගන්නම්, එහෙම කියන විට අප රාදේ අගමැතිතුමා නිකම් කිපෙනවා—අනික් උදවියත් එකතු වූ විට කුමන තත්ත්වයක් ඇති වේවිද? අප මේකට තර්ජනය නොවෙයි, වෙන දෙයක් කියමු. මොකක් හරි කිමකැයි කියමු. අවවාදයකැයි කියමු. ඉතාමත් සුළු ලෙස කරන අවවාදය කැයි කියමු. බලපෑමය කියන එකත් පැත්තකින් තියමු. අගමැතිතුමාට මෙම අවවාදය දුන් පසු එතුමාට ඒ අනුව වැඩ කරන්නට සිදු වෙනවා, එක් ලක්ෂ තිස් පන් දහස නිසා "ඉරිකියා, පෝරියා" කිය කියා වැඩ කරන්නට වෙනවා. "ඉරිකියා" කියාගෙන ඡන්දය ගන්නා. මේ ආණ්ඩුවට තේද, "ඉරිකියා" කිය කියා ඡන්දය ගත්තේ?

හොඳයි, මේ එක්ලක්ෂ තිස්පන් දහසේ අවවාදය නිසා වේවා, බලපෑම නිසා වේවා, තර්ජනය නිසා වේවා, ක්‍රියාත්මක වෙන්නේ කුමක්ද? තව තුන් ලක්ෂයක් ඡන්ද ලැයිස්තුවට වැටෙනවා. එහෙත් පන් ලක්ෂය යැවීම ගැන තාම ලකුණක්වත් පහළ වී නැති බව අද තත්ත්වයට අනුව කියන්නට පුළුවනි. එන මැතිවරණයේදී මේ තුන් ලක්ෂයත් ඡන්දය දෙනවා. එසේ නැතිනම් මේ තුන් ලක්ෂයෙන් වැඩි කොටසක් ඡන්දය දෙනවා. එතකොට ඔය දෙන අවවාද ඔයිට වඩා අඩු වේවිද, වැඩි වේවිද? එක්ලක්ෂ තිස්පන් දහසක් මෙහෙම කළා නම් තව තුන් ලක්ෂයක් වැඩි වුණාම කොහොමද කරන්නේ? ඒ උදවිය පන් ලක්ෂයක් යවන්නට ඉඩ දේවිද? කවදාවත් ඒක වෙන්නේ නැහැ. එක් ලක්ෂ තිස් පන් දහසකගේ බලපෑම උඩ මේ ආකාරයට ගිවිසුමේ අඩු කඩා දමා සංශෝධනය කරනවා නම් තව තුන් ලක්ෂයක් මේ ගොඩට එක් වූ පසු අර පන් ලක්ෂ


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ය පිට කරන්නට පුළුවන් වේවිද? වැඩ අවසාන වන්නේ පන් ලක්ෂයත් නොයා මෙන් තමයි. මේ අන්දමට කටයුතු කරන අය සිටියහොත් මේ තුන් ලක්ෂයට පමණක් නොව අර පන් ලක්ෂයටත් ඡන්ද බලය දේවි.

**ආර්. ජේ. ජී. ද මැල් මයා.** (දෙවිනුවර)
*(திரு. ஆர். ஜே. ஜீ. டி மெல்—தெவிநுவர)*
(Mr. R. J. G. de Mel—Devinuwara)
කල්ලතෝනි තවත් ඒවි.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
අපේ රටේ අනාගතය විසඳීම සඳහා ඇති ගිවිසුම වැනසෙන ආකාරයට හරවා ගන්නා නේද? සිංහලයාගේ අනාගතය වැළලෙන තැනට නේද කටයුතු යෙදී තිබෙන්නේ? මුලින් අදහස් කළේ ජාතිය ආරක්ෂා කරන්නටයි. මේ අන්දමට වැඩ කටයුතු ක්‍රියාත්මක වන විට සිදු වන්නේ ජාතිය වැනසීමයි.

අපේ අගමැතිතුමා දේශපාලන වශයෙන් විශාල දර්ශනයක් තිබෙන කෙනෙක්. එතුමා වාගේ තර්ක කරන්නට හැකි කෙනෙක් මේ පාර්ලිමේන්තුවේ නැහැ. එතුමාට පුළුල් දැනුමක් තිබෙනවා. ඒ දවස්වල එතුමා කතා පවත්වන විට මම ඉතින් වැඳගෙන බලා ඉන්නවා. උන්නැහේගේ දේශනාව ගැන—

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ඇයි, දත් වදින්නේ නැත්තේ?

**ආර්. ජී. සේනානායක මයා.**
*(ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
එවැනි දර්ශනයක් තිබෙන කෙනෙක් මෙහෙම කරනවා නම්—අර කාබෙරි ජෝමා කීනියාටාට ඔයිට වඩා කැක්කුමක් තිබුණා ඔය වැඩ කරන විට. ජෝමා කීනියාටා කිව්වා "පලයව්; ගියේ නැතිනම් උඹලට දෙනවා......" කියල. එහෙම තමයි ඉන්දියානු ප්‍රශ්නය විසඳුවේ. ජෝමා කීනියාටා—[බාධා කිරීම්.]



**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ජෝනා නොවෙයි, ජෝමෝ.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
ජෝනා ඉන්නේ මෙහේ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ඔතනයි ඉන්නේ.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
අපේ ජාතියට ඉන්න ජෝනා ඉන්නේ මෙහේ. ජෝනා නොවෙයි, ජෝමෝ. එයා කිව්වා, "මෙහේ උඹලාට ඉන්නට බැහැ; මේක අපේ රට; පලයල්ලා" යනුවෙන්. මෑතකදී නිදහස ලැබූ කාපිරි ජාතිකයන් දිහා බලන්න. ඒ අය ඉතා නූගත්. එම නිසා ඔවුන්ගේ පාලනයේ අනන්තවත් දුර්වලකම් තිබෙනවා. විශ්ව විද්‍යාලයීය අධ්‍යාපනයක් ලැබූ නිලධාරීන් ඒ රටවල හිඟයි. වැඩි උගත්කමක් නැති වුණත් ජාතික කැක්කුමකින් යුතුව කටයුතු කොට ඒ අය තම රටවල් බේරා ගත්තා. එහෙත් අපේ අයගේ උගත්කම නිසා රට වැනසෙනවා. මෙය පුදුම තත්ත්වයක් නොවෙයිද?

ලංකාවට පමණද, ඉන්දියානු ප්‍රශ්නය බල පාන්නේ? ඉන්දියාව සමඟ පැටලී තිබෙන්නේ අප පමණක්ද? "ඉන්දියාව අනෙක් හැම රටක් සමඟම සාධාරණ ලෙස කටයුතු කර තිබෙනවා; ඉන්දියාව සමඟ හැප්පෙන්න කියන්නේ ආර්. ජී. ට පිස්සු" යැයි කියන්නට පුළුවන් තත්ත්වයක් තිබෙනවාද? ඉන්දියාව හා පාකිස්තානය අතර තත්ත්වය කොහොමද? බුරුමය, ටැන්ගනිකාව, නේපාලය, සිකිම්, යන රටවල් සමඟ ඉන්දියාව මේ ප්‍රශ්නයේදී කටයුතු කර ඇත්තේ සාධාරණවද? ඉන්දියාව වෙන කිසිම රටක් සමඟ සාකච්ඡා කර, ගිවිසුම් අත්සන් කොට, ඒ අනුව නියම විධියට කටයුතු කළ අවස්ථා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වක් තිබෙනවා නම් මට පෙන්වන්න. ඉන්දියාව හැම රටකටම කළේ එකක් උඩින් කියා යටින් හොර රහසේ වෙන එකක් කිරීමයි. ඉන්දියාව මෙසේ කටයුතු කිරීම නිසා අවසානයේදී බුරුමයේ ඉවසීම බුරුල් වී පොල්ල අතට ගෙන ඉන්දියානුවන් පැන්නූ බව කථානායකතුමාත් දන්නවා ඇති.

සමහර විට අවිවේකිත්වය නිසා නොයෙකුත් රටවල කෙරෙන එවැනි දේවල් ගැන සොයා බලන්නට අගමැතිතුමාට පුළුවන්කමක් නැතිව ඇති. ඒ හැමෙකක් ගැන සොයා බලන්නට අගමැතිතුමාට කාලයක් නැති වුණත්, එතුමාගේ අමාත්‍යාංශයට පුළුවන්කමක් තිබෙන්නට ඕනෑ. එහෙත් ඒ පිළිබඳ කටයුතු පැවරී ඇති අමාත්‍යාංශය නැත්නම් දෙපාර්තමේන්තුව වීරිය කරන්නේ ඉන්දියානුවන් 3,00,000 කට පුරවැසිකම් දීමට පමණයි. දෙපාර්තමේන්තුව ව්‍යවස්ථා සම්පාදනය කරන්නේ ඒ සඳහා පමණයි. මා කීප විටක්ම එම දෙපාර්තමේන්තුවට දන්වා යවා තිබෙනවා, "අසුවල් තැන කල්ලතෝනින් ඉන්න බවට මට ආරංචි ලැබී තිබෙනවා" යනුවෙන්. එහෙත් ඒ කිසිම අවස්ථාවක මට ඒ සම්බන්ධයෙන් පිළිතුරක්වත් ලැබී නැහැ. එම දෙපාර්තමේන්තුව කටයුතු කරන්නේ ඒ විධියටයි. ඉන්දියානු ප්‍රශ්නය අදට පමණක් බල පාන ප්‍රශ්නයක් නොවෙයි. එය අපේ අනාගතය කෙරෙහිත් විශාල බලපෑමක් කෙරෙන ප්‍රශ්නයක්. එම නිසා ඉන්දියානු ප්‍රශ්නය ගැන මීට වඩා හොඳින් කල්පනා කර බලන්නට ඕනෑ.

අනෙක, අවසාන කාරණය මෙයයි: "රෙසිඩන්ස් පර්මිට්" දික් කිරීමේ ක්‍රමයක් තිබුණු බව කථානායකතුමාත් අගමැතිතුමාත් දන්නවා ඇති. තමන්ගේ කාලය ඉවර වී යන්නට වුණාම රුපියල් 5,000ක් 10,000 ක් දේශපාලන පක්ෂ අරමුදලට දී "රෙසිඩන්ස් පර්මිට්" එක දික් කර ගත් අවස්ථා අනන්තවත් තිබුණා. ආණ්ඩු පක්ෂයේ මැතිවරණ අරමුදල "රෙසිඩන්ස් පර්මිට්" දික් කිරීමෙන් ලබා ගත් මුදල් මාර්ගයෙන් ථර කර ගත් අවස්ථා තිබුණු බව මා දන්නවා. එහෙත් දොම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) ඒ වෙනුවෙන් බද්දක් නියම කළා. "බද්ද නියම විධියට ගෙවන තුරු උඹලාට ඉන්නට පුළුවන්" කියා බදු අය කිරීමේ ක්‍රමයක් එතුමා විසින් ඉදිරිපත් කිරීම නිසා අර පගා ක්‍රමය හුඟක් දුරට නැවතුණා.

මේ රෙගුලාසි අනුව කොමසාරිස්තුමාගේ හිතු මතයට "රෙසිඩන්ස් පර්මිට්" දීමට අවකාශ සැලැසී තිබෙනවා. ඒ පිළිබඳව කිසිම වගකීමක් නැහැ. ඒ "රෙසිඩන්ස් පර්මිට්" දීම සීමා කිරීම සඳහා මෙහි කිසිම රෙගුලාසියක් නැහැ. මට පෙනෙන හැටියට නම් එන වර මැතිවරණය කරන්නට යන්නේ ඉන්දියානු ඡන්ද පමණක් නොව ඉන්දියානුවන්ගේ සල්ලිත් උපයෝගී කරගෙනයි. "ටී. ආර්. පී එක දික් කරගන්නට නම් රුපියල් 5,000 ක් නැත්නම් 10,000 ක් දෙන්නට ඕනෑ" යි කියාවි. ඒ විධියට කටයුතු නොකළොත් යන්නට සිදු වන නිසා ඉන්දියානුවන් තමන්ගේ ටී. ආර්. පී බලපත්‍ර දික් කර නොගන්නා එකකුත් නැහැ.

ඉන්දියාව පුරාම දූෂණය පැතිරී ගොස් තිබෙනවා. ඉන්දියාවට ගිහින් දුම්රියේ ආසනයක් වෙන් කරවා ගන්නට ගියාම දුම්රිය ස්ථානාධිපතිට සුළු පගාවක් දෙන්නට සිදු වන තරම් තත්ත්වයකුයි එහි තිබෙන්නේ. ආසනයක් ගැනීම සඳහාත් ඇනා 6 ක් හෝ 4 ක් දෝ—මා හිතන්නේ ශත 25ක පමණ මුදලක්—ගෙවන්න ඕනෑ. දුම්රිය ස්ථානාධිපති දුම්රිය ළඟට එනවා ඒක ලබාගන්න. ඉන්දියාවෙ පාලන ක්‍රමය ඒ තරමටම දූෂිත වෙලයි තිබෙන්නේ. එම නිසා පගාව දෙනවාය කියන එක ඉන්දියන්කාරයන්ට ඒ තරම් ලොකු දෙයක්වත් පිළිකුලට කාරණයක්වත් නොවෙයි. එය ඔවුන්ගේ ජීවන ක්‍රමයේ කොටසක් බවට පත් වෙලා. කන්න ඕනෑ නම්, බොන්න ඕනෑ නම්, ඒ වාගේම අවශ්‍ය දෙයක් තමයි පගාව දීම. ඒ උදවියට ඒ ගැන කිසිම පිළිකුලක් නැහැ. එහෙත් මා කියන්න කැමතියි, අපේ නිලධාරීන් අතර, අපේ දේශපාලනඥයන් අතර, පොදු වැඩ කරන උදවිය අතර, මේ පගාව ගැන එක්තරා පිළිකුලක් තිබෙනවා. ඉන්දියාවෙ එවැනි පිළිකුලක් නැහැ. ඉන්දියාවෙ පගාව දෙනවාය කියන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

එක ඒ ගොල්ලන්ට බොහොම ලෙහෙසි දෙයක්. එනිසා තාවකාලික පදිංචි බලපත්‍ර ලත් අයගේ කාලය දීර්ඝ කිරීම පිණිස නිලධාරීන්ට බලය දීම මෙවැනි දූෂණ තව තවත් වැඩි වීමට හේතුවක් වෙනවා. ඒ උදවිය පගාවට පුරුදුව තිබෙන කොටසක් නිසා එය ඉතාම භයානක දෙයක්.

අවසාන වශයෙන් කථානායකතුමනි, පුරවැසිභාවය ලබාගන්නට සිටින පිරිස පිළිබඳව වචනයක් දෙකක් කියන්න ඕනෑ. පුරවැසියන් වශයෙන් අප භාර ගන්නා අය මේ රටට ලැදියාවක් ඇති පිරිසක් වශයෙන් අප භාරගන්න ඕනෑ. ඒ පිරිස අපේ ජාතියට ලැදි, ජාතිය ගැන කැක්කුමක් ඇති, අපේ ජාතිය පිළිගන්නා පිරිසක්ද කියා අපි බලන්න ඕනෑ. අපේ දේශපාලන ස්වරූපය, ප්‍රජාතන්ත්‍රවාදය, පිළිගන්නා පිරිසක්ද කියා බලන්න ඕනෑ. අපේ නායකයන්ට ගරු කරන්න පුළුවන් පිරිසක්ද කියා බලන්න ඕනෑ. අපේ නායකයන් ගැන කැක්කුමක්, ගෞරව යක්, ලැදියාවක්, තිබෙන උදවියද කියා බලන්න ඕනෑ.

අලුතෙන් පුරවැසියන් වෙන්නට සිටින අයගේ ගෙවල් දොරවල්වල අද මොන නායකයන්ගේ පින්තූරද තිබෙන්නේ? නේරු, ගාන්ධි, බෝස්, ප්‍රසාද්, යන අයගේ පින්තූරයි අද තිබෙන්නේ. [බාධාකිරීමක්] මාඕ සේතුංගෙ පින්තූරෙ නම් එන එකක් නැහැ. ඒ වාගේම චිත්‍රපටි නළු නිළියන්ගේ—මදුරාසියේ සිටින චිත්‍රපට නළු නිළියන්ගේ—පින්තූර තිබෙනව. අපේ අගමැතිතුමාගේ පින්තූරෙවත් තිබෙන බවක් අපි කවදාවත් දැක නැහැ. වෙනෙකක් තබා තොන්ඩමන් මහතාගේ පින්තූරෙවත් නැහැ.

හොඳයි, ඒත් නැත්නම් අපි හිතමු කම්කරු සංවිධාන හා ඇති සම්බන්ධය ගැන. පසු ගිය දවස්වල සිදු වුණ දේ දැක්කා නොවේද? සිංහල කම්කරුවන් උසි ගන්වා වැඩ වර්ජනයේ යෙදෙව්වා. ඔවුන්ගේ සටන සඳහා සිංහල කම්කරුවනුත් සහභාගි කරගෙන ඔවුන් උසිගන්වා ගෙන වැඩ වර්ජනය කළා. සිංහල කම්කරුවනුත් වැඩි දුර කල්පනා නොකර වර්ජනයට සහභාගි වුණා, ඒ උදවියට සහයෝගය දෙන්න ඕනෑය කියා. අන්තිමට මොකක්ද වුණේ? ඒ කොටස කැල්ල කඩාගෙන වැඩට ගියා. අපේ උදවිය අනාථ වුණා. පේනවා නොවේද එතැනත් මොකද වුණේ කියා.? ජාතියට ලැදියාවක් ඔවුන් තුළ නැහැ. අපේ සංස්කෘතියට ලැදියාවක් ඔවුන් තුළ නැහැ. අපේ දේශපාලනයට ලැදියාවක් ඔවුන් තුළ නැහැ. අපේ කම්කරු සංවිධානවලට ලැදියාවක් ඔවුන් තුළ නැහැ. ඒ තත්ත්වය ඔවුන් තුළ ඇති කර ඔවුන් අපේ පුරවැසියන් වශයෙන් භාරගන්නවා නම් තමයි අපට ඔවුන් පුරවැසියන් වශයෙන් පිළිගන්න පුළුවන්කම ලැබෙන්නේ. එම නිසා, මේ රෙගුලාසි මාලාව සම්මත කර ගැනීමට දඟලන්නේ නැතිව මෙරටින් පිට කරන්නන් සඳහා රෙගුලාසි මාලාවක් සකස් කරගෙන එන ලෙස මා තරයේම බැගෑපත්ව ගෞරවයෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

පූ. භා. 11.30

**ලෙස්ලි ගුණවර්ධන මයා.**

*(திரு. லெஸ்லி குணவர்தன)*

(Mr. Leslie Goonewardene)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය ගැන වචන ස්වල්පයක් කථා කිරීමට මා අදහස් කරනවා. මේ ඉදිරිපත් කර තිබෙන රෙගුලාසි නැත්නම් නියෝග ඉදිරිපත් කර තිබෙන්නේ ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාවට නැඟීමේ) පනත යටතේයි. රෙගුලාසි ගැන කියන්නට පෙර ඇත්ත වශයෙන්ම මේ පනත ගැනත් යමක් කියන්නට සිදු වී තිබෙනවා. ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාවට නැඟීමේ) පනත නමින් ටික කලකට පෙර මේ ගරු සභාව පිළිගත් පනත ඇත්ත වශයෙන්ම ඉන්දු-ලංකා ගිවිසුම ක්‍රියාවේ යෙදවීමේ පනතක් නොව මේ ආණ්ඩුව ගසාගෙන ඇති රහස් ගිවිසුම් හතරෙන් එක ගිවිසුමක් මත ගොඩනඟා තිබෙන පනතක්ය කියන්නට පුළුවන්. සාමාන්‍ය කට කතාවට ඒ ගිවිසුම හඳුන්වන්නේ ඩඩ්ලි-තොන්ඩමන් ගිවිසුම නමිනුයි. ඒ ගිවිසුම ඉන්දු-ලංකා ගිවිසුමට දෙයාකාරයකින් වෙනස් වූ ගිවිසුමක්. මේ සම්මත කරගෙන තිබෙන පනත ඉන්දු-ලංකා ගිවිසුමේ වැදගත් කොන්දේසි දෙකක් උල්ලංඝනය කරමින් වෙනත් කොන්දේසි දෙකක් අනුගමනය කිරීමට නැත්නම් ක්‍රියාවේ යෙදවීමට තැත් කරන පනතක්ය කියා අපට කියන්නට පුළුවන්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පළමුකොටම මතක් කරන්න කැමතියි ඉන්දු-ලංකා ගිවිසුම යටතේ මේ රටේ සිටින ඉන්දියානුවන් තුන් ලක්ෂයකට ලංකාවේ පුරවැසිභාවය දීමට බාරගත්තේ ඉන්දියානුන් 5,25,000 කට ඉන්දියාවේ පුරවැසිභාවය දීම උඩ නොව ඉන්දියානුවන් 5,25,000 ක් මේ රටින් පිට වී යාම පදනම් කොට ගෙනයි. මා මේ අවස්ථාවේ යුක්ති සහගත භාවය ගැන කථා කරනවා නොවෙයි. ඒ ගැන කථාකර ඉවරයි. මා පෙන්වන්නේ මේ ගිවිසුමේ ප්‍රශ්නයයි. ඒ පනතින් ඉන්දු-ලංකා ගිවිසුම එක්තරා වැදගත් ආකාරයකින් උල්ලංඝනය කර තිබෙනවා. එය වැදගත් කරුණක්. ඒ පනත සකස් කර තිබෙන්නේ ඉන්දු-ලංකා ගිවිසුම යන නමින් ඒ රටෙත් මේ රටෙත් අගමැතිවරු දෙදෙනා විසින් අත්සන් කරන ලද ගිවිසුම උඩ නොවෙයි —අත්සන් කළාද නැද්ද කියා මා දන්නේ නැහැ—ඒ කෙසේ වෙතත් ඒ පනත සකස් කර තිබෙන්නේ මේ රටේ අගමැතිතුමාත් තොන්ඩමන් මහතාත් අතර ඇති කරගත් ගිවිසුමක් උඩයි කියා මා කියනවා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
නැහැ.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
නැහැ කියන එක පිළිගන්න අමාරුයි. දවසින් දවස ඔය රහස් ගිවිසුම් එළි වෙනවා. ඔය රහස් ගිවිසුම අත්සන් කළේ අගමැතිතුමා හැටියට නම් නොවෙයි. එක්සත් ජාතික පක්ෂයේ සභාපති හා නායකයාත් වෙල්වනායගම් මහතාත් අතර ඇතිකරගත් ගිවිසුමක් උඩයි මේ ආණ්ඩුව පිහිටෙව්වේ. පළමුවැනි ගිවිසුම ඒකයි. ඊට පසුව අපට පෙනී ගියා ඉන්දු-ලංකා ගිවිසුම වෙනුවට අගමැතිතුමා තොන්ඩමන් මහතා සමග දෙවැනි ගිවිසුමක් ගසාගෙන තිබෙන වාය කියන එක. තුන්වැනි ගිවිසුම ඊයේ පෙරේද අනාවරණය වුණා. ඒ ගරු අගමැතිතුමාත් ගරු රාජ්‍ය ඇමතිතුමාත් යන දෙදෙනාම එක් වී කතෝලික සභාව සමග ගසාගෙන තිබෙන ගිවිසුමයි. හතරවැනි ගිවිසුම තවම එළිවුණේ නැහැ. හතරවැනි ගිවිසුම ලංකාණ්ඩුව අමෙරිකන් අධිරාජ්‍යවාදීන් සමග—සී. අයි. ඒ. එක සමග—ගසාගෙන තිබෙන ගිවිසුමයි. ඒ ගිවිසුම තවම එළිවුණේ නැහැ. 1970 වනතුරු මේ ආණ්ඩුව පැවතුණොත් ඒකත් එළිවේවි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
1970 වන තුරු පවතින එක සත්‍යයි.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
එහෙනම් 4 වැනි ගිවිසුමත් එළිදරව් වෙනවා ඇත කියා මා විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, ඉන්දු-ලංකා ගිවිසුම උල්ලංඝනය කරමින් අලුත් කොන්දේසි පනතට ඇතුළත් කර තිබෙන වාය කියා මා පෙන්වා දුන්නා. ඉන්දියානුවන් තුන් ලක්ෂයකට ලංකා පුරවැසි භාවය දෙනු ලබන්නේ ඉන්දියානුවන් 5,25,000 ක් මේ රටින් පිට වී යන විට නොව ඒ 5,25,000 ක් දෙනාම මේ රටේ සිටිද්දීයි. ඒ ඉන්දියානුවන්ට ලංකාවේ පුරවැසි භාවය නොලැබෙනු විය හැකියි. එහෙත් එක් කොන්දේසියක් උල්ලංඝනය කර තිබෙන බව එයින් පෙනෙනවා.

මේ ගිවිසුමේ තවත් එකක් තිබෙනවා. එය දැනටමත් උල්ලංඝනය කර තිබෙනවා යයි තවම මට කියන්නට බැහැ. ඒ ගැන මට සැකයි. කොයි පිළිවෙලටද මේ 5,25,000 ක් දෙනා ඉන්දියානු පුරවැසි භාවය ලබා ගන්නේ ?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ඇයි, ලැයිස්තුවක් තිබෙනවා නොවැ.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
ගරු අගමැතිතුමාගෙන් සිදු විය යුතු කරුණු කිහිපයක් තිබෙනවා. ඒවා සිදු වුණාට පස්සේ අවසාන වශයෙන්


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

5,25,000 තෝරන්නේ කොහොමද? ගරු අගමැතිතුමාටයි අවසාන වශයෙන් තෝරන්නට සිද්ධ වන්නේ. තුන් ලක්ෂයක් දෙනා තෝරන්නට සිද්ධ වන්නේත් ගරු අගමැතිතුමාටයි. තුන් ලක්ෂයක් දෙනාට වැඩි සංඛ්‍යාවක් ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළොත් අගමැතිතුමාට එයින් තුන් ලක්ෂයක් දෙනා තෝරන්නට සිද්ධ වෙනවා. තුන් ලක්ෂයක් දෙනකුට වැඩි පිරිසක් ඉල්ලුවොත් ඒ පිරිසෙන් තුන් ලක්ෂයක් දෙනා තෝරන්නේ කොයි ආකාරයකට දැයි අපටවත් කාටවත් තවම කියා නැහැ. හැබැයි, මීට පෙර පැවැති ආණ්ඩු යටතේ නම් යම්කිසි වැඩ පිළිවෙලක් තිබුණා. එය ඇත්ත තමයි. ගිවිසුමේ සඳහන් වී නැති නමුත් ආණ්ඩු දෙක අතර නිලධාරීන්ගේ මාර්ගයෙන් ඇති වූ සාකච්ඡාවලදී නම් මේ තුන් ලක්ෂයක් දෙනා තෝරා ගන්නට අප බලාපොරොත්තු වන්නේ මෙන්න මේ ආකාරයටය කියන එක හොඳට සඳහන් වෙලා තිබුණා.

ඉන්දු-ලංකා ගිවිසුම ක්‍රියාවට නැඟීමේ පනත පිළිබඳ දෙවැනි වර කියැවීමේ විවාදය මේ ගරු සභාවේදී පැවැත්වුණු අවස්ථාවේදී ඒ හා සම්බන්ධ ලිපි සියල්ලක්ම පාගේ කියවා දැන් **හැන්සාඩ්** වාර්තාගත වී තිබෙනවා. මෙකී ගිවිසුමට අගමැතිවරුන් විසින් අත්සනුත් තබනු ලැබීමෙන් පසු 1964 දෙසැම්බර් මාසයේ මැද හරියේදී පමණ ඉන්දීය ආණ්ඩුවේ නියෝජිත පිරිසක් ලංකාවට පැමිණ ලංකාණ්ඩුවේ නියෝජිත පිරිසකුත් සමග මේ ගිවිසුම ක්‍රියාවේ යොදවන ආකාරය පිළිබඳව යම්කිසි සාකච්ඡා වගයක් ඇති කර යම්කිසි වැදගත් තීරණයකට පැමිණෙන්නටත් පුළුවන් වුණා. තීරණයකට පැමිණෙන්නට පුළුවන් වූ කාරණාත් තීරණයකට පැමිණෙන්නට බැරි වූ කාරණාත් ගැන සඳහන් වූ ලියවිල්ලක් තිබෙනවා. එය මෙහිදී කියවනු ලැබුවා. ඒකත් දැන් **හැන්සාඩ්** වාර්තාගත වී තිබෙනවා. තුන් ලක්ෂයකට වැඩි පිරිසක් මේ රටේ පුරවැසි භාවය ඉල්ලා සිටියොත් එයින් අවශ්‍ය වන තුන් ලක්ෂයක් දෙනා තෝරා ගත යුතු ආකාරයත් එහි සඳහන් වී තිබෙනවා. මම ඒවා සඳහන් කරන්නම්.

මේ රටේ උපන් ඉන්දියානුවකු ගැන විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුය යන්න පළමුවැන්නයි. එවැනි ඉල්ලුම්පත්‍ර වලට ප්‍රමුඛත්වයක් දිය යුතුයි. ඒ වාගේම තවත් කාරණයක් තිබෙනවා. මීට පෙර ලංකා පුරවැසි භාවය ඉල්ලා තිබෙනවාද යන්නයි, ඒ. මීට පෙර ලංකා පුරවැසි භාවය ඉල්ලා එය නොලත් කෙනකු දැන් පුරවැසි භාවය ඉල්ලා සිටියොත්, ඒ ගැනත් විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුයි. එය විශේෂ සුදුසුකමක් හැටියට සලකනවා. ඒ ගැන එකඟත්වයක් ඇති වුණා. දෙවැනි කාරණයයි ඒ. තුන්වැනි කාරණයකුත් තිබෙනවා. පුරවැසි භාවය ඉල්ලුම් කළ තැනැත්තාට මේ රටේ නෑදෑයන් ඉන්නවාද යන්නයි ඒ ප්‍රශ්නය. පුරවැසියන් වන අය තමන්ගේ නෑදෑයන් හැටියට පිළිගැනෙන උදවිය විසින් කරන ලද ඉල්ලීම් ගැනත් විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුයි. මේ රෙගුලාසි දෙස බලන විට ඒ ගැන කල්පනා කර තිබෙන බව පෙනී යනවා. ඒ ගැන මා දැන් සන්තෝෂ වෙනවා.

"ඊ" ආකෘති පත්‍රයේ මේ කාරණය පිළිබඳව ප්‍රශ්න අසා තිබෙනවා. ඉන්දියානුවකු ලංකා පුරවැසි භාවය ඉල්ලමින් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන අවස්ථාවේදී ඔහුට "ඊ" ආකෘති පත්‍රය පිරවීමට සිද්ධ වෙනවා. ඒ අනුව මේ මා සඳහන් කළ කාරණා ගැන තොරතුරු සපයන්ට බැඳී සිටිනව. මේ නියෝගවල 12 වෙනි පිටුවේ "ඉ" අකෘති පත්‍රයේ 6 වෙනි කොටුවේ මේ අන්දමට සඳහන් වෙනව:

6. උපන් ස්ථානය:

උපත සිදුවූයේ ලංකාවෙහි නම්, එම නගරයේ, ගමේ හෝ වත්තේ නම සඳහන් කරන්න. උපත සිදුවූයේ ඉන්දියාවෙහි නම්, එම ගමේ හෝ නගරයේ තලුකයේ හා දිස්ත්‍රික්කයේ නම ඔබ දන්නා පමණින්, සඳහන් කරන්න.

ඒ යටතේ ලංකාවේ උපන් කෙනෙක්ද නැද්ද කියා සොයා ගන්න පුළුවන්. ඒ වගේම 17 වෙනි කොටුවේ මේ විධියට තිබෙනව:

17. (1) ඉන්දියානු සහ පකිස්තානි පදිංචිකරුවන්ගේ (පුරවැසි) පනත යටතේ හෝ පුරවැසි පනත යටතේ ඔබ ලංකාවේ පුරවැසිභාවය සඳහා ඉල්ලුම් කෙළෙහිද?

ඔබ ඉල්ලුම් කර ඇති නම්—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ පිළිබඳ විස්තර අසා තිබෙනව. මීට පෙර පුරවැසි භාවය ඉල්ලුම් කර තිබෙන වාද යන්න ඒ ඡේදයෙන් සොයා ගන්න පුළුවන්. ඒ වගේ ම එහි 11 වෙනි කොටුවේ (ඉ) ඡේදයේ මේ විධියේ විස්තර අහනවා:

(ඉ) භාර්යාව/ස්වාමිපුරුෂයා ලංකාවේ පුරවැසි භාවය ලබා ඇත්තේ පරම්පරාවෙන් ද එසේ නැත හොත් ලියාපදිංචි කිරීමෙන් ද? ලියාපදිංචි කිරීමෙන් නම්, පුරවැසි භාවය පිළිබඳ සහතික පත්‍රයේ අංකය හා දිනය සඳහන් කරන්න:

ගරු කථානායකතුමනි, 18 වෙනි කොටුවෙන් මේ විස්තර අසා තිබෙනවා:

18. ඔබේ සොහොයුරන් හා සොහොයුරියන් පිළිබඳව පහත දැක්වෙන විස්තර සපයන්න:

නම, ලිපිනය, ලංකාවේ පුරවැසියෙක්ද යන බව ආදි විස්තර එහි අසා තිබෙනව. ලංකාණ්ඩුවේ නිලධාරිනුත්, ඉන්දිය ආණ්ඩුවේ නිලධාරීනුත් අතර 1964 දෙසැම්බර් මාසයේ මැද හරියේදී ඇති වූ සාකච්ඡා වල ප්‍රතිඵලයක් වශයෙන් එළඹුණු තීරණ අනුව පුරවැසි භාවය දීමේදී ක්‍රියා කරන්ට ගරු අගමැතිතුමාට පුළුවන්කම තිබෙනව. ඒ අනුව ක්‍රියා කරනව නම් ඇත්තෙන්ම අපට එය තේරුම් ගන්ට පුළුවන්. එහෙත් අපට ප්‍රශ්නයක්ව තිබෙන්නෙ ඒ කොන්දේසි අනුව, ඒ ප්‍රමුඛතා අනුව අගමැතිතුමා පුරවැසි භාවය දෙන බව මේ දක්වා කියා නැති එකයි. මුල් පනතේ දෙවෙනි වර කියවීමේ විවාදයේදී පුළුවන් නම් අගමැතිතුමාගෙන් ඒ විධියේ පොරොන්දුවක් ලබා ගන්ට අපි හුඟක් උත්සාහ කළා. එහෙත් අපට ඒවා ලැබුණෙ නැහැ. එසේ නොලැබීමෙන් අපේ හිත්වල පැවති සැකය තවදුරටත් තහවුරු වුණා. ඒ සැකය නම් තොන්ඩමන්ගේ දෙවෙනි කොන්දේසිය වුණේ පුරවැසියන් තෝරන විට මේ සඳහන් කළ එකම සුදුසුකමක්වත් උඩ නොව තොන්ඩමන් මහත්මයා අගමැතිතුමාට දෙන ලැයිස්තුවක් අනුව පුරවැසිභාවය සඳහා වැසියන් තෝරා ගැනීම බවයි. ඒ නිසා ඩඩ්ලි-තොන්ඩමන් ගිවිසුමේ දෙවෙනි කොන්දේසිය අපට තහවුරු වුණා කියා ප්‍රකාශ කරන්ට සිදු වී තිබෙනවා. ඉන්දියානු හා ලංකා නියෝජිතයන් පැහැදිලිව තීරණය කළේ හිතු මනාපයට නොව කලින් සඳහන් කළ සුදුසුකම් උඩ පුරවැසි භාවය දෙන්ට සුදුසු පුද්ගලයන් තෝරා ගත යුතු බවයි. පළමු කොටම මේ රටේ උපන් කෙනෙක්ද, දෙවනුව මීට පෙර පුරවැසිභාවය ඉල්ලා තිබෙනවද, තුන්වෙනුව පුරවැසිභාවය තිබෙන නෑදෑයින් මේ රටේ සිටිනවාද, කියන කාරණා තුන උඩයි පුරවැසි භාවය සඳහා මිනිසුන් තෝරා ගැනීම සුදුසු යයි පිළිගෙන තිබුණෙ. මේ 3,00,000 එසේ තෝරා ගැනීමට මේ දෙරටේ නිලධාරීන්ගේ සාකච්ඡාවක් පවත්වා තීරණය කරගෙන තිබුණා පමණක් නොව ඉන් පසුව ඒ මාසය ඉකුත්ව යන්ට පෙර ලංකාණ්ඩුවත් ඒ තීන්දුව අනුමත කළා. ඒ වාගේම ඉන්දීය ආණ්ඩුවත් ඒ තීන්දුව අනුමත කළා. එතකොට එය ගිවිසුමේ කොටසක් නොවුණත් ඒ ගිවිසුම අනුව වැඩ කරගෙන යෑමේදී ආණ්ඩු දෙක විසින්ම ඇති කර ගන්නා ලද එකඟත්වයක් යයි අපට කියන්නට පුළුවනි. එහෙත් අපට පෙනෙන හැටියට නම් ඩඩ්ලි-තොන්ඩමන් ගිවිසුමෙන් ඒ කාරණා වෙනස් කිරීමට අදහස් කරනවා. "මේ අයට පුරවැසිකම දිය යුතුයි" යනුවෙන් කියමින් තොන්ඩමන් මහතා යම්කිසි ලැයිස්තුවක් ඉදිරිපත් කළ විට, පනත යටතේ අපේ අගමැතිතුමාට එසේ කිරීමට ඉඩ තිබෙනවා. එසේ හෙයින් ඒ පනත යටතේ පනවන්නට යන රෙගුලාසි හෙවත් නියෝග පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී අපේ අගමැතිතුමා ඒ ප්‍රශ්නයට පිළිතුරක් දෙන්නට ඕනෑ.

මම නැවත ඒ ප්‍රශ්නය කෙටියෙන් මතක් කරන්නම්. තුන් ලක්ෂයක් දෙනාට වඩා පිරිසක් ලංකා පුරවැසිකම ඉල්ලන්නට යනවා. එහෙම නම් පුරවැසිකම දියයුතු තුන් ලක්ෂය තෝරන්නේ කොහොමද? කවුද තෝරන්නේ? මොන ප්‍රතිපත්තිය උඩද? 1964 දෙසැම්බර් මාසයේ මැද හරියේදී ඉන්දියානු ආණ්ඩුවේ සහ ලංකා ආණ්ඩුවේ නිලධාරීන් එකතු වී සම්මත කර ගත් ප්‍රතිපත්තිය අනුව ඒ අය තෝරා ගන්නවාද? එසේ නැත්නම් තොන්ඩමන් මහතා කියන විධියට ඒ අය තෝරා ගන්නවාද? ඔය කාරණය ගැනයි, අපට දැන ගන්නට වුවමනා කරන්නේ. මගේ කල්පනාවේ හැටියට නම් පුරවැසිකම දීම සඳහා පුද්ගලයන් තෝරා ගැනීමේදී පළමුවැනි සුදුසුකම් හැටියට සැලකිය යුත්තේ ඒ පුරවැසිකම ඉල්ලන පුද්ගලයා ලංකාවේ උපන්


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නකුද යන්න ගැනයි. මේ රටේ නූපන් කෙනකුට වඩා මේ රටේ උපන් කෙනකුට පුරවැසිකම ඉල්ලීම සඳහා යුක්තිසහගත අයිතියක් තිබෙනවා. මගේ මතයේ හැටියට පුරවැසිකම දීම සඳහා පුද්ගලයන් තෝරා ගන්නා විට ඊළඟට බැලිය යුත්තේ පුරවැසිකම ඉල්ලන පුද්ගලයාගේ භාර්යාව, සහෝදර සහෝදරියන් යනාදී නෑදෑයන් මේ රටේ පුරවැසිකම ලබාගෙන සිටින වාද යන්න ගැනයි. තුන්වැනිව සලකා බැලිය යුත්තේ පුරවැසිකම ඉල්ලන තැනැත්තා මීට කලින් ඒ සඳහා ඉල්ලුම් කර තිබේද යන්න ගැනයි. 1947 ලංකා පුරවැසි පනත යටතේ පුරවැසිකම නොලැබූ තැනැත්තකුදැයි සලකා බලන්නට ඕනෑ. හතර වැනි කාරණයකුත් අවශ්‍ය නම් කොපමණ කාලයක් තිස්සේ ලංකාවේ පදිංචි වී සිටි කෙනකුදැයි විමසා බලන්නට පුළුවනි. එහෙත් ඒ තරම් දුර යන්නට වුවමනාදැයි මං දන්නේ නැහැ.

කෙසේ වුවද, මෙම ගරු සභාවේ රීතිවලට ගරු කරමින් නිතර කථා කරන කෙනකු වශයෙන්, ඇත්ත වශයෙන් මේ රෙගුලාසි යටතේ පනතේ ප්‍රතිපත්ති සාකච්ඡා කරන්නට අයිතියක් නැති බව මා දන්නවා. ඒ නිසා දැන් ඒ පනත ගැන විවේචනය කරන්නට මං ඉදිරිපත් වන්නේ නැහැ. මා නැවතත් අහන්නේ මේ ප්‍රශ්නයයි. තුන් ලක්ෂයක් දෙනා තෝරා ගන්නේ කොහොමද? ඩඩ්ලි—තොන්ඩමන් ගිවිසුම අනුව මේ තුන් ලක්ෂයක් දෙනා තෝරා ගන්නට යන බවට මතයක් තිබෙනවා. මාත් ඒ මතය දරනවා. ඒ නිසයි, මේ ප්‍රශ්නය නගන්නේ. තොන්ඩමන් මහතාට වුවමනා ආකාරයට තුන් ලක්ෂයක් දෙනාට පුරවැසිකම දීම ඩඩ්ලි—තොන්ඩමන් ගිවිසුමේ දෙවැනි කොන්දේසියයි. [බාධා කිරීමක්] පනත දෙවැනි වර කියැවීමේ විවාදයේදී මේ ඉහතින් නැඟූ ප්‍රශ්නයට පිළිතුරක් ලබා ගන්නට උත්සාහ කළා. එහෙත් පිළිතුරක් ලැබුණේ නැහැ. ඒ නිසා අප තුළ සැකයක් ඇති වුණා. ඒ සැකය දුරු කිරීමට නම් අගමැතිතුමා පිළිතුරු දෙන අවස්ථාවේදී කරුණාකර ඔය ප්‍රශ්නයටත් පිළිතුරු දෙන්න. තොන්ඩමන් මන්ත්‍රීතුමා හෝ වෙන කවුරුන් හෝ දෙන ලැයිස්තුවක් අනුව නොව, 1964 අවුරුද්දේ දෙසැම්බර් මාසයේ මැද හරියේදී ඉන්දියානු ආණ්ඩුවේත් ලංකාණ්ඩුවේත් නියෝජිතයින් රැස්වී මෙන්න මේ විධියට තමයි ප්‍රමුඛතා ලැයිස්තුවක් සාදා පුරවැසිභාවය දිය යුත්තේ කියා ඒ එළඹුණු තීරණවලට අනුකූලව පුරවැසිභාවය ප්‍රදානය කරන අයවළුන් තෝරනවාය යන පොරොන්දුව අගමැතිතුමා මේ ගරු සභාවට දිය යුතුයි. එහෙම කොන්දේසි නැත්නම් අගමැතිතුමා ඒ පොරොන්දුව දිය යුතුයි.

ඒ ප්‍රමුඛතා ලැයිස්තුව පිළියෙළ කළ යුත්තේ කුමන කරුණු පනදම් කරගෙනද යන්න ගැන මං නැවතත් මතක් කරන්නට සතුටුයි. දෙරටේ ආණ්ඩු දෙකේ නියෝජිතයින් රැස්වී අනුමත කර ගත් කොන්දේසි කිහිපයක් තිබෙනවා. පළමු කොටම ඔහු මේ රටේ උපන් කෙනෙකුද කියා බැලිය යුතුයි. තුන්වනුව ඔහුට මේ රටේ නෑදෑයන්, සහෝදර සහෝදරියන් සිටිනවාද කියා බැලිය යුතුයි. ඔහුගේ හෝ ඇයගේ භාර්යාව හෝ පුරුෂයා හෝ ලංකා පුරවැසියකුද කියා බැලිය යුතුයි. අන්න ඒ කොන්දේසි අනුව ප්‍රමුඛතා ලැයිස්තුව සාදා පුරවැසිභාවය ඉල්ලන අයට පුරවැසිභාවය දිය යුතුය කියායි 1964 අවසානයේදී දෙරටේම නියෝජිතයින් රැස්වී තීරණය කළේ. අන්න ඒ තීරණ අනුව මේ තුන් ලක්ෂය තෝරනවාද නැත්නම් තොන්ඩමන් මහත්මයාගේ හෝ වෙනත් කෙනෙකුගේ ලැයිස්තුවක් අනුව මේ අය තෝරනවාද යන ප්‍රශ්නයට අගමැතිතුමා තම පිළිතුරු කථාවේදී උත්තරයක් දෙනවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

පූ. භා. 11.52

**පී. ජී. බී. කෙනමන් මයා.** (මැද කොළඹ තුන්වන මන්ත්‍රී)

*(பி. ஜி. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்றாம் அங்கத்தவர்)*

(Mr. P. G. B. Keuneman—Third Colombo Central)

Mr. Speaker, I do not intend to take long. I wish to confine myself to three matters. The essence of the agreement, which is the basis of both the Bill and the regulations, is that Ceylon and India are going to undertake certain obligations which should

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

be carried out more or less simultaneously. We shall being a process of registration of persons as citizens of Ceylon, and India will accept a number of persons as citizens of India.

I am not going to canvass again the main question that was fought out at the time of the Second Reading, namely, whether the proportion of persons who become Ceylon citizens should be based on the number of people who become Indian citizens or the number of people who actually, physically, are repatriated. That matter has been debated and decided upon. I do not want to canvass that again. I shall stick strictly to the regulations. But even under the present regulations there is an onus on the Government of India to accept persons as Indian citizens, and it is presumably only after that that such persons will be placed on the register of those who await repatriation to India.

It seems to me, and I speak subject to correction, that there is a lot of activity on our part to fulfil our obligation under this agreement, but I do not see a corresponding activity on the part of the Government of India. As soon as these regulations are passed persons will make applications to become citizens of Ceylon and the process of their becoming citizens of Ceylon will start. The Hon. Prime Minister is aware that during the Committee stage of the Bill as well as during the Second Reading, the question was raised as to how the Government of India is going to grant citizenship to persons, particularly if those persons do not apply to be citizens of India. Various sections of the Indian Constitution were read out. I do not want to go into all that. But at that time too we wanted to know from the Government whether they are satisfied that corresponding steps are being taken by the Government of India to fulfil their obligation under this Bill. I do not raise this because I distrust the Government of India or anything like that. But the registration of persons as citizens of Ceylon and the registration of persons as citizens of India who await repatriation must go forward simultaneously and in accordance with the accepted proportions. That is the underlying theme of both the Bill and the original agreement. We have no information on what the Government of India has done. I would like to know from the Hon. Prime Minister whether, while we are going ahead with honouring our obligation, he is satisfied that the Government of India is also proceeding to take appropriate steps in regard to this matter. I cannot say that I study everything that is passed by the Lok Sabha in India. But I am not aware of any recent legislation in India to give the Indian Government the powers to fulfil its obligation under this agreement. It may be that they do not intend to proceed by way of legislation; maybe they want to act administratively. But let us know what the situation is. That is my first point.

The second point is a matter to which I referred both in the Second Reading of the original Bill and in the Committee stage. You remember that I urged that, in addition to a register of persons who become citizens of Ceylon and a register of those who become citizens of India and await repatriation, we should start with a main register of persons to whom the Act applies. At that time the Hon. Prime Minister said that that is a matter that could be considered when the regulations are introduced. Now we have the regulations but, unfortunately, they do not speak about that mater at all. These regulations really fall into two parts. On the one hand they describe all the processes by which people can become citizens of Ceylon under the Act, and on the other, the processes by which a person becomes a citizen of India and enters the register of those who are awaiting repatriation. The necessary documents which have to be filled for these purposes are also included in the regulations. It seems to me that we may run into many difficulties unless we determine in the first instance who are the persons to whom this Act applies. This is a matter which we

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

can do on our own without even waiting for the Government of India. In fact, all this time we could have asked the people concerned to apply, and then prepared a basic register of those to whom this Act applies in our opinion, and then started separating them. There is absolutely no indication that the Government intends to act in that way. I think that is a major omission in these regulations—the lack of such a main register of those to whom the Act applies.

My third point is this. I want to emphasize a matter that has been referred to by the hon. Member for Panadura (Mr. Leslie Goonewardene). I think it is very necessary that there should be a clear indication of the priorities which the Government intends to be guided by in granting citizenship of Ceylon. Under the original Citizenship Act it was possible to grant distinguished citizenship to 25 persons a year. That was done at the discretion of the Prime Minister, but even there certain directions were laid down by law that the persons concerned should be eminent in certain ways. Of course, that was observed more in the breach than in fact and, as a result, we had a number of rather unfortunate choices and one or two good ones also.

ගරු ඩඩ්ලි සේනානායක
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

No unfortunate choices by me.

කෙනමන් මයා.
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

You were not prepared even to put your hand on it: you were so frightened by what had happened in the past that you would rather not touch the matter. That is a matter that involved only 25 persons, but here is a matter which concerns 300,000 persons. It is very necessary that we should have a very clear direction as to certain objective tests which should be fulfilled by applicants in order to gain priority in acceptance as citizens of Ceylon. I am not saying that you should be bound to accept every person who fulfils such tests. But other things being equal, those who satisfy such objective tests should be the persons who will get priority. We had an experience when it came to applications under the original Act, the Indian and Pakistani Residents (Citizenship) Act. I think nearly 700,000 people who applied to be citizens of Ceylon or whose names were included in the applications did not get selected. Presumably the majority of them are still here and they have not died.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! The Sitting is suspended till 2 P.M. On resumption the Hon. Deputy Speaker will take the Chair.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවනු ලැදින්, අ. භා. 2 ට නියෝජ්‍ය කථානායකතුමාගේ [ශ්‍රීමත් රසීක් ෆරීඩ්, ඕ.බී.ඊ.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

இதன்படி அமர்வு பி. ப. 2 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. உபசபாநாயகர் [ஸ்ரீமான் ருசீக் பரீத், ஓ.பி.ஈ.] தலைமை தாங்கினார்.

*Sitting accordingly suspended till 2 P.M. and then resumed,* MR. DEPUTY SPEAKER [SIR RAZIK FAREED, O.B.E.] *in the Chair.*

කෙනමන් මයා.
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

Mr. Deputy Speaker, when we adjourned for lunch, I was on the point that it is necessary to establish some guiding lines and priorities when it comes to deciding who should be selected as citizens of Ceylon.

It is quite clear that this is a matter that has been engaging the attention of the two Governments, especially our own Governments—the previous Government and the present Government. There was provision made for it in some of the earlier discussions between officials. Experience has shown that we are likely to get applications for citizenship in respect of more than 300,000

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

people. There is some doubt whether 525,000 people will apply to be repatriated to India, but there is no doubt whatsoever that we are going to get more applications from persons for citizenship of Ceylon than can be granted in terms of the Act which this House has passed. Therefore it becomes necessary that we establish some form of priorities, some directions, as to who should be chosen.

Quite apart from the questions of political patronage and bribery and various other matters that have been referred to by earlier speakers, there is the question that once we have decided to admit 300,000 as new citizens of Ceylon, we should also be deeply concerned to see that the most deserving, the most worthy of them, are those who are selected.

I know that in all these matters the final discretion will have to lie in somebody and if necessary the Minister himself. But basically there should be certain tests laid down. The agreement reached between officials, namely, between Mr. N. Q. Dias, who was then the Permanent Secretary to the Ministry of Defence and External Affairs of Ceylon, and Mr. Jha on behalf of the Indian side, sets out some of these conditions, and I think they are on the whole quite fair ones.

This matter was referred to, in passing, by the hon. Member for Panadura (Mr. Leslie Goonewardene). Perhaps you will allow me to refresh the minds of hon. Members as to what was agreed upon. I shall read from HANSARD of the 5th February 1967, column 558. The hon. Member for Dompe (Mr. F. R. Dias Bandaranaike) on that occasion read out the entire agreement between the two officials which was subsequently ratified by the two Governments. Section 4 reads as follows :

"The Ceylon Government in their public notices inviting applications will indicate the various factors to be taken into consideration in the conferment of their citizenship, such as—

(i) whether person had applied for or had been included in an application for Ceylon citizenship under the Indian and Pakistani Residents (Citizenship) Act of 1949 and had not been accepted for citizenship ;

(ii) whether a person was born in Ceylon ;

(iii) the period of an applicant's residence in Ceylon ;

(iv) whether the applicant is a member of a family, some of whose members are citizens of Ceylon by descent or registration.

The Ceylon Government while desirous of giving preference to those who had originally applied for Ceylon citizenship, would also be prepared to consider applications from other persons."—[OFFICIAL REPORT, 5th February 1967 ; Vol. 71 ; c. 558].

I must say I went through the form of application which is prescribed in this regulation, and I find there is provision to get the information which is referred to in this section.

I should like to know from the Hon. Prime Minister whether it is his intention as Prime Minister to issue instructions that, in the disposal of an application, consideration should be given to what is set out here. There are a number of cases which deserve such attention. There are a number of persons who did not get citizenship of Ceylon under the Indian and Pakistani Residents (Citizenship) Act for technical reasons.

I know the case of a young man whose father, mother and younger brothers and sisters were all registered as citizens of Ceylon but he could not be registered for the simple reason that he happened to be a couple of days over 21 years old. As he was at that time studying abroad he could not make an application on his own behalf. Now for nearly 20 years he does not know whose citizen he is and he continues to live in this country. There a number of cases like that in this country where for technical reasons a person could not get citizenship.

I should like to urge the Prime Minister to make a statement that he will give directions that these matters should be taken into consideration,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

and other things being equal preference should be given to people of this kind.

All those who applied the last time for citizenship demonstrated a desire to be citizens of Ceylon. Certainly those people deserve consideration and those people born in Ceylon should have equally strong claims for citizenship.

You will recall that under the Indian and Pakistani Residents (Citizenship) Act strict qualifications were laid down and persons had to qualify. They had to show proof that the Act applies to them and so forth and their applications were minutely scrutinized. Large numbers of persons had their applications for citizenship rejected because they failed to conform to one or more of these qualifications.

In these regulations we do not have a single qualification laid down. I understand that. The reason is obviously that we cannot guarantee that every person who qualifies will be accepted as a citizen because there is a limit of 300,000 fixed. Otherwise, you may have more than 300,000. There should be some objective test by which we can ensure that the best people and the most suitable persons are the ones who will get citizenship of Ceylon.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The Hon. Prime Minister.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

Mr. Deputy Speaker——

**ඩබ්ලිව්. ඒ. ධර්මදාස මයා.** (පැල්මඩුල්ල)
*(திரு. டபிள்யு. ஏ. தர்மதாச—பெல்மதுல்ல)*
(Mr. W. A. Dharmadasa—Pelmadulla)

නැගී සිටියේය——

*எழுந்தார்—*

*rose—*

නියෝග

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

I am sorry, the hon. Member for Pelmadulla rose late.

අ. භා. 2.10

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ව්‍යවස්ථාවන් ගැන මෙතෙක් වේලා සෑහෙන විවාදයක් පවත්වා ගෙන යාම ගැන මා ඉතාමත්ම සන්තෝෂ වෙනවා. නමුත් මීට ප්‍රථමයෙන් කථා කළ සමහර විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කථා ගැන කල්පනා කර බලන විට අපට ඒ තරම් සතුටු වෙන්න බැහැ. මම කියන්නෙ නැහැ සියලුම මන්ත්‍රීවරුන්ගේ කථා ඒ විධියය කියා. අපේ සමහර මන්ත්‍රීවරුන් කථා කරන්න යෙදුනේ මේ ව්‍යවස්ථාවන් ගැන නොව, සමහර විට මුල් පනත ගැනත්, ඒ හැරෙන විට ඊට පිටස්තර කරුණු ගැනත්ය. හාල් පටවා ගෙන් ඉන්දියාවට යන ආකාරය ආදී නොයෙකුත් අන්දමේ මේ ව්‍යවස්ථාවන්ට නොගැළපෙන කරුණු රාශියක් ගැන කථා කරන්න යෙදුනා. සමහර උදවිය මේ ව්‍යවස්ථාවන් ගැන කරන සාකච්ඡාව රජයට විරුද්ධව යම් පහරක් ගැසීමේ මාධ්‍යයක් කර ගන්න සූදානම් වුණා. මේ මගින් රජයට විරුද්ධව රට පුරා ප්‍රචාරයක් ගෙන යන්න සූදානම් වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේට හොඳට මතක ඇති, මුල් පනත ගැන උදේ සිට රාත්‍රිය වන තෙක් පැය ගණනාවක් තිස්සේ මේ ස්ථානයේදී විවාද කරන්න යෙදුන බව. එදා ඉදිරිපත් කළ කරුණු කිහිපයක්ම නැවතත් අද සහ ඊයේ මේ ස්ථානයේදී ඉදිරිපත් කරන්න යෙදුනා. මා ඒ සියල්ලටම පිළිතුරු දෙන්න යන්නේ නැහැ. නමුත් සමහර දේවල් ගැන යම් පිළිතුරක් දීම අවශ්‍යයයි මා සිතනවා. මේ රෙගුලාසි ගැන දීර්ඝ ලෙස කථා කරන්න යෙදුන අපේ මහ කළු සිංහල වීරයා—දැන් නම් ආසනයේ නැහැ—ඔහුගේ කථාව අවසාන කරමින් මෙම ක්‍රියා පටිපාටියෙන් සිංහලයාට වන ද්‍රෝහිකම ගැන පැහැදිලි කර දුන්නා. ඒ මන්ත්‍රීතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගේ කථාව පවත්වා ගෙන යන විට මා කල්පනා කළේ ඔහු විරුද්ධත්වය ප්‍රකාශ කළ යුතුව තිබුණේ මේ ගිවිසුමට බවයි. මගේ පියා අගමැතිව සිටින කාලයේදී යම් පනතක් ඉදිරිපත් කිරීමෙන් නම් කිහිප යක් ඡන්ද ලැයිස්තුවලින් අස් කර දමන්න යෙදුනාය නමුත් දැන් අපි නැව තත් නම් කිහිපයක් එම ලැයිස්තුවලට ඇතුළත් කරන්න සූදානම් වෙනවාය කියා ඒ මන්ත්‍රීතුමා කිව්වා. මා අසන්නේ මේ ඇතුල් කිරීමට මග පෑදුවේ කවුද කියයි. ඇතුළත් කිරීමට මග පෑදුනේ මේ ගිවිසු මෙනුයි. අලුතෙන් නම් කිහිපයක් ඡන්ද ලැයිස්තුවලට ඇතුළත් වෙනවා නම් එසේ ඇතුළත් වන්නේ එතුමා අනුගමනය කරන පක්ෂයේ නායිකාව විසින් ඉන්දියා වට ගොස් ඇති කර ගන්නා ලද ගිවිසුම නිසයි. 3,00,000 කට මෙහි පුරවැසිභාවය දෙන්නත් 5,25,000 ක් ඉන්දියාවට පිටත් කර යවන්නත් ගිවිසුම සකස් කරන ලද්දේ එතුමාගෙ පක්ෂයේ නායිකාව විසි නුයි. එහෙම නම් ඒ පුද්ගලයාට කරන්න තිබුණේ මේ ගිවිසුමට සම්පූර්ණයෙන්ම විරුද්ධ වෙන්නයි.

ඒ ගරු මන්ත්‍රීතුමා සිංහල ජාතියේ ඉතිහාසය ගැන ලොකු හැල්ලක් කිව්වා. නොයෙක් නොයෙක් අවස්ථා වලදී සිංහල ජාතියට ඉන්දියාවෙන් හතුරුකම් ඇති වුණාය කිව්වා. අපට ඒ ඉතිහාසය මතක් කරන්නට පුළුවන්කමක් නැහැ. මා නම් ඔය ඉතිහාසය ඒ පුද්ගලයාට වඩා හොඳට දන් නවා. ඒ ඉතිහාසයේ තව කරුණු සවල්ප යක්, සමහර විට ඒ ගරු මන්ත්‍රීතුමාට අම තක වී තිබෙන කරුණු ස්වල්පයක් මතක් කරන්නට මා කැමතියි. අපේ පැරණි ඉති හාසයෙන් වැදගත් පාඩම් රාශියක් වර්ත මාන කාලයේ ජීවත් වන අපට ඉගෙන ගන්නට පුළුවන් බව මා පිළිගන්නවා. අපේ පැරණි ඉතිහාසයේ ගෝඨාභය යුග යක් ගැන සඳහන් වී තිබෙනවා. ඒ පරිච් ඡේදය හොඳින් කියවා බලන ලෙස මගේ ඥාති සහෝදරයාට මා ආරාධනා කරනව. ඒ කාලයේදී සංඝතිස්ස, සංඝබෝධි සහ ගෝඨාභය නමැති සහෝදරවරුන් තුන් දෙනෙක් මයියංගනයේ සිට අනුරාධපුර නගරයට ගියා. ඒ ගරු මන්ත්‍රීතුමා අපට ඉතිහාසය මතක් කළ නිසා අපත් ඒ මන්ත්‍රීතුමාට ඉතිහාසය ටිකක් මතක් කිරීම සුදුසුය කියා මා කල්පනා කරනවා. මා බොහොම කණගාටුයි, ඒ පුද්ගලයා දැන් මේ ස්ථානයේ නැති වීම ගැන. ඔහු අනුරාධපුරයට ගිහින් වගෙයි.

සංඝතිස්ස, සංඝබෝධි සහ ගෝඨාභය යන තුන් දෙනා පාලමකින් අනුරාධපුර නගරයට එගොඩ වනවිට ශාස්ත්‍රයක් අසන්නට ලැබුණා. අවාසනාවකට වගේ අන්තිමට ගිය ඒ තුන් දෙනාගේ බාලම තැනැත්තා වන ගෝඨාභයටයි, ඒ ශාස් ත්‍රය අසන්නට ලැබුණේ. ඒ ශාස්ත්‍ර යට කීවේ ඒ එගොඩ වන තුන් පොළ ඒ එගොඩ වන පිළිවෙළටම ලංකාවේ රජ වරුන් වෙනවාය කියායි. ඒක අසන්නට ලැබුණේ අන්තිමට ගිය ගෝඨාභයට පම ණයි. ඔහු නැවතත් ගිහින් කිවේ මොකක් ද කියා හොඳට අසා ගත්තා. එසේ අසා ගෙන ඒ ආශාව ඇතිව ක්‍රියා කළ ආකාරය මහා වංශයේ ඉතිහාසගත වී තිබෙනවා. අර අහිංසක ශ්‍රී සංඝබෝධි රජතුමාට අපේ මේ මැතිනියගේ අත්තනගල්ලේ කැලයකට ගිහින් හැංගිලාවත් බේරෙන්නට බැරි වුණා, මේ ගෝඨාභයගෙන්. මේ මැතිනියට මා අවවාද කරනවා, මේ වර්තමාන ගෝඨා භයගෙන් බේරෙන්නය කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ඒ සිංහල වීරයා නොයෙක් නොයෙක් අද හස් ඉදිරිපත් කළා. ඒවායින් මේ විවාද යට ගැළපෙන අදහස්වලට මගේ කථාවේදී පිළිතුරු දෙන්නට මා බලාපොරොත්තු වෙනවා. එහෙත් ඒ ඒ කරුණු පිළි වෙළින් ගන්නට සිදු වී තිබෙනවා.

මීට ප්‍රථම විවාදයේදී මා විසින් කරන ලද යම් ප්‍රකාශයක් ගැන වලපනේ ගරු මන්ත්‍රීතුමා (පී. බී. එම්. හේරත් මයා.) සඳහන් කළා. එනම්, ඡන්දදායක ලේඛ නයට වැඩිපුර ඡන්දදායකයන් ඇතුළු වීමෙන් උඩරට ගැමි ජනතාවට යම් හානි යක් සිදු වන්නට යනවා නම් ඒ උඩරට ජනතාවගේ ආරක්ෂාව පිණිස බහු මන්ත්‍රී ආසන ඇති කිරීමෙන් හෝ වෙන මාර්ගය කින් හෝ යම් පියවරක් ගන්නට මා සූදානම්ය කියා කළ ප්‍රකාශයයි. මා ගරු මන්ත්‍රීවරුන් සියළු දෙනාගෙන්ම ඉල්ලා සිටීමට කැමතියි, 1970 මහා මැති වරණය සම්බන්ධයෙන් ඒ උදවිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුළ තිබෙන විශාල භය අස් කර ගන්නටය කියා. මන්ද? මෙම ව්‍යවස්ථා පනවා, ස්ථිර වී, ව්‍යවස්ථා අනුව ක්‍රියා කරන්න පටන් ගන්නා විට කොපමණ කලක් ගත වෙයිද? විරුද්ධ පක්ෂය කියනවා අප 1970 වනතුරුවත් ඉන්නෙ නැත කියා. හොඳයි අපි පිළිගනිමු 1970 වනතුරු අප ඉන්නවාය කියා. 1970 වනතුරු සිටියොත් 1970 මාර්තු මාසයට ප්‍රථම කොහොම හරි මහා මැතිවරණයක් පවත්වන්න ඕනැ. ඒ ගොල්ලන් ඊට පෙර මොන මොනවා කරාවිදැයි කියන්න මා දන්නෙ නැහැ. කොහොම වුණත් මගේ අදහසේ හැටියට නම් මැතිවරණයක් පවත්වාවි. එහෙම නම් මොන ඡන්ද ලැයිස්තුව යටතේද මහාමැතිවරණය පවත්වන්නෙ?

1970 වනතුරු මේ පාර්ලිමේන්තුව පවත්වාගෙන ගියත් මහා මැතිවරණය පවත්වන්න සිද්ධ වෙන්නෙ 1969 දී, එනම් ලබන අවුරුද්දේදී සහතික කරන ලද, සකස් කරන ලද ඡන්ද ලැයිස්තුව යටතේයි. එහෙම නම් මෙම තුන් ලක්ෂයෙන් කී දෙනෙකු එම ඡන්ද ලැයිස්තුවට ඇතුළත් වෙයිද? ගිවිසුමේ හැටියට, අවුරුදු පහළොවක කාලයක් තුළ මෙම ගිවිසුම ක්‍රියාත්මක කළ යුතු බව සඳහන් වී තිබෙනවා. එහෙම නම් තුන් ලක්ෂය අවුරුදු පහළොවෙන් බෙදූ විට වර්ෂයකට වැටෙන්නෙ විසි දහසයි. මේ විසිදහසට ළමා ළපටි සියලු දෙනාම ඇතුළත් වෙනවා. එහෙම නම් විරුද්ධ පක්ෂයෙන් මේ බොරු ප්‍රචාර රට පුරා පතුරවා හරින්නෙ ඇයි? එසේ කරන ප්‍රචාරයන් බොරු බව ඔප්පු කිරීමටයි මේ අදහස් මා ඉදිරිපත් කරන්නෙ. ළමා ළපටින් ඇතුළු විසි දහසකට පුරවැසි භාවය දුන්නොත් 1969 දී ඡන්ද ලැයිස්තු සකස් කරන විට එම සංඛ්‍යාවෙන් සියයට පණහකටවත් ඡන්ද බලය ලැබෙන්නෙ නැහැ. ඒ අනුව සලකන විට මෙම ක්‍රියා පටිපාටිය යටතේ මුළු ලංකාවේම සිටින ඉන්දියානුවන්ගෙන්, පුරවැසි භාවය ලබා ඡන්ද බලය හිමි වන්නෙ දහ දහසක් පමණ වන පිරිසකටයි. මේ දහ දාහ ආසන කීයකට බෙදේද? එහෙම නම් විරුද්ධ පක්ෂයෙ මන්ත්‍රීවරුන් මොනවාද කථා කරන්නෙ? මෙම තර්කයට පිළිතුරක් තිබෙනවාද? විරුද්ධ පක්ෂය නගන මේ තර්ක පවු අදහසින් කරන ලද්දක් නොවේද? මෙයට පිළිතුරක් විරුද්ධ පක්ෂයෙන් දෙන්න හැකි නම් මා වාඩිවී ඊට ඉඩ දෙන්නම්. මොකක්වත් නැහැ. ලබන මහා මැතිවරණයේදී තොන්ඩමන්ගේ මාර්ගයෙන් ඡන්ද ලබාගැනීමේ උගුලක් හැටියට, වැඩ පිළිවෙළක් හැටියට විරුද්ධ පක්ෂය කියා පෑවත් ඒවා බොරු ප්‍රචාරයන් බව දැන් වැටහෙනවා නේද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අනුව සළකා බලන විට පුරවැසිකම් ලබා ඡන්ද බලය හිමිවන මෙම දස දාහ, ආසන රාශියකටම බෙදී යනවා. ඒ ප්‍රශ්නයට මා දෙන පිළිතුර ඒකයි.

ඊළඟට හබරාදුවෙ ගරු මන්ත්‍රීතුමාගේ (ප්‍රින්ස් ගුණසේකර මයා.) තර්කයට පිළිතුරු දිය යුතුව තිබෙනවා. එතුමා පළමුවෙන්ම, මෙම රෙගුලාසිවල දෙමළ පරිවර්තනයක් ද්‍රවිඩ මන්ත්‍රීවරුන්ගේ පහසුව සඳහා සපයා නැති බවක් කියමින් කිඹුල් කඳුළු හෙළන්නට පටන් ගත්තා. හබරාදුවෙ ගරු මන්ත්‍රීතුමා ද්‍රවිඩ ජනතාව කෙරෙහි කොයි විධියේ අනුකම්පාවක් දක්වනවාද යන වග මා දන්නවා. මෙම රෙගුලාසිවල දෙමළ පරිවර්තනයක් සපයා තිබෙන බව මට පසුව දැනගන්නට ලැබුණා.

හබරාදුවෙ ගරු මන්ත්‍රීතුමා අපට කරන චෝදනාවක් වශයෙන් එක් කරුණක් ඉදිරිපත් කළා. ඉන්දියානු ජාතිකයෙකු ලංකාවේ පුරවැසිභාවය ඉල්ලන විට ඔහු මෙහි පදිංචි වන මන්ත්‍රී කොට්ඨාශය කුමක්ද යන වග ප්‍රකාශ කිරීමට අප ඉදිරිපත් කර තිබෙන පෝර්ම කොළයේ ඉඩ සලසා නැතිලු. අප එසේ කර තිබෙන්නේ මැතිවරණයකදී වැඩි ඡන්ද ගණනක් අපට ලබා ගන්නට බැරි ඡන්දදායක කොට්ඨාශ වලට එම ඉන්දියානුන් යැවීමටලු. පාසලක කෙරෙන විවාදයකදීවත් මේ විධියේ තර්ක ඉදිරිපත් කරන්නේ නැහැ. මේ ගරු මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කරන තර්ක මේවාද? යම් පුද්ගලයකු මේ රටේ පුරවැසියකු වුණායින් පසු ඔහු පුරවැසිකම ලැබුදා සිට අසුවල් කොට්ඨාශයේ අසුවල් ගමේ අසුවල් තැනම පමණක් වාසය කළ යුතුයයි නියම කරන්නට අපට පුළුවන්ද? ඒ මොන තර්කයක්ද? එහෙම කරන්නට නම්, නුඹ මේ රටේ පුරවැසි භාවය ලැබූ දා සිටම අසුවල් ස්ථානයේ පම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ණක් පදිංචි වී සිටිය යුතුයි යනුවෙන් අප ඔවුන්ට නියම කරන්නට ඕනෑ. තමන් කැමති තැනකට යාමේ නිදහසක් ඔවුන්ට දෙන්නට හොඳ නැහැ. යම් වත්තක ඔවුන් පදිංචි වී සිටිනවා නම්, ඒ වතු හිමියා ඔවුන්ට මොන විධියේ හිරිහැරයක් කළත් එතැනින් වෙනත් තැනකට යන්නට බැහැ. එහිම සිටින්නට ඕනෑ. හබරාදුවෙ ගරු මන්ත්‍රීතුමාගේ තර්කය ඒකයි.

දිවුරුම් ගැනීම ගැනත් එතුමා ඊළඟට අදහසක් ඉදිරිපත් කළා. එතුමා කියන හැටියට මේ රටේ පුරවැසිකම් ලබන අයගෙන් ෆෙඩරල් වාදයට විරුද්ධව දිවුරුමක් ගන්නට ඕනෑ. අප විරුද්ධ වන වාද රාශියක් මේ රටේ තිබෙනවා. කොමියුනිස්ට් වාදයට මා බොහොම විරුද්ධයි. එහෙත් මේ රටේ පුරවැසි භාවය ලබන කෙනකුගෙන් කොමියුනිස්ට් වාදයට විරුද්ධ වන බවට දිවුරුමක් ගැනීම සුදුසුද? එසේ නැත්නම්, තමන් කැමැති වාදයක් ඔහුටම තෝරා ගන්නට ඉඩ තැබීම සුදුසුද? ෆෙඩරල් වාදයට යම් කෙනකු හරවා ගන්නට ඒ වාදයට කැමති අයට පුළුවන් නම් එසේ කර ගැනීම ඔවුන්ගේ වැඩක්. ඒ නිදහස ඔවුන්ට තිබිය යුතුයි. කිසියම් වාදයකට විරුද්ධ වන ලෙස විශේෂ කොන්දේසියක් මගින් දිවුරුමක් ගත යුතුයයි කීම ගැන විරුද්ධ පාර්ශ්වයේම අනෙක් ගරු මන්ත්‍රීවරුන් පවා කැමති වේ යයි මා හිතන්නේ නැහැ. මා දන්නේ නැහැ, හබරාදුවේ ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අයිතිද කියා.

**ගරු ඊ. එල්. බී. හුරුල්ලේ (ප්‍රවාහණ ඇමති)**

*(கௌரவ ஈ. எல். பி. ஹுருல்லே—போக்குவரத்து அமைச்சர்)*

(The Hon. E. L. B. Hurulle—Minister of Communications)

ස්වාධීන.

**ගරු ඩඩ්ලි සේනානායක**

*(கௌரவ டட்லி சேனநாயக்க)*

(The Hon. Dudley Senanayake)

ස්වාධීන මන්ත්‍රීවරයෙක්. එතකොට මේ ස්වාධීන මන්ත්‍රීවරයා අනික් තැනැත්තාගේ ස්වාධීනත්වය නැති කිරීමට බලාපොරොත්තු වන කෙනෙක්. යම් පුද්ගලයන්ට තම තමන් කැමති මත අනුගමනය කරන්නට ඉඩ නොදීමේ ක්‍රියා පටිපාටියක් පවත්වාගෙන යාමට ලෑස්ති, ඒ අයගේ ස්වාධීනත්වය නැති කිරීමට සූදානම්ව සිටින ස්වාධීන මන්ත්‍රීවරයකුගේ තර්කය තමා, එය. ඊට වඩා යමක් ඒ ගැන කියන්නට මා කල්පනා කරන්නේ නැහැ.

මේ ගැන ඉන්දියාව මොකද කරන්නේ කියා ඊළඟට ප්‍රශ්න කළා. මේ ගැන ඉන්දියාව අපට වඩා ක්‍රියා කර තිබෙනවා. මේ පිළිබඳ ප්‍රමාදය තිබෙන්නේ අප අතේ සි. අපට නොයෙකුත් අන්දමේ වෙන වෙනත් වැඩ රාශියක් තිබුණු හෙයින් මෙම වැඩ කටයුතු ප්‍රමාද වුණු බව කියන්නේ කනගාටුවෙනුයි. ඉන්දියාවේ ඒ උදවිය පදිංචි කරවන තැන් ගැන ඉන්දියාව ක්‍රියා කර ගෙන යනවා. ඒ ගැන කිසිම සැකයක් ඇති කර ගන්නට වුවමනාවක් ඇත්තේ නැහැ.

අපේ දොම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) තර්ක දෙක තුනක් ඉදිරිපත් කරන්නට යෙදුණා. ඒ මන්ත්‍රීතුමා කිව්වා, බලහත්කාරයෙන් යවන්නට බැරිය කියා මා පිළිගත් බව. එතුමා මගේ කතාව හොඳට කියවා නැති බවයි පෙනෙන්නේ. එතුමා මගේ කතාව හොඳට කියෙව්වා නම් මා එවැනි දෙයක් සඳහන් කළායයි පිළිගන්නේ නැහැ. "ඉන්දියාව පිළිගෙන තිබෙනවා පන් ලක්ෂ විසිපන් දහසක් ආපසු භාර ගන්නට; අපි පිළිගෙන තිබෙනවා තුන් ලක්ෂයක් භාර ගන්නට; ඉන්දියාව ඒ පන්ලක්ෂ විසිපන් දහස භාර ගන්නේ කුමන මාර්ගය කින්ද යන්න අපට අයිති දෙයක් නොවෙයි; ඒ පිළිබඳ වගකීම තිබෙන්නේ ඔවුන්ටයි; එහෙත් එම භාර ගැනීම පිළිබඳ වගකීම ඉන්දියාව ඉටු කරන්න තියෙනවා." යන ආකාරයටයි මා කීවේ. ඒ උදවිය ඔවුන් භාර ගන්නට බලාපොරොත්තු වන්නේ කුමන අන්දමේ මාර්ගවලින්ද, ඒ උදවිය කුමන අයුරකින් ඒ වගකීම ඉටු කරාවිද කියන එක ගැන මගේ ප්‍රශ්නයක් නැහැ. එදා මා කීවේ එයයි. අද කියන්නේත් එයයි.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාවට නැඟීමේ) පනත:
[ගරු ඩඩ්ලි සේනානායක]

ඊළඟට මේ බලපත්‍ර පිළිබඳව කථා කළා. ලංකාව අතහැර ඉන්දියාවට යාමට ලෑස්තිය කියා ඉදිරිපත් වන උදවියට බලපත්‍ර දීම ගැන ලොකු තර්කයක් ඉදිරිපත් කළා. මේ පනත යටතේ බලපත්‍රයක් තිබෙන්නට ඕනෑ. ඒ ගරු මන්ත්‍රීතුමාම දන්නවා ඇති, බලපත්‍රයක් නොමැතිව මේ වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන් ක්‍රියාවට යෙදීමේදී අවුලක් විය හැකි බව. අපේ අදහස නම්, මේ රටේ පුරවැසි භාවය නොමැති පිරිස අඩු කිරීමයි. පුළුවන් තරම් ඉක්මනට අප එය කරන්නට කල්පනා කරනවා. ඒ අඩු කිරීම මාර්ග දෙකකින් කරන්නට අදහස් කළා. කොටසක් ලංකාවේ පුරවැසියන් කිරීමත් අනික් කොටස ඉන්දියාවේ පුරවැසියන් කොට පුළුවන් තරම් ඉක්මනට ඉන්දියාවට පිටත් කර යැවීමත් ඒ මාර්ග දෙකයි. ඉතින් ලංකාවේ පුරවැසියකු නොවන හෙයින් ඉන්දියාවේ පුරවැසියකු වන්නට ලෑස්තියි කියා ඉදිරිපත් වන එවැනි පුද්ගලයකුට ඒ සඳහා බලපත්‍රයක් අවශ්‍ය වෙනවා. යම්කිසි කාල සීමාවක් සඳහා ඒ බලපත්‍රය දෙනවා. එම බලපත්‍රය අවලංගු කර ඔහු යවනවා, යන්න තියෙන අවස්ථාවේ දී. මේ වැඩ පිළිවෙළ ක්‍රියාවේ යෙදවීමට මේකෙන් ලොකු බාධාවක් වෙනවාද කියන්නට මට තේරෙන්නේ නැහැ. ඒ මන්ත්‍රීතුමා පෙන්වන්නට උත්සාහ කළේ කුමක්ද? අපේ අදහස වන්නේ මේ මාර්ගයෙන් තුන් ලක්ෂයකට පුරවැසිභාවය දෙන අතර පන්ලක්ෂ විසිපන් දහසක් දෙනාත් බලපත්‍ර ඇතුව මෙහි තබා ගන්නවාය කියන එකයි එතුමා පෙන්වා දෙන්නට උත්සාහ කළේ.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

යන්නේ, ඒ අය සතුටුදකයි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

| Where the average London c.i.f. price of Philippines copra as estimated and notified by the Principal Collector of Customs | | | The export duty payable on a ton of copra shall be | The export duty payable on a ton of coconut oil shall be | The export duty payable on a ton of desiccated coconut shall be | The export duty payable on fresh coconuts per 1,000 nuts shall be |
|---|---|---|---|---|---|---|
| | Rs. c. | Rs. c. | Rs. c. | Rs. c. | Rs. c. | Rs. c. |
| is more than | 1,620 0 but not more than | 1,630 0 .. | 604 36 .. | 795 15 .. | 675 39 .. | 150 97 |
| ,, | 1,630 0 ,, | 1,640 0 .. | 610 22 .. | 804 67 .. | 683 48 .. | 152 43 |
| ,, | 1,640 0 ,, | 1,650 0 .. | 616 08 .. | 814 19 .. | 691 57 .. | 153 89 |
| ,, | 1,650 0 ,, | 1,660 0 .. | 621 94 .. | 823 71 .. | 699 66 .. | 155 35 |
| ,, | 1,660 0 ,, | 1,670 0 .. | 627 80 .. | 833 23 .. | 707 75 .. | 156 81 |
| ,, | 1,670 0 ,, | 1,680 0 .. | 633 66 .. | 842 75 .. | 715 84 .. | 158 27 |
| ,, | 1,680 0 ,, | 1,690 0 .. | 639 52 .. | 852 27 .. | 723 93 .. | 159 73 |
| ,, | 1,690 0 ,, | 1,700 0 .. | 645 38 .. | 861 79 .. | 732 02 .. | 161 19 |
| ,, | 1,700 0 ,, | 1,710 0 .. | 651 24 .. | 871 31 .. | 740 11 .. | 162 65 |
| ,, | 1,710 0 ,, | 1,720 0 .. | 657 10 .. | 880 83 .. | 748 20 .. | 164 11 |
| ,, | 1,720 0 ,, | 1,730 0 .. | 662 96 .. | 890 35 .. | 756 29 .. | 165 57 |
| ,, | 1,730 0 ,, | 1,740 0 .. | 668 82 .. | 899 87 .. | 764 38 .. | 167 03 |
| ,, | 1,740 0 ,, | 1,750 0 .. | 674 68 .. | 909 39 .. | 772 47 .. | 168 49 |
| ,, | 1,750 0 ,, | 1,760 0 .. | 680 54 .. | 918 91 .. | 780 56 .. | 169 95 " |

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

வினா மீண்டும் எடுத்தியம்பப் பெற்றது.

*Question again proposed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 2.55

**බර්නාඩ් සොයිසා මයා.** (දකුණු කොළඹ)
(திரு. பேர்னட் சொய்ஸா—கொழும்பு தெற்கு)
(Mr. Bernard Soysa—Colombo South)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය වාරයේ තීරු බදු වෙනස් කිරීමේ ප්‍රශ්නය ගැන කථා කරන විට පොල් වගාව පිළිබඳව සඳහන් කරන්නට මට එදා ඉඩ ලැබුණා. ගරු මුදල් ඇමතිතුමා විසින් රුපියලේ අගය අඩු කිරීමේ යෝජනාව ඉදිරිපත් කළ අවස්ථාවේදී ඔහුගේ බලාපොරොත්තුව වූයේ ඒ මගින් වැඩිපුර අපනයන භාණ්ඩ ප්‍රමාණයක් ලෝක වෙළඳපොලේ අලෙවි කර ගැනීමටයි. රුපියලේ අගය අඩු කළ නමුත් වැඩිපුර විදේශ විනිමයක් ඒ මාර්ගයෙන් සොයා ගැනීමට ගරු මුදල් ඇමතිතුමා බලාපොරොත්තු ඇති කර ගත්තා. අද මේ ප්‍රශ්නය ගැන නැවත වරක් කථා කරන්ට ඉදිරිපත් වන විට විශේෂයෙන් කියන්ට තිබෙන්නෙ මේ වැඩිපුර අලෙවි කර ගැනීමට ඇති කර ගත් බලාපොරොත්තුව දැනටමත් ඇතිවී තිබෙන සිදුවීම්වලින් සුන්වී තිබෙන බවයි. ගරු මුදල් ඇමතිතුමාගේ බලාපොරොත්තුව කිසිම විධියකින්වත් ඉෂ්ට නොවන තත්ත්වයටයි අද වැටී තිබෙන්නෙ. පොල් වැඩිපුර අලෙවි කිරීමක් තවදුරටත් කර ගෙන යන්නට පුළුවන්ය කියන විශ්වාසය පුහු විශ්වාසයක් බව ඔප්පු කිරීමට මම කරුණු ඉදිරිපත් කළා.

රබර් පිළිබඳව කොහොමද ? රබර් පිළිබඳ තත්ත්වය ඉතාමත් භයානක බව ඒ විෂය ගැන එදා ඇති වූ විවාදයේදී දෙවිනුවර ගරු මන්ත්‍රීතුමාත් (ද මැල් මයා.) අගලවත්තේ ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) ප්‍රකාශ කරන්ට යෙදුණා. එදායින් පසුව තත්ත්වය තව දුරටත් පහළ බැස තිබෙනවා. වුවමනා නම් ඊට සාක්ෂි වශයෙන් පෙබරවාරි 10 වෙනිදා —ඊයේ—“ටයිම්ස්” පත්‍රයේ පළවූ නිවේදනයකින් පෙන්වා දෙන්නම්. මෙන්න ඒ නිවේදනය :

“Rubber Prices Slump

Expectations that rubber would benefit by the devaluation of the Ceylon rupee have been belied.”

රුපියලේ අගය අඩු කිරීම නිසා රබර් වෙළඳාමෙන් වාසියක් ලැබේ යයි ඇති කර ගත් බලාපොරොත්තුව දැනටම අසත්‍යයක් බවට පත්වී තිබෙනව.

“According to rubber trade circles, rubber prices, which have been declining in recent weeks, slumped to pre-devaluation levels at $73\frac{3}{4}$ cents a pound yesterday.

The recession has caused much anxiety in producers and officials circles.

The trade attributes the plunge to several factors such as increased production by major producers, including Ceylon, a rise in the output of synthetic rubber and a suspension of the Malaysian Government's buying in the Singapore market.

Ceylon's rubber crop alone has risen by about 50.000 tons over the last decade —from 90,000 tons to 140,000 tons at the end of 1967; Malaysia's by 400,000 tons —from 700,000 to 1,100,000 tons; and Thailand's by 50 per cent.”

රුපියලේ අගය අඩු කිරීමට කලින් තිබුණු තත්ත්වයට දැන් රබර් මිළ බැස තිබෙනවා. එසේ බැසීමට ප්‍රධාන හේතුවක් වශයෙන් පෙන්නුම් කරන්නේ, පෙරට වඩා රබර් අලෙවි කිරීමේ සිරිතක් මෑතදී ඇති වී තිබීමයි. මේ තත්ත්වය උඩ තව දුරටත් රබර් අලෙවි කිරීමෙන් වැඩිපුර ලාභයක් සොයා ගන්නට ආණ්ඩුව බලාපොරොත්තු වන්නේ කෙසේද ? වැඩිපුර විදේශ විනිමය හම්බ කරන්නේ කෙසේද ? අද රබර් රාත්තලක මිළ ශත $73\frac{3}{4}$ යි. එහෙම නම් මොකක්ද ලැබෙන ලාභය ? වැඩිපුර නිෂ්පාදනයෙන් ලැබෙන රුකුල මොකක්ද ? වැඩිපුර අලෙවි කරන්නට එපා. තිබෙන නීති පොදුවේ හැම කොහාට විකුණන්වද, බලාපොරොත්තු වන්නේ ?

මෙතැනින් මතු වන විශේෂ ප්‍රශ්නයක් තිබෙනවා. රුපියලේ අගය අඩු කිරීමේ වැඩ පිළිවෙළට එකතු වූ කොටසක් වශයෙන් මෙම තීරු බදු වැඩි කිරීමේ යෝජනාව ඉදිරිපත් කරන බව කී ගරු මුදල් ඇමතිතුමා, රුපියලේ අගය අඩු කළායින් පසුව අද ඇති වී තිබෙන තත්ත්වය මේ යයි විස්තර කිරීමට ඉදිරිපත් නොවුණේ ඇයි ? එහෙත් ඇත්ත තත්ත්වය ඔකයි. රබර් රාත්තලකට වැඩිපුර ලබා ගන්නට බලාපොරොත්තු වන ශත තුන ලබා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගන්නේ කොහෙන්ද? ලොකු වතු හිමියන්ගෙන්, විශාල ඉඩම් හිමියන්ගෙන් වැඩිපුර මිළක් සොයා ගැනීම ගැන මගේ නම් කිසිම විරුද්ධත්වයක් නැහැ. එවැන්නකට කැමති වෙනවා මිස විරුද්ධ වන්නේ නැහැ. එහෙත් ගැමි ජනතාවඅතර සිටිනා පොඩි ඉඩම් කැබෙල්ලක් අයිතිව සිටින, රබර් ගස් කීපයක් අයිතිව සිටින ඒ ගස් කීපය කපාගෙන යාන්තම් ජීවිතය ආරක්ෂා කර ගන්නා සුළු නිෂ්පාදකයාටයි, මේ බර කොටස උසුලන්නට සිදු වන්නේ. මේ වැඩිපුර ශත තුන ගෙවන්නට සිදු වන්නේ ඔහුටයි. ඔහු අලෙවි කර ගන්නට බලාපොරොත්තු වන රබර්වලට ලැබෙන මිළෙනුයි, මේ ශත තුන අය කර ගන්නට අදහස් කරන්නේ. දැනට රාත්තලක් ශත 73¾ කට බැස තිබෙන අවස්ථාවේදී අර ශත තුනේ අතිරේක මුදල ගෙවන්නට සිදු වන්නේ ඒ කුඩා නිෂ්පාදකයාටයි. නිෂ්පාදන ගාස්තු ගෙව්වාට පසුව, රබර් රාත්තලක් සකස් කරන්නට යන වියදම ගෙව්වායින් පසුව, වැඩිපුර අය කරන්නට බලාපොරොත්තු වන මේ මුදල ගෙවන්නට නිෂ්පාදකයාට ශක්තියක් ඉතිරි වේද? දැනට ශත 73¾ ක් වූ මේ මිළ මෙතැනින් නවතීවි යයි බලාපොරොත්තු විය හැකිද? තවදුරටත් මිළ බසින්නට ඉඩ තිබෙන බව පිළිගන්නට සිදු වෙනවා.

රබර් පිළිබඳ තත්ත්වය ගැන නැවත වරක් මෙම විවාදයේදී විස්තර වශයෙන් කාරණා කියන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. පසුගිය දිනයේ මේ අංකය ගැන ඇති වූ විවාදයේදී අගලවත්තේ ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) දෙවිනුවර ගරු මන්ත්‍රීතුමාත් (ආර්. ජේ. ජී. ද මැල් මයා.) මේ සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් කථා කළා. එහෙත් එක කරුණක් කිව යුතුයි. අද නවදිල්ලියේදී පවත්වා ගෙන යන සාකච්ඡා අනුව මොකක්ද කරන්නට යන්නේ? අපේ රබර් මිළ බැසීමට ප්‍රධාන හේතුව වශයෙන් පෙනී යන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයේ තොග වශයෙන් ගබඩා කර තිබෙන රබර්, අලෙවිය සඳහා විටින් විට තොග වෙළඳපොළට දැමීමයි. ඔවුන්ගේ ගබඩා නිදහස් කර ගැනීම පිණිස, රැස් කර ගෙන තිබෙන රබර් වෙළඳපොළට යැවෙන නිසා අපෙන් යැවෙන රබර්වලට තර්ජනයක් ඇති වෙනවා. ඒ නිසා අපේ රබර්වල මිල තව දුරටත් අඩු වේගෙන යනවා. වරින් වර රබර් මිල අඩු කිරීම සඳහා අමෙරිකන් ආණ්ඩුවේ කැමැත්ත ඇතිව ධනේශ්වර සමාගම් මගින් කරගෙන යන වැඩ පිළිවෙළ නිසා අපේ රබර්වලට ඉතාමත් භයානක පරිහාණියකට මුහුන දෙන්න සිදු වෙනවා. මේ පිළිබඳව නවදිල්ලියේදී කරන ලද සාකච්ඡාවලින් මෙයට කිසිම පිළියමක් සොයා ගන්න බැරි වී තිබෙනවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
**(The Hon. Wanninayake)**
තවම ඉවර නැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
**(Mr. Bernard Soysa)**
ඉවර වෙන විට හරි යාවිද?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
**(The Hon. Wanninayake)**
හරි ගියොත් එහෙම.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
**(Mr. Bernard Soysa)**
හරි ගියොත් බොහොම හොඳයි.

**ආචාර්ය එන්. එම්. පෙරේරා** (යටියන්තොට)
*(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)*
**(Dr. N. M. Perera—Yatiyantota)**
මොනවද හරි යන්න තියෙන්නෙ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
**(Mr. Bernard Soysa)**
අපේ ගරු මුදල් ඇමති තුමාත් මේ ගැන හොඳට දන්නවා. ඒ වගේම මගේ සහකාර මන්ත්‍රීතුමා—ගරු රාජ්‍ය ඇමතිතුමා—ඉතාමත් අලංකාර අන්දමට මේ ගැන කථා කර තිබෙනවා. අපි අවුරුදු ගණනක් තිස්සේ විරුද්ධ පක්ෂයේ ඉඳ ගෙන කිව්ව දෙයක් තමයි මේ. වමේ පක්ෂ වන ලංකා සමසමාජ පක්ෂය, ලංකා කොමියුනිස්ට් පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ආදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

පක්ෂවල සිටින අය 1948 න් පසු මේ රටේ පහළ වූ තත්ත්වය විග්‍රහ කරමින් කිහිප විටක්ම මේ ගරු සභාවේදීත් පිටතදීත් මේ ගැන කියා තිබෙනවා. අධිරාජ්‍යවාදී රටවල් හා ඔවුන් විසින් කලින් ඇති කර ගෙන තිබුණ යටත් විජිතයන් අතරේ ඇති තත්ත්වය ගැන තමයි මෙතෙක් කල් කිව්වේ. ඔවුන් මුලදී මේ රටේ තිබෙන හැම දෙයක්ම සූරා කෑමේ වැඩ පිළිවෙළක් ඇති කරගෙන තිබුණා. දැන් ඒ ක්‍රමය වෙනස් වී තිබෙනවා. දැන් එය කෙරෙන්නේ වෙළඳ හුවමාරු ක්‍රමය මගිනුයි. මේ වෙළඳ හුවමාරු ක්‍රමය මගින් කලින් තිබුණාටත් වඩා දරුණු විධියේ සූරා කෑමක් කරගෙන යන බව අපට පෙනෙනවා. අපේ රටේ සංවර්ධනය සඳහා වුවමනා කරන යන්ත්‍රෝපකරණ ආදී කාර්මික භාණ්ඩවල මිල වැඩි කරනවා. අපෙන් ගන්නා කෘෂිකාර්මික භාණ්ඩවල මිල අඩු කරනවා. මේ මිල නියම කිරීමේදී මේ සූරා කෑම වැළකෙන අන්දමට මිල නියම කරවා ගැනීමට අපට ශක්තියක් නැහැ. වෙළඳ හුවමාරුවෙන් කෙරෙන සූරා කෑම දිනෙන් දිනම උග්‍ර වෙගෙන යනවා. දැන් මේ ආණ්ඩුවේ නියෝජිතයා වශයෙන් නව දිල්ලියට ගොස් කථා කරන අපේ රාජ්‍ය ඇමතිතුමාත් ඒ බව පිළිගෙන තිබෙනවා. එතුමා ඒ ගැන බොහොම අලංකාර අන්දමට කථා කර තිබෙනවා. අප ඇතැම් විට මේ අයවැය විවාදවලදී මේ ගැන ඉදිරිපත් කළ කරුණුවලටත් වඩා විසිතුරු වශයෙන් කරුණු ඉදිරිපත් කරමින් රාජ්‍ය ඇමතිතුමා කථා කර තිබෙනවා. නමුත් අපි මේ කරුණ ගැන දැන ගෙන සිටියේ හුඟක් කලින් සිටයි. මේ ආණ්ඩුවට බොහොම ප්‍රමාද වෙලයි සත්‍යය වැටහෙන්නේ. අපි 1948න් පසු බොහෝ විට මේ කරුණු ඉදිරිපත් කළා. අවුරුදු 15 කට 16 කට පසු තත්ත්වය හුඟක් දුරට දරුණු වුණ විට මේ ආණ්ඩුවේ කලින් සිටි මුදල් ඇමතිවරයෙකුට කරුණු තේරුම් ගොස් තිබෙනවා. අන්තර් ජාතික සාකච්ඡාවලට ගොස් දැන් ඒ ගැන විස්තර කරනවා. බොහොම හොඳයි, ඒ තරම් දුරටවත් මේ ආණ්ඩුව මේ දේවල් පිළිගෙන තිබීම. නමුත් එයින් පැන නැඟී ඇති තත්ත්වයට මොකද කරන්නෙ ?

රජයන් 72 ක් එකතු වී මේ එක සින්දුවම ගායනා කරනවා. අප විකුණන කෘෂිකාර්මික භාණ්ඩවල මිල බස්සවන තමුන්නාන්සේලා අපට විකුණන කාර්මික භාණ්ඩවල මිල වැඩිකර තිබෙනවාය, කරුණාකර මෙය නතර කරන්නය, මේ සූරා කෑමට අපට ඉඩ දෙන්නට බැරිය කියනවා. එසෙ කියා සටනකට ලෑස්ති වෙනවාද ? නැහැ. සටනකට ලෑස්ති වන්නට බැහැ. ඇයි බැරි ? මේ විධියට එඩිතර කමින්, උච්චස්වරයෙන් කථා කරන මේ ආණ්ඩුවලට සිදු වී තිබෙන්නේ කුමක්ද ? එක් කෙනකුට හොරෙන් තවත් එක් කෙනෙක් තනිවම සතුරා සමග ගිවිසුම් ඇති කර ගන්නට උත්සාහ කරනවා. අපේ අවාසියට මිල බස්සනවාය කියන ඇමෙරිකා එක්සත් ජනපදය, බටහිර ජර්මනිය, මහා බ්‍රිතාන්‍යය යන රටවල් සමග හෝ ඒ රටවලින් පාලනය වන ලෝක බැංකුව, අන්තර් ජාතික අරමුදල වැනි ආයතනයන් සමග හෝ අනික් රටවලට නොදන්වා, අනික් රටවලට හොරෙන් එක රටක් තනියම ගිවිසුමක් ඇති කර ගන්නවා. අද ලෝකයේ පිට වන්නේ නැති රහසක් නැහැ. තමුන්නාන්සේලාගේ රහස් පිට වී ඉවරයි. කෙසේ වෙතත්, තනිවම, හොරෙන් ගිවිසුමක් ඇති කර ගන්නට—තමන්ට පමණක් විශේෂ වාසියක් ලබා ගන්නට—බලනවා. ඒ නිසා කොයි තරම් උච්චස්වරයෙන් කථා කළත්, බොහොම එඩිතර වචන පාවිච්චි කළත් සටනකට මුහුණ දෙන්නට නම් බැහැ. අපේ අසවල් කෘෂිකාර්මික භාණ්ඩයට අසවල් මිලට වඩා අඩුවෙන් ගෙවන්නට තමුන්නාන්සේලා සූදානම් වෙනවා නම් ඒ භාණ්ඩ අප තමුන්නාන්සේලාට විකුණන්නේ නැහැ කියන තර්ජනය, රටවල් සියල්ලක්ම එකතු වී ඉදිරිපත් කරන්නට ලෑස්ති නැහැ. තනි රටකට පමණක් මේ සටන කරන්නට බැහැ. මේ රටවල් 72 න් බාගයක්වත් එකතු වෙලා, අඩු ගණනේ අග්නිදිග ආසියාවට අයිති, මේ ශාන්තිකර සාගරයට සහ ඉන්දියානු සාගරයට අයිති රටවල්වත් එකතු වී, අප තමුන්නාන්සේලාට විකුණන්නේ මේ භාණ්ඩය, මේ භාණ්ඩවලට නිසි මිලක් ගෙවන්නට තමුන්නාන්සේලා ලෑස්ති නැත්නම් අප

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමුන්නාන්සේලාට ඒවා අලෙවි කරන්නට ලැස්ති නැත, තමුන්නාන්සේලා ඒවා ගන්නේ නැතිව සිටින්නේ කොහොමද කියා බලමු කියනවා නම් වැඩේ හරියනවා. එවැනි තර්ජනයක් කරන්නෙ නැතිව කවදාවත් මේ ප්‍රශ්නය විසඳන්නට බැහැ. එසේ නැතිව, එක භාණ්ඩයක් සම්බන්ධයෙන් පමණක්, එක රටකට පමණක් තනිවම මේ වැඩය කරන්නට බැහැ.

මේ සම්බන්ධයෙන් මා එක නිදර්ශනයක් ඉදිරිපත් කරන්නට සතුටුයි. නයිජීරියාව, ඝානාව සහ වෙනිසුවලාව යන රටවල් තුන—ඒ රටවල් තුනෙන් දෙකක් අප්‍රිකාවේ, එකක් දකුණු ඇමෙරිකාවේ—එකතු වී ගිවිසුමක් ඇති කර ගත්තා, අපේ කොකෝ හොණ්ඩරයකට සිලිම් 123 කට අඩුවෙන් ගෙවන තත්ත්වයක් ආවොත් අප ඒවා විකුණන්නේ නැත කියා. එසේ ගිවිසුමක් ඇති කරගෙන 6 මාසයක් තිස්සේ කොකෝ විකුණන්නේ නැතිව සිටියා. එහෙත් සිදු වුණේ කුමක්ද? සුළු වශයෙන් කොකෝ නිෂ්පාදනය කරන වෙනත් රටවලින් තමන්ට වුවමනා කරන කොකෝ ගන්නට පුළුවන් වුණු නිසා කැඩ්බරීස්, රවුන්ට්රීස් නමැති විශාල චොක්ලට් සමාගම් දෙකට පුළුවන් වුණා, මේ ආණ්ඩු තුන මෙල්ල කර ගන්නට. එක භාණ්ඩයකට පමණක් සීමා වූ සටනක් නිසා, රටවල් තුනකට පමණක් සීමා වූ සටනක් නිසා, ඒ සටන 6 මාසයකට වඩා ගෙන යන්නට ශක්තියක් ඇති වුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙයින් ඉගෙන ගන්නට තිබෙන පාඩම කුමක්ද? සටනක් ගෙන යන්නට බැරිය කියන පාඩම නොවෙයි, ඉගෙන ගන්නට තිබෙන්නේ. සටන ශක්තිමත් කර ගැනීමට නම් ඒ සටන පොදුවේ ගෙන යන්නට ඕනෑ. එක භාණ්ඩයකට පමණක් සීමා නොකර එක රටක් පමණක් තනි නොවී, බටහිර ලෝකයේ රටවලට කියන්නට ඕනෑ, අපට නියම මිලක් නොදෙනවා නම් තමුන්නාන්සේලාගේ කර්මාන්ත ගෙන යාමට වුවමනා කරන අමු ද්‍රව්‍ය අප තමුන්නාන්සෙලාට දෙන්නේ නැත කියා. ඒ විධියේ වර්ජන සටනක් ඇරඹුවොත් අන්න එදාට තමයි, නිසි මිලක් ලබා ගන්නට පුළුවන් වන්නේ. එසේ කිසිම සූදානමක් නැතුව, ඇල්ජීරියාවට හෝ නව දිල්ලියට හෝ ගිහින්, කොයි තරම් දුරට උච්ච ස්වරයෙන්, එඩිතර වචනයෙන් කථා කරමින් ප්‍රශ්න ගැන නිසි විග්‍රහයක් කරන්න ඉදිරිපත් වුණත් කවදාවත් ප්‍රශ්න විසඳෙන්නෙ නැහැ. කොයි අන්දමින් යෝජනා කළත් සටන් කරන්න තරම් අපට ශක්තියක් නැහැ; සටනට සූදානමක්ද නැහැ. එක් පෙරමුණක් සාදා ගෙන කථා කරනවා, නමුත් ක්‍රියාවෙදි තනි තනිව, වෙනමම ගිවිසුම් ඇති කර ගන්න බලාපොරොත්තු වෙනවා. ණයට මුදල් ලබා ගන්න, ණයට බඩු ලබාගන්න, අපේ විදේශ විනිමය අඩු වීමේ ප්‍රශ්නය තාවකාලිකව විසඳා ගන්න වෙන් වෙන් වශයෙන් ගිවිසුම් ඇති කර ගන්න බලාපොරොත්තු වන නිසා එක පෙරමුණක් සාදා ගෙන, එකම වේදිකාවක කථා කළත් ක්‍රියා කිරීමේදී එකමුතුකමක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොකක්ද, අද කරන්න යන්නෙ? නියෝජිත පිරිස් නොයෙක් නොයෙක් රටවලට යවා හිඟා කෑමේ යොදවනවා. ස්කැන්ඩිනේවියාවට පිරිසක් යනවා. තවත් පිරිසක් දකුණු ඇමෙරිකාවට යනවා. තවත් පිරිසක් බටහිර යුරෝපයට යනවා. තවත් පිරිසක් නැගෙනහිර යුරෝපයටත් යන්න බලාපොරොත්තු වෙනවා. ඒ අන්දමට නියෝජිත පිරිස් යවා "අනේ අප කෙරෙහි අනුකම්පාවක් දක්වන්නටය" කියා එම රටවලින් ඉල්ලීම් කරමින් ඒ මාර්ගයෙන් මෙම ප්‍රශ්න විසඳා ගැනීමට බලාපොරොත්තු වෙනවා. අනුකම්පාව උඩ මේ ප්‍රශ්න විසඳන්න පුළුවන් නම් මෙයට පෙර මේ ප්‍රශ්න විසඳා හමාරයි. කෙසේ වුණත් මේ තරඟබිමට අවුත් සිටින ධන කුවේරයන්, ධනපති රටවල්, අපේ ශුභ සිද්ධිය තකාගෙන නොවෙයි ඔවුන්ගේ කටයුතු කරගෙන යන්නෙ. අපේ සැපත බලාගෙන නොවෙයි ඔවුන් පියවර ගන්නෙ. අපේ දියුණුව බලාපොරොත්තුවෙන් නොවෙයි ඔවුන් ක්‍රියා කරන්නෙ. තමන්ගේ ධනය වැඩි කර ගැනීමට වුවමනා කරන සූරා කෑම තව දුරටත් කරගෙන යන්නෙ කෙසේද, ඒ සඳහා අමුතු මාවත් ඇති කර ගන්නේ කෙසේද කියන කාරණය ගැන පමණයි ඔවුන් වෙහෙසෙන්නෙ. එසේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

අමුතුවෙන් මාවත් ඇතිකර ගැනීමට පමණයි ඔවුන්ට වුවමනා වී තිබෙන්නෙ. එම නිසා එවැනි පිරිසකගෙන් අනුකම්පාවක් බලාපොරොත්තු වීම, විසි වන ශත වර්ෂයෙ, අද වියට්නාමයෙ දකින්න අසන්න ලැබෙන දේවල් ගැන කල්පනා කර බලන විට විහිළුවක් බව අප කාහටත් වැට හෙනවා ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රජයට අයත් ඇමතිවරයකු වෙනත් රට කට ගිහින් අපේ රටට කීර්තියක් ගෙන දෙන ආකාරයෙන් කථා කර, ප්‍රශ්න විග්‍රහ කිරීම ගැන අප සතුටට පත් වෙනවා. නමුත් ඉන් එහාට සිද්ධ වන්නෙ කුමක්ද?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

බලමු.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

බලන්න දෙයක් නැහැ. මා ඒ පිළිබඳ අනාගත වාක්‍යයක් කීවා, වෙනත් අමුතු දෙයක් නැහැ. එය එතැනින් අවසානයි. බොහොම අගේට කථා කරනවා. විවාද කර අවසාන වුණාට පසුව අන්‍යෝන්‍ය වශයෙන් තම තමන්ගෙ රටවලට එන ලෙස අපේ රාජ්‍ය ඇමතිතුමාට ආරාධනා ලැබෙනවා. දැනටමත් රටවල් කීපයකට පැමිණෙන ලෙස ආරාධනා ලැබී ඇති. එසේම රාජ්‍ය ඇමතිතුමාත් ආරාධනා කරන්න ඇති, කීප දෙනකුටම ලංකාවට පැමිණෙන ලෙස.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

අන්‍යෝන්‍ය සම්බන්ධකම.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

අන්‍යෝන්‍ය සම්බන්ධකම බොහොම හොඳ දෙයක්. එසේ වුණත් එයින් අපේ තේ රාත්තලක මිල ශතයකින්වත් වැඩි කර ගන්න හැකි වුණාද? අපේ රබර් රාත්තලකට වැඩිපුර ශතයක්වත් ලබා ගන්න පුළුවන් වුණාද? නැහැ. නමුත් නාන්සේලා මෙම ගරු සභාවට නොයෙකුත් විධියෙ යෝජනා ගෙනැවිත් සම්මත කර ගත්තත්, ඉන්දියානු අගමැතිණිය ගේ අනුග්‍රහය ඇතිව සාකච්ඡා පැවැත්වූවාටත් පස්සෙ මොකක්ද ඇති වී තිබෙන තත්ත්වය? [බාධා කිරීමක්] දැනටමත් තේ පිළිබඳව ඉන්දියාව තරඟකාරී තත්ත්වයකින් ක්‍රියා කරගෙන යනවා පමණක් නොවෙයි, අපේ අන්තර් ජාතික වෙළඳ පොලේ අපේ තේ අලෙවිය පහත දැමීමට තවමත් ඉන්දියාව තරඟකාරී තත්ත්වයකින් කටයුතු කරගෙන යනවා. මොකද, ඇමතිතුමා එය නැතැයි කියනවාද? මම ඊට නිදර්ශනයක් වශයෙන් ඊයේ "ටයිම්ස්" පත්‍රයේ පළ වූ වාර්තාවක් ඉදිරිපත් කරන්නම්. මෙන්න ඒ වාර්තාව :

"Indian tea growers want duty cut"

අපේ මුදල් ඇමතිතුමා තීරු ගාස්තු ශත 5 කින් වැඩි කර තිබෙනවා.

"Indian tea growers are campaigning for a reduction of export duties to bring the price of tea back to its pre-sterling devaluation price."

ඉන්දියානු තේ නිෂ්පාදකයින් තීරු බද්ද අඩු කරන ලෙස ඉල්ලා සිටිනවා. මොනවාටද? එම වාර්තාව මම තව දුර වත් කියවන්නම් :

"The consultative committee of plantation associations issued a statement today calling for a 17 per cent reduction in export duties 'to ensure that Indian tea retains the competitive position held prior to the devaluation of sterling and the resultant action taken by Ceylon'."

රුපියලේ අගය අඩු කිරීමෙන් නමුන්නාන්සේ ලබා ගන්නට බලාපොරොත්තු වුණු වාසිය කපා දැමීමට ඉන්දියානු ආණ්ඩුව දැනටම කටයුතු කරගෙන යනවා. දැන් ඇති වී තිබෙන තත්ත්වය ඒකයි. මේ ගැන තිසි සැලකිල්ලක් දක්වා ඊට නියම විධියට මුහුණ දීමට නමුන්නාන්සේලා කටයුතු නොකරන්නේ ඇයි? ලංකාවත් සමග පවතින තරඟකාරී තත්ත්වයෙන් ජය ගැනීම සඳහා මෙවැනි පියවරක් ගැනීම ඉන්දියාණ්ඩුවට අවශ්‍ය වී තිබෙනවා. මෙයින් පහර වදින්නේ නමුන්නාන්සේගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බලාපොරොත්තුවලටයි. රුපියලේ අගය අඩු කිරීම නිසා ජාත්‍යන්තර වෙළඳ පොළෙහි ලංකාවට වාසි දායක තත්ත්වයක් ඇති වී ඒ මගින්, පෙර විකිණුනු ප්‍රමාණයට වඩා තේ ප්‍රමාණයක් අලෙවි කර ගන්නට පුළුවන් වී, රුපියලේ අගය අඩු කිරීමෙන් ඇති වුණු අවාසියත් මග හරවාගෙන අපේ විදේශ විනිමය පවා තර කර ගන්නට පුළුවන් වේයයි තමුන්නාන්සේ ඇති කරගෙන තිබුණු බලාපොරොත්තුව නැති භංග කර දැමීමේ වැඩ පිළිවෙළක් තමයි ඉන්දියානු ආණ්ඩුව දැන් ගෙන යන්නට බලාපොරොත්තු වන්නේ. මෙය ගරු මුදල් ඇමතිතුමාට මුහුණ පාන්නට සිදු වී තිබෙන උභතෝකෝටික ප්‍රශ්නයක්. අභ්‍යන්තර උද්ධමනය වැළැක්වීම සඳහා අවශ්‍ය මුදල් ලබා ගැනීමේ පියවරක් වශයෙන් තීරු ගාස්තු වැඩි කරන්නට ඕනෑයයි එතුමා කියනවා. අනෙක් අතින් එතුමා බලාපොරොත්තු වන්නේ, අපගේ අපනයන භාණ්ඩ වැඩිපුර විකුණා ගැනීම සඳහා අනෙක් රටවල් සමග තරඟකාරී තත්ත්වයක් ඇති කර ගැනීමයි. එහෙත් ඒ තරඟයෙන් ජය ගන්නට නම් නැවත වරක් මේ තීරු ගාස්තු අඩු කරන්න එතුමාට සිදු වෙනවා ඇති. මේ ප්‍රශ්නය විසඳන්නට අපගේ ගරු මුදල් ඇමතිතුමා අදහස් කරන්නේ මොන විධියටද ? දැන් එතුමා මේ ප්‍රශ්නය විසඳීමට උදව් ඉල්ලා දෙවියන් ඉදිරියේ ඇස් දෙකත් පියාගෙන යාඥාවක යෙදී සිටින බවයි මට පේන්නේ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

දැන් ඒගොල්ලන්ට දෙවියන්වත් උදව් කරන්නේ නැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

මේ තත්ත්වයට මුහුණ දීම සඳහා එතුමා කරන්නට බලාපොරොත්තු වන්නේ කුමක්දැයි මා අහනවා. එතුමා විසින් ඉදිරිපත් කර තිබෙන මේ තීරු ගාස්තු වැඩි කිරීම ගැන අප විරුද්ධ වන්නේ නැහැ. එහෙත්, එතුමා ගන්නට බලාපොරොත්තු වන මේ පියවරෙන් ලැබෙන වාසිය කුමක්ද යන වග අප එතුමාගෙන් දැනගන්නට ඕනෑ. කරුණා කර එය අපට කියන්න. මෙය සීමා වී තිබෙන්නේ එක කරුණකට පමණයි. එක් අතකින්, වැඩිපුර වෙළඳාමෙන් රුපියලේ කාසි වැඩිපුර ලංකාවෙහි හුවමාරු වන්නට පුළුවනි. එයින් ඇති වන උද්ධමනය වැළැක්වීම සඳහා ඒ මුදල් ආපසු ආණ්ඩුව අතට ගන්නට තීරු ගාස්තු වැඩි කරනවා. අනෙක් පැත්තෙන් රුපියලේ අගය අඩු කිරීමෙන් වැඩිපුර ආදායමක් ලබා ගන්නට ලබාපොරොත්තුවක් තිබුණා. දැන් මේ බලාපොරොත්තු දෙකම සුන් වී තිබෙනවා. එකක්වත් ඉෂ්ට වන්නේ නැහැ. අද පහළ වී තිබෙන උද්ධමනයට මෙය පිළියමක් නොවෙයි. කරන්නට තිබුණු පිළියම් නොකර තමුන්නාන්සේලා මග හැරියා. ආදායම් බදු සහන හා වෙනත් බදු සහනයන් දීමෙන් තමුන්නාන්සේලා තත්ත්වය තවත් නරක අතට හරවා ගත්තා. මේ ගන්නට යන පියවරෙන් එය වළක්වා ගන්නට බැහැ. ඊට නීසි තත්ත්වයක් රටේ පහළ වී නැහැ. අනෙක් අතට, තමුන්නාන්සේලා මේ මාර්ගයෙන් වැඩිපුර ආදායමක් ලබා ගන්නට බලාපොරොත්තු වෙනවා නම් එහි නියම වටිනාකම කොපමණද? රුපියලේ අගය අඩු කර තිබෙන නිසා, දැන් ඒ ආදායමේ නියම වටිනාකම මනින්නට පුළුවන්ද ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ බදු ගැන ටිකක් සොයා බලමු. ගරු මුදල් ඇමතිතුමා තේ රාත්තල් සියයකට රුපියල් 40ක බද්දක් පවරනවා. ඒ කියන්නේ රාත්තලකට ශත 40යි. අද අය කරන ශත 35 වෙනුවට ශත 40ක් අය කරනවා. එතකොට රාත්තලකට ශත 5ක් වැඩියි. මෙසේ කරන්නේ උස් බිම් වගාව, මැද බිම් වගාව සහ පහත් බිම් වගාව යනුවෙන් වෙනසක් කර නොවෙයි. ගරු මුදල් ඇමතිතුමා දන්නවා, අඩු වැඩි වන තීරුවක් අනුව වෙන්දේසි පොළේ අය කරන බද්දක් තිබෙන බව. දඹදෙණියේ ගරු මන්ත්‍රීතුමා (ආර්. ජී. සේනානායක මයා.) වෙළඳ ඇමති නිලය දරද්දී වෙනස් කළ පිළිවෙළ අනුව රේගුවේදී රත්තලකට ශත 35ක තීරු බද්දක් අය කරනවා. ඒ හැරෙන්න වෙන්දේසි පොළේ අය කර ගන්නා බද්දක් තිබෙනවා. ඒක අඩු වැඩි වීමේ තීරුවක් අනුව අය කරන විශෙෂ බද්දක්. දැන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

ගරු මුදල් ඇමතිතුමා තේවල මිල පිළිබඳ වෙනසක් නොමැතිව ශත 5 බැගින් කාගෙනුත් අය කර ගන්නටයි බලාපොරොත්තු වන්නේ. උස් බිම් වගාව කරන අයගෙනුත්, මැද බිම් වගාව කරන අයගෙනුත්, පහත් බිම් වගාව කරන අයගෙනුත් එකාකාරව රාත්තලකට ශත 5 බැගින් අය කරන්නටයි, බලාපොරොත්තුව.

ඇත්ත වශයෙන්ම මෙම තත්ත්වය අනුව අද සිදු වී තිබෙන්නේ කුමක්ද? රුපියලේ අගය අඩු කිරීම හේතුකොට ගෙන තේ මිල සුළු වශයෙන් වැඩි වී තිබෙන එක ඇත්තයි. උස් බිම් වගාව පිළිබඳව ශත 50ක් වැඩි වී තිබෙනවා. මැද බිම් වගාව පිළිබඳව ශත 40ක් වැඩි වී තිබෙනවා. පහත් බිම් වගාව පිළිබඳව ශත 20ක් වැඩි වී තිබෙනවා. නමුත් මේ යෝජනාව අනුව බලන විට පෙනෙන්නේ, මේ වැඩිපුර ශත 5 මුදල කාගෙනුත් එකාකාරව අය කරන්නට බලාපොරාත්තු වන බවයි. ශත 50ක් වැඩි වුණු අයගෙනුත් ශත 40ක් වැඩි වුණු අයගෙනුත් ශත 20 ක් වැඩි වුණු අයගෙනුත් කියන සියළුම කොටස්වලින් එකාකාරව ශත 5 බැගින් අය කරන්නටයි, බලාපොරොත්තු වන්නේ. මෙයින් පෙනී යන්නේ කුමක්ද? "කුමන පැත්තෙනුත් පහර වදින්නේ දුප්පතාටයි" යනුවෙන් අපේ ගැමියන් අතර පවතින කතාවට අනුව තමන්ගේ දළු ටික විකුණාගෙන ජීවත්වන දුප්පත් මිනිහාටයි, මේ ශත 5 බර උසුලන්න සිදු වන්නේ. ඒ අය වැඩිපුර සිටින්නේ දකුණු පළාත වැනි පළාත්වලයි. මේ පළාත්වල වාසය කරන උදවියට සිදු වන්නේ දළු රාත්තලකට මෙතෙක් ලැබුණු මිල ශත 5කින් අඩු වීමේ කරදර යට මුහුණ දෙන්නටයි. ඒ උදවියට ලැබෙන මුදලින් තවත් ශත 5ක් කැපී යනවා. මේ තත්ත්වය ගැන කල්පනා කරළාද, මෙම බදු පනවන්නට තීන්දු කළේ කියා මා අහනවා. ඇත්ත වශයෙන්ම ඇයි මේකේ වෙනසක් කරන්නට බලාපොරොත්තු නූනේ? එක පැත්තකින් අඩු වැඩි වීමේ තිරුවක් අනුව රබර්වලින් බදු අය කරනවා නම්, තේවලින් බද්දක් අය කරන්නේත් ඇත්ත වශයෙන්ම අඩු වැඩි වීමේ තිරුවක් අනුව නම්, ඇයි තමුන්නාන්සේ මේ වැඩි කරන්නට බලාපොරොත්තු වන ගාස්තු ඒ මිල අනුව වෙනස් කරන්නට බලාපොරොත්තු නොවන්නේ? එසේ කළා නම් එය තරමක් දුරටවත් සාධාරණ යයි කියන්නට පුළුවනි. ඇයි එසේ නො කරන්නේ?

මේ කිව්වේ තේ සම්බන්ධවයි. රබර් ගැනත් මා කිව්වා. අනිකුත් අපනයන භාණ්ඩ ගැන බැලුවත් තත්ත්වය එහෙමයි. කෝකෝවා, පැඟිරි තෙල් යනාදිය ගැන බලමු. මෙතන නම් පැඟිරි තෙල් ගැන මතක් කර නැහැ. එහෙත් ඇත්ත වශයෙන්ම අද තිබෙන තත්ත්වය කුමක්ද? රුපියලේ අගය අඩු කළායින් පසු බලාපොරොත්තු වුණු වාසිය නිසි විධියට ලැබී නැහැ. මුලින් බලාපොරොත්තු වුණු ආකාරයට එම වාසිය ලැබී නැහැ. ඇත්ත වශයෙන්ම මිළ පහළ බැස තිබෙනවා. පැඟිරි තෙල් යනාදි ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් නම් තිබුණාටත් වඩා භයානක විධියේ වෙනසකුයි, දැන් ඇති වී තිබෙන්නේ. මෙයයි, ඇත්ත.

අළුතින් පත් වී සිටින වාණිජ හා වෙළඳ ඇමතිතුමා දැනට මේ ගරු සභාවේ නැහැ. එතුමාගේ පාලනය යටතේ අපේ අපනයන ද්‍රව්‍ය වෙළඳාම වැඩි වන්නට පුළුවනි. එතුමා වාණිජ කටයුතු සම්බන්ධයෙන් ඉතා දක්ෂයෙක්. එහෙත් මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් පිළිතුරක් දෙන්නට එතුමා අද මෙහි නැහැ. අපට නිසි විධියට පිළිතුරු දෙනවා නම් ඇත්ත කියන්නට මුදල් ඇමතිතුමාටත්, කෘෂිකර්ම ඇමතිතුමාටත් සිදු වෙයි.

අපේ ප්‍රධාන අපනයන ද්‍රව්‍යයන් වන තේ, පොල්, රබර් හැර—කොකෝ, කුරුඳු, පැඟිරි තෙල් යනාදි—අනෙකුත් සියලුම වර්ගවලට අයත් අපනයන ද්‍රව්‍යවල මිළ, රුපියලේ අගය පහත හෙළන්නට කලින් තිබුණාට වඩා පහළ බැස තිබෙනවා; ඉහළ නැග නැහැ. අන්තර් ජාතික මිළ පමණක් නොවෙයි, ලැබෙන රුපියල් ගණනත් අඩුයි. ඒ කියන්නේ, රුපියල් අනුව තක්සේරු කළ මිළත් අඩු වී තිබෙනවා.

රුපියලේ අගය අඩු කිරීම සම්බන්ධ විවාදයේදී යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය එන්. එම්. පෙරේරා), විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් කථා කළ අනෙකුත් ගරු මන්ත්‍රීතුමන්ලාත් මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටියා, "තමුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නාන්සේ මේ පියවර ගන්නට මත්තෙන්, මේ පියවරම ගැනීම නිසා ඉන්දියාවට සිදු වූ දේ බලන්න" කියා. "මුදලේ අගය අඩු කිරීම නිසා ඉන්දියාවට අත් වූ ප්‍රතිඵල දිහා බලා, ගන්නට යන මේ පියවර ගැන නැවත වරක් සලකා බලන්නැයි" විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටියා. එහෙත් මුදල් ඇමතිතුමා ඒ ඉල්ලීම ඉෂ්ට කරන්නට ලැහැස්ති වුණේ නැහැ. වෙන රටවලින්, අන්තර් ජාතික වශයෙන් ඇති වුණු බලපෑම් නිසා ගන්නට අදහස් කළ පියවරක් ආපසු වෙනස් කරන්නට ආණ්ඩුව ලැහැස්ති වුණේ නැහැ. එම නිසා අප දුන් අවවාද එකක්වත් පිළිගත්තේ නැහැ. තීන්දු කර ගත් වැඩ පිළිවෙළ ඒ අනුවම ඉදිරියට ගෙන යන්නටයි, ආණ්ඩුව බලාපොරොත්තු වුණේ. එසේ කටයුතු කිරීම නිසා, ඉන්දියාවට සිදු වුණු හානියම මේ රටේත් දැන් සිදු වේගෙන යන බව පෙනෙන්නට ඇති බැවි කණගාටු වෙන් නමුත් මතක් කළ යුතුයි.

වැඩිපුර ලාභ ලැබීම, අපනයන භාණ්ඩ වැඩිපුර අලෙවි කිරීම ආදි මුදල් ඇමතිතුමාගේ බලාපොරොත්තු සියල්ලම සුන් වී තිබෙනවා. ඒ බලාපොරොත්තු සුන් වීම නිසා අපේ ජනතාවට මුහුණ පාන්නට සිදු වී ඇති තත්ත්වයට පිළියමක් කර ඒ තත්ත්වයෙන් අපේ ජනතාව බේරා ගැනීමේ වැඩ පිළිවෙළක් මුදල් ඇමතිතුමා වෙත නැති බවයි, අපට පෙනී යන්නේ. ඒ වෙනුවට, මුදල් ඇමතිතුමා කලින් ගත් පියවරක් නිසා ගතයුතු වූ තවත් පියවරක් වන තීරු බදු වැඩි කිරීමේ යෝජනාවක්, එය ක්‍රියාත්මක කිරීමෙන් පසු මේ ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා.

මේ බද්ද ප්‍රධාන නැත්නම් ලොකු නිෂ්පාදකයන්ගෙන් අය කර ගන්නවාට අපේ අකමැත්තක් නැහැ. අද බඩු මිළ ඉහළ ගොස් තිබෙන ප්‍රමාණය අනුව තමුන්නාන්සේලා යම් පියවරක් ගන්නවා නම්, එයින් කුඩා නිෂ්පාදකයන්ට ඇති වන හානිය ගැන කල්පනා කර ඔවුන්ට යම් සහනයක් දෙන්නට දැන්වත් අදහස් කළ යුතුයි කියන ඉල්ලීමයි, අප ඉදිරිපත් කරන්නේ.

රුපියලේ අගය අඩු කිරීමෙන් පහළ වූ ප්‍රතිඵල, දැනටමත් ඇති වී තිබෙන ප්‍රතිඵල ගැන අපට විස්තරයක් කිරීමට ගරු මුදල් ඇමතිතුමාට යුතුකමක් තිබෙන බව මා මුලින්ම මතක් කළා. ඒ යුතුකම ඔහු මඟ හැරියා. ඒක කෙළේ නැහැ. එහෙත් දැන්මම අපේ ජනතාව දන්නවා එහි ප්‍රතිඵලය කුමක්ද කියා. අද බඩු මිල ඉහළ ගොස් තිබෙන ප්‍රමාණයේ හැටියට ජීවත් වීම ඉතාමත් දුෂ්කර දෙයක් වී තිබෙනවා. එදිනෙදා වියදම් පිරිමසා ගැනීමට බැරිව ණය ගැති වන කම්කරු ජනතාවගේ සහ ගැමි ජනතාවගේ සංඛ්‍යාව දිනෙන් දිනම වැඩි වෙනවා.

**ගරු සුගතදාස**
*(கௌரவ சுகததாச)*
(The Hon. Sugathadasa)
අමු මිරිස් ගණන් බැහැලා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
තමුන්නාන්සේට අමු මිරිස් පමණක්කා ජීවත් වීමට පුළුවන් නම් එය ඉතාමත් හොඳයි. අමු මිරිස් ටිකක් යොදා හොඳ ලුණුමිරිසක් අඹරා තමුන්නාන්සේලාට දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ජනසතු සේවා ඇමතිතුමා බඩු ගන්නට ගිය විට නම් වෙළෙන්දන් ඒ මිල දර්ශනය අනුව බඩු විකුණනවා වෙන්න ඇති. එසේ නැතිව මේ කියන ගණන්වලට අපට නම් ලැබෙන්නෙ නැහැ. මා ජනසතු සේවා ඇමතිතුමාගෙනුත්, මුදල් ඇමතිතුමාගෙනුත් අසන්න කැමතියි. පසු ගිය දිනවල කොළඹ නගරයේ හාල් සේරුවක මිල කීය ද කියා. රුපියලකුත් ශත හතළිහටත් ගන්න බැරි වුණ දවස් තිබෙනවා. අපේ ප්‍රදේශයේ වාසය කරන උදවියට පසු ගිය සුමානයේ රු. 1.40 ට වත් හාල් සේරුවක් ගන්න බැරුව ආවා.

අපි තමුන්නාන්සේලාට පෙන්වා දෙන්නේ මේකයි. උද්ධමනයක් අද තිබෙනවා. එය වැළැක්වීමට මෙය පිළියමක් නොවෙයි. තීරු ගාස්තු වැඩි කිරීම ඒ සඳහා පිළියමක් නොවෙයි. එයට වෙනත් හේතු තිබෙනවා. ඒ හේතු ඉවත් නොකර මේ ප්‍රශ්නය විසඳීමට හැකියාවක් නැහැ. අද තමුන්නාන්සේලා මඩේ එරී සිටිනවා. ඒ එරී සිටින ප්‍රමාණයේ හැටියට ගොඩ එන්න බැහැ. ගොඩ එන්න බැරි විධියටයි එරී තිබෙන්නේ. නියෝජ්‍ය කථානායකතුමනි, රුපියලේ අගය අඩු කළ අවස්ථාවේදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

විරුද්ධ පාර්ශ්වයෙන් කී සෑම දෙයක්ම දැනටම ඔප්පු වී තිබෙනවා. එය අපේ සතුටට කාරණයක් නොවෙයි. ඒවායින් අපේ ජනතාවට ලැබෙන පීඩාවන් ගැනයි අප පෙන්වා දුන්නේ. ඒ පීඩාවන් ගැන අප පළ කළ අනාවැකි සියල්ලම අද සපිර ලෙස ඔප්පු වී තිබෙනවා. දැන්වත් මේ තත්ත්වය ගැන කල්පනා කර ඊළඟට ගත යුතු පියවර මොන පිළිවෙළකින් ගැනීමට හැකියාවක් තිබේද කියා අපට සැකයක් තිබෙනවා.

මගේම ඡන්ද කොට්ඨාශයේ, නියෝජ්‍ය කථානායකතුමනි, තිඹිරිගස්යාය ගමේ නොබෝදා අමුතු විධියේ සිද්ධියක් දකින්න ලැබුණා. පෙරහැරකට ගෙන ගිය අලියෙක් වෙල හරහා යන අවස්ථාවෙදි මඩේ එරුණා. මඩේ එරී එයින් ගොඩ ඒම සඳහා කොපමණ දැඟලුවත් ඉන් ගොඩ වී එන්න ට අලියාට බැරි වුණා. අලියා ගොඩගැනීම සඳහා ආධාරයට ගිය පළාත්වාසීන්ටත් අලියාව ගොඩගන්නට බැරි වුණා. පස්සේ වාරි මාර්ග දෙපාර්තමේන්තුවට හෝ කොළඹ නගර සභාවට අයිති දොඹකරයක් ගෙනැවිත් අලියා ගොඩගන්නට උත්සාහ කළ විට අලියත් සමගම දොඹකරයත් මඩේ එරුණා. අද මුදල් ඇමතිතුමාට සිදු වී තිබෙන්නෙත් ඒකයි.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
කොහොමද දොඹකරය ගත්තේ ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
දොඹකරය පස්සෙ බොහෝම අමාරුවෙන් ගොඩට ගත්තා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
අලියත් ගොඩට ගත්තාද ?

**ආචාර්ය එන්. එම්. පෙරේරා.**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
පස්සේ අලියත් බේරුවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
එහෙනම් දෙදෙනාම බේරී තිබෙනවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවටත් සිදු වී තිබෙන්නේ එයයි. අර අලියාගේ දඟලිල්ල වගේ මේ ආණ්ඩුව කරන සෑම දෙයකින්ම තවත් එරෙනවා. හාල් සලාකය කැපුවා. ඒ අනුව වැඩි මිල ගෙවා තවත් හාල් සේරුවක් ගන්නට සිදු වුණා. ඊළඟට සමාජ සේවා කටයුතු කපන්නට පටන් ගත්තා. එක ඇමතිවරයෙකුගේ යෝජනා තවමත් ආණ්ඩු පක්ෂය සාකච්ඡා කරනවා. ඒ අධ්‍යාපන යෝජනා. තවත් කපන්නට ලැහැස්ති වූ ඇමතිවරයෙක් නිලයෙන් අස් වී ගොස් නැති විද්‍යාත්මක පර්යේෂණ ඇමති නිලයක් දැන් බාරගෙන තිබෙනවා. මේවා දකින්න දකින්න අපට පෙනී යන්නෙ මේ දැඟලිල්ලෙන් තවත් මඩේ එරෙන බවයි. ගරු මුදල් ඇමතිතුමා අවසාන පියවර වශයෙන් ගත්තේ රුපියලේ අගය අඩු කිරීමයි. එහි ප්‍රතිඵල අප මෙහි දී නොකීවත් මහජනයා දන්නවා. මහජනයාගේ දුක ගැන අප මෙහි දී විස්තර කර කියන්නට වුවමනාවක් නැහැ. කවුරුත් දන්නවා. මේ තත්ත්වය අනුව ඇත්තටම බංකොලොත් භාවයකට පත් වී සිටින බවයි ගරු මුදල් ඇමතිතුමාගේ මේ යෝජනාවෙන් පෙනෙන්නේ. මා මුලින් කී පරිදි මේ තීරු ගාස්තු වැඩිකිරීම පිළිබඳ ව ප්‍රතිපත්තියක් වශයෙන් නම් විරුද්ධ වන්නට අපට වුවමනාවක් නැහැ. එහෙත් සමහර අංශ පිළිබඳව නම් මෙයින් ඇති විය හැකි ප්‍රතිඵල කණගාටුදායකයි කියා පෙන්වා දෙන්නට පුළුවන්.

පොල් පිළිබඳව, මේ දෙවැනි යෝජනාවෙන් දක්වෙන පරිදි, පිලිප්පයින් දූපත්වලින් පිට යවන පොල්වල නැත්නම් ඒ භාණ්ඩවල මිල අනුව මෙහි වෙනසක් ඇති කිරීමට බලාපොරොත්තු වන තීරුව පවුමේ අගය අඩු කිරීම හා රුපියලේ අගය අඩු කිරීම යන කරුණු දෙක නිසි විධියට සලකා සකස් කළ ලේඛනයක් නොවෙයි. මෙය ඒ ඒ රටවල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙන තත්ත්වය අනුව සකස් කළ ලේඛනයක් නොවන බව දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂමන් ජයකොඩි මයා.) හොඳාකාර පෙන්වා දුන්නා. එමෙන්ම රබර් පිළිබඳවත් අද නිෂ්පාදනය කරන්නට යන ගාස්තුව අනුව බලන විට තවදුරටත් මිල පහළ බසින්නට ඉඩ තිබෙන බව සලකා බැලීමේදී මේ රාත්තලකින් වැඩිපුර අය කරන්නට බලාපොරොත්තු වන සත 3 ගෙවන්නට සමහර අයට ශක්තියක් ඇති නමුත් කුඩා නිෂ්පාදකයින්ට එය ගෙවන්නට ශක්තියක් නැති බව පෙනී යනවා. ඒ අන්දමටම තේ රාත්තලකින් වැඩිපුර ගන්නට බලාපොරොත්තු වන සත 5 දළු ටික විකුණා ගන්නා දුප්පත් ගැමියාගේ තත්ත්වයට හුරු වන ආකාරයට සකස් කර නැති නිසා ඒ අයටත් මෙයින් විඳින්නට වන්නේ අමාරුවක්. එහෙත් ගරු මුදල් ඇමතිතුමාට ඊට වඩා විශාල වගකිව යුතු ප්‍රශ්නයක් තිබෙනවා. රුපියලේ අගය අඩු කිරීමෙන් බලාපොරොත්තු වූ එකම සතුටුදායක දෙයක්වත් තවම පහළ වී නැහැ. පහළ වන බවටත් කිසිම සාක්ෂියක් නැහැ. අනික් පැත්තෙන් පෙනී යන්නේ එයින් ඇති වූ අවාසි අපේ ජනතාවට විඳින්නට සිදු වී තිබෙන බවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන්වත් මේ ගත් පියවර ආපසු තබා යථා තත්ත්වය නැවත වරක් ඇති කර ගන්නට හැකියාවක් තිබෙනවාද කියා කල්පනා කර බැලිය යුතුයි. එසේ කරන්නට පුළුවන් වුණොත් වෙනත් මාවතක් ඔස්සේ ගමන් කරන්නය කියා මේ ආණ්ඩුවට කියන්න අපට පුළුවන්. එහෙත් දැන් ගොස් තිබෙන පිළිවෙළ අනුව, ගොස් තිබෙන දුර ප්‍රමාණය අනුව බලන විට, ආපසු යැමට තත්ත්වයක් මේ ආණ්ඩුවට නැහැ. යන්නේ විනාශය දක්වා පමණයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ විනාශය ඇති කරන්නට මත්තෙන්, ඉක්මණින්ම මේ කටයුතු හරියාකාර කරන්නට බැරි නම්, තමන් වරම් ලබා ගෙන පැමිණි පිළිවෙළට මේ රටේ ප්‍රශ්න විසඳන්නට ශක්තියක් නැත්නම්, ඒ සඳහා කරන කිසිවකින් නියම ප්‍රතිඵල ලබා දෙන්නේ නැත්නම්, කල් වේලා ඇතිව මේ රටේ ජනතාව විනාශය කරා යන්නට මත්තෙන් ඉල්ලා අස් වී මෙතැනින් ඉවත්ව ගොස් කරන්නට පුළුවන් අයට මේ වැඩේ බාර දෙන ලෙස ඉතා කරුණාවෙන් මේ ආණ්ඩුවේ ඇමතිවරුන්ගෙන් ඉල්ලමින් මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 3.45

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

I was hoping that the Hon. Minister in introducing this Motion would say how much the Government have earned as a result of devaluation because this is really a motion which they contemplated when they introduced the devaluation proposal. You will remember that during the devaluation debate the Hon. Prime Minister made much of the fact that he anticipated substantial increases in the prices of all our major exports—tea, rubber and coconut. Therefore he gave an undertaking to this House that he would not permit the increased profits accruing to the big businessmen to be left untapped, but that the Government would see to it that they took at first a portion of such profit. In point of fact, I think, the Hon. Prime Minister said that he would take a substantial portion of those profits and use them for the benefit of the people of this country. That was the position taken up by the Hon. Prime Minister.

The Hon. Prime Minister, of course, painted a glorious picture of the tremendous improvement in prices that the Government expected on these three commodities as a result of devaluation. He is a most optimistic Prime Minister with regard to the results of devaluation. He is buoyancy itself. The Prime Minister of Ceylon today is a person who is floating in the air. He says that self-sufficiency is round the corner and there will be prosperity by 1970. He has all sorts of visions. I do not know whether he is suffering from hallucinations because he has got the most sanguine and optimistic concept of what is going to happen in Ceylon. He is thoroughly unconcerned with what is actually happening today. Anyhow, my complaint

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

about the Hon. Prime Minister is this. Unfortunately he is not here at the moment. We had a long debate on this whole question. I am just trying to go through some of the most interesting statements that he made on that occasion on the devaluation debate.

The least we can expect of the Hon. Minister of Finance is to tell us what has happened. By the way, we are discussing both Resolutions (2) and (3). The least that he should have done—when he wakes up anyhow ; I do not blame him because the position is so bad for the Government that he should be nodding ; I am not surprised.—[*Interruption*]. I do not want to wake him from his slumber. This Government is slumbering. After all is said and done, the Government is slumbering and everybody is slumbering. Only the poor people are suffering. That is all right.

These resolutions are a consequence of the action taken by the Government with regard to the currency of this country.

On previous occasions the Government said that these duties were being introduced because of the high prices some of our commodities are fetching. These duties are now in operation.

There are two things that the Hon. Minister of Finance should have done. Firstly, he should have told the House how much money the Government has earned during the last two or three months as a result of the new duties. Then we would have known what has actually happened in the new situation. Secondly, the Hon. Minister should have told us whether the expectations of the Government have been fulfilled or whether they have been belied with regard to the prices of these commodities.

The Minister of Finance has not told us anything about these two matters. He introduced the motion and after a laconic speech of two or three minutes he sat down quite happily.

Now, Sir, I have noticed that the Hon. Minister has a knack of not answering any of the questions that are raised during the course of a debate. I was reading his speech in reply in the Debate we had a couple of weeks back in regard to Treasury Bills. On that occasion I tried to analyse the situation arising from the devaluation, and I asked the Hon. Minister a few pointed questions as to the expectations of the Government. There is nothing in the speech of the Hon. Minister made by way of reply in which he gave any answer to the questions we asked—nothing at all.

The major thing he said was about the credit squeeze. He said that the peculiar position in Ceylon is that the more we squeeze the more we expand. I do not know which way the expansion takes place, but that is the position the Hon. Minister took up.

The other intriguing position he took up was that everything was due to the strikes. Even the delay in the publication of the Central Bank Bulletin was due to strikes ! How could any strike have affected the publication of the Central Bank Bulletin ?

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

The former governor going on strike.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

The former governor fell ill, poor man, and went off. Unless the people who draw up the charts and so on went on strike, how could a strike cause a delay in the publication of the Central Bank Bulletin?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

Printing.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

The Government Press was never on strike. Obviously the Hon. Minister of Finance is drawing on his

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

imagination for facts. The Hon. Prime Minister is living in a world of hallucinations and the Hon. Minister of Finance is living in dreamland.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

There were various strikes in various departments.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

The Central Bank was never on strike. As I said, the Minister of Finance is drawing on his imagination for his facts.

What has happened to the Government? The Benches are empty. Nobody in the Front Bench bothers even to be present.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

Why? I am here.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Look behind you.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

Look behind there.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

The Government must maintain a quorum. If I sit down now and ask for a quorum the House will have to be adjourned. The Government has lost interest in governing this country. The Government has lost interest in themselves.

**සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය.**
(අත්තනගල්ල)
*(திருமதி சிறிமாவோ ஆர். டீ. பண்டாரநாயக்க—அத்தனகல்ல)*
(Mrs. Sirimavo R. D. Bandaranaike—Attanagalla)

What nonsense! They have not lost interest in themselves.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

There is disagreement in your own ranks about these things. The hon. Leader of the Opposition disagrees with what the hon. Member says.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

There is no faith and hope. They cannot even get charity.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

The hon. Leader of the Opposition says they have not lost interest in themselves. I am a little charitable. She is not. She says they are all interested in themselves. That is all they are interested in.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

That is a disagreement.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Not a material disagreement.—[*Interruption*]. If that is a point of disagreement which is giving the Hon. Minister some pleasure, he is quite welcome to have that pleasure, because we are in agreement on all other and major issues. There is disagreement only on this minor issue whether you are interested in yourselves or not.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

I got down HANSARD because I want to read the Hon. Prime Minister's speech on devaluation. It is most interesting to read back his speech—although I do not intend to do so—to show how everything he said has been disproved. Everything has gone wrong. His fanciful, imaginative talk about the consequences of devaluation have all been belied. I wanted to bring a copy of the "Economist" of November 1967 wherein the reasons why Britain devalued the pound sterling are analysed. The "Economist" says that devaluation took place partly for panic reasons. The Government was in a panic and that is why it devalued. The Hon. Minister got up in the House and said, "We had no alternative but to devalue." In other words, this Government also went into a panic like the British Government and therefore devalued.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

They even devalued the Hon. M. D. H. Jayawardena.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Yes, the poor man. I used to have a lot of regard and respect for the Minister of Scientific Research and Housing.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

Scientific housing without financial priority !

ගරු වන්නිනායක
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

It is important.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Of course, it is important.

That is all by the way.

Now I want to deal with what the Hon. Minister said on the last occasion. I do not want the Hon. Minister on this occasion too to get up and crack a few jokes about squeezing people and so on and forget the main issue. That is what I am objecting to. He is very clever at that. We all enjoy it. It is an after dinner speech that he makes. On an important issue he makes an after dinner speech.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

He is old enough to get away with it.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

I am very strongly opposed to it.

Look at what he said. To justify his demand for the Rs. 250 million in Treasury Bills, this was what he said :

"And for what reason do we want this money ? The prices of tea, rubber and coconut have slumped in a way that they have not slumped before. Also, as a result of devaluation we have to meet a certain amount of extra expenditure."—[OFFICIAL REPORT, 27th January 1968 ; Vol. 76, c. 1116.]

I am coming to the question of falling prices. I understood when they introduced this devaluation that one of the things they had in mind was the imposition of export duties to obtain money for the purpose of meeting the extra expenditure involved. But, according to him, the extra money is to be found through Treasury Bills and is not money which they are getting on these duties. That is what I want to know. The Hon. Finance Minister should have told us when he introduced this motion how much money he got from the duties that have been levied since 22nd November 1967. These duties are in operation since then.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

Hardly any time.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

December, January and February? It is now practically three months since you introduced this and we must know what your experience has been. That is the material point.

Now I come to the most important point. It is rather a depressing thing for us to get up in this House and tell the Ministers, "We told you so". Within a matter of months the Opposition is in a position to tell the Government, "Everything we said has come true." Quite categorically I made the statement that you would never get any appreciable increase in the foreign exchange earnings as a result of devaluation. That is the categorical statement I made here. Is that not true?—

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

You did not say—

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

"You did not say ..." Is that all you can say? I shall read out to you what your Prime Minister said on that question. The Prime Minister was most buoyant about what was going to happen. He was expecting a big increase in the tea prices. I challenged him to prove that as a result of devalutation you were going to get even an increase of £100 sterling in foreign exchange. That was my challenge, and he gaily took up the challenge and said, "On the contrary, we are going to get a substantial increase in foreign exchange." That was the position he took up. I am now trying to prove, not through my statement but through that of a third party, how much they have appreciated the point of view that I placed before you.

What did I say on that occasion? I said that devaluation was not going to touch the prices of tea. I am dealing with tea at the moment. I said that in point of fact there would be no change in the prices of tea as a result of devaluation because you were not touching the basic problem connected with the sale of tea, namely, the stranglehold of the agency houses and the brokering firms in this country. Those are the specific statements that I made here in this House. Did you try to answer them? I ask this Government: You have been in office for the last three years. What have you done to break that ring?

Way back in 1964, in introducing the Budget, I said: "This is the major question that we have to face". Since 1956, ever since the U. N. P. Government went out of office, the price of tea has continued to fall and has come down by more than 50 cents over that period of time. On that occasion I drew the attention of the House to it and said that I intended to break that ring. Unfortunately, we were not allowed to continue in office. They broke us! They joined hands with all those big firms and broke us.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

I thought the people broke you.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

All the big firms combined to break us.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

How can the firms break a Government? The people can.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

There are plenty of ways in which the people can be got round. Do you remember the Shell Company's big photograph of Mr. Dudley Senanayake in 1960? That photograph was one of the means by which you broke us.

සිරිමාවෝ බණ්ඩාරනායක මිය.
(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)
(Mrs. Sirimavo Bandaranaike)

That is why you were in such a hurry to pay them compensation.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

On that occasion in 1964 I pointed out that that was the major task you had to undertake. Here is testimony from a private individual. I am going to read to you from a document which I am quite prepared to table. This has been issued by a private firm, Messrs. Henderson and Company. The Managing Director of Messrs. Henderson and Company has issued this document.

It is so important that I would like to have it on record in the House for the permanent edification of this Government and its supporters. Its heading is:

"SCHEME FOR REORGANIZATION OF THE TEA TRADE"

Colombo,
4th February, 1968.

The benefits of devaluation which the Government expected have been nullified in respect of tea exports."——

Now, here is an independent firm saying precisely what I stated with regard to devaluation. It says:

"The benefits of devaluation which the Government expected have been nullified in respect of tea exports.

The prices have not improved in spite of the devaluation of 20 per cent which is seven per cent in excess of the U.K. devaluation. This failure to achieve our due earnings from tea is due to one fact and that is the monopolistic position of the few big buyers in the local market and connections to the very few larger buyers abroad and their monopolistic practices."——

